Enid Blyton ගේ St. Clare's කතා මාලාවේ හතර වැන්න

# අපූරු සොයුරීයන්ගේ අපූරු රහස්

සුදත් රොහාන්



Scanned with CamScanner

# නිවුන් සොයුරියන් ඇසූ අපූරු රහස

ඒ සතිය අවසානයේදී වාරය මැද ලැබෙන විශේෂ නිවාඩුව ශාන්ත ක්ලෙයාර් පාසලේ ළමයින්ට ලැබිණි. තම දරුවන් දැක බලා ගැනීම සඳහා බොහෝ දෙමාපියෝ දුම්රියෙන් පාසල කරා පැමිණියහ. තවත් දෙමාපියෝ මෝටර් රථවලින් පැමිණියහ. මේ විශේෂ නිවාඩු දිනය දෙමාපියන් සමඟ ගත කිරීමට ලැබෙන නිසා පාසලේ ගැහැණු ළමයින්ගේ හිත්වල තිබුණේ ද අසීමිත ප්‍රීතියකි. ඒත් සමහර ගැහැණු ළමුන්ගේ දෙමාපියන් පැමිණෙන්නේ නැත. එවැනි ළමයි තම තමන්ගේ යෙහෙළියන් සමඟ ඈත නගරයක ඇති චිත්‍රපටියක් නැතිනම් නාට්‍යයක් නැරඹීම සඳහා ගියහ.

පැට් සහ ඉසබෙල්ගේ මව වූ ඕ'සුලිවාන් මහත්මිය පැමිණ සිටියේ කාරයෙනි. ඇය පැට් සහ ඉසබෙල් ද, ඇලිසන් ද රැගෙන ඈත නගරයක් බලා පිටත් ව යාමට තීරණය කොට තිබිණි. ඇලිසන්ගේ මව නොපැමිණි නිසා ඇයට ද ඒ ගමනට එකතු වන්නට සිදු විය. ජැනට් ඇගේ දෙමාපියන් සමඟ විනෝද සවාරියක් සඳහා නික්ම ගියේ ප්‍රීතියෙනි. හිලරිත් ඔවුන්ගේ විනෝද ගමන සඳහා එක්කර ගැනීමට ජැනට් අමතක

නොකළා ය. මාර්ගරිගේ අම්මා හෝ තාත්තා පාසලට පැමිණියේ නැත. එහෙත් ඇය තමන් සමඟ කැඳවාගෙන යාමට වෙන කිසි ම ළමයෙකු හෝ ඉදිරිපත් වූයේ ද නැත. ඒ නිසා මාර්ගරි සහ ගැහැණු ළමුන් සිව් දෙනෙක්ද, මිස් රොබට් ද අල්ලපු නගරයේ ඇති චිත්‍රපටයක් නැරඹීම සඳහා පිටත් ව ගියහ.

අම්මාට කියන්නට බොහෝ දේ ඉසබෙල් ළඟ ඉතිරි ව තිබිණි. ඒ දේවල් අතර පැට් ගෙතූ ඇඳුම කවුදෝ කෙනෙකු විසින් ඉරා දැමූ කථාව ද තිබිණි. ඉසබෙල් මේ දේවල් අම්මාට කියද්දී ඇලිසන් ද තොරතෝංචියක් නොමැති ව කථා කළා ය. එහෙත් පැට් කථා කළේ වචන කිහිපයක් පමණකි. ඒ සිදුවීම නැවත නැවත මතක් කිරීමට ඇය සතුටු නැත. ඉතා ප්‍රිය මනාප ළමයකු වූ තමාට සතුරන් කිහිප දෙනෙකු හෝ ඇති වී තිබෙන බව මතක් වන විට පැට්ගේ හිතට ඇති වෙන්නේ වේදනාවකි.

ඉසබෙල්ගේ හා ඇලිසන්ගේ කථාව නිහඬව අසා සිටි ඕ'සුලිවාන් මහත්මිය කථා කරන්නට වූයේ සෑහෙන වෙලාවකට පසුවයි.

"ඒ වැඩේ ඇත්තට ම කෙරුවේ මාර්ගරිමයි කියලා ඔයාලට විශ්වාස ද? හැබැයි ඔයාලගේ සැකය හරියට ම තහවුරු වෙනකම් ඒ වගේ දෙයක් එක පාරට ම නිගමනය කරන එක හොඳද? සමහර අය ඔයාලා හිතන තරම් නරක නෑ. තේරුණාද ළමයි? හැබැයි ඔයාලා කියන දේවල් ගැන හිතුව ම මාර්ගරිගේ හිතේ මොකක් හරි ලොකු දුකක්, කැළඹිල්ලක් තියෙනවා කියලා මට හිතෙනවා."

ඕ'සුලිවාන් මහත්මිය කියූ දෙයින් පසු ව පැට්, ඉසබෙල්



සහ ඇලිසන්ගේ සිත්වල කිසියම් නොසන්සුන්කමක් මෝරා වැඩෙන්නට විය. පැට්ගේ වූල් ඇඳුම ඉරා දැම්මේ මාර්ගරි යැයි ඔවුහු එක හෙලා ම විශ්වාස කළහ. එහෙත් ඒ සැකය සනාථ කිරීම සඳහා ඔවුන් සතු ව සාක්ෂියක් තිබේද? ඒ පැනයට කිව හැක්කේ 'නැත' යන පිළිතුර පමණි.

ඉන් පසු ව කිසි ම කෙනෙක් වැඩිපුර කථා කළේ නැත. ඒ වුණත් පැට් සහ ඉසබෙල් තම මව කියූ ආකාරයට සිතන්නට තීරණය කළහ. සැකය සනාථ කළ හැකි මාවත් නොමැති ව මාර්ගරිගේ හිස මත වරද පැටවීම එතරම් සාධාරණ ක්‍රියාවක් නොවේ. මාර්ගරි ඉක්මනින් කේන්ති යන, එමෙන් ම කිසි ම හැදියාවක් නැති ගැහැණු ළමයෙකි. ඒ නිසා ම ඇය සැක කිරීම සාධාරන නැත. තම ඥාති සොයුරියන් සිතන්නේ කුමක්ද යි දැන ගැනීම සඳහා දෝ ඇලිසන්, පැට් සහ ඉසබෙල් දෙස විපරමින් බැලුවා ය. ඇලිසන් දැන් ටිකක් විතර යහපත් චර්යාවන් ඇති ගැහැණු ළමයකු බවට පත් ව හිඳින්නී ය. නිවුන් සොයුරියන් දෙදෙනා නිරතුරු ව ම ඇයට දෙන උපදෙස් නිසා ඇලිසන්ගේ මේ පරිවර්තනය සිදු ව තිබේ.

එසේ වුව ද මාර්ගරි පිළිබඳ ව ඔවුන්ගේ සිතේ ඇති වෙමින් තිබූ සුබදායක සිතිවිල්ල එදින හවස සිදු වූ අහඹු හමුවීමක් නිසා සුණු විසුණු වී යනු ඇතැයි ඔවුහු සිතාමටවත් නොසිතූහ.

පාසලේ සිට සැතැපුම් විස්සක් පමණ ඈතට වෙන්නට පිහිටා තිබූ විශාල නගරයකදී ඔවුහු දිවා ආහාරය ගත්හ. ඉන් පසු ව නාට්‍යයක් නැරඹීමට යාමටත් ඔවුන් කතිකා කොට ගෙන තිබිණි. ඉසබෙල්, පැට් සහ ඇලිසන් දිවා ආහාරය ගන්නා අතරතුරදී අහඹු සිදුවීමක් සිදු විය. ඔවුන් සිටි මේසය

අසල ම වූ අනිත් මේසයේ පැමලා හොල්මින්ග් වාඩි වී සිටියා ය. පැමලා, වසර දෙකකට පෙර නිවුන් සොයුරියන් ඉගෙන ගත් රෙඩ් රූෆ් පාසලේ සිටි ඔවුන්ගේ මිතුරියකි.

"හලෝ පැම්."

පැමලා මුළින් ම දුටු ඉසබෙල් ප්‍රීතියෙන් බෙරිහන් දුන්නා ය.

"ඔයාටත් වාරේ මැද නිවාඩුව ලැබිලා වගෙයි.?"

"හලෝ පැම්, හලෝ ඉසබෙල්, හලෝ ඇලිසන්. ඔව් මටත් වාරේ මැද නිවාඩුව ලැබුණා. මම දැන් ඉගෙන ගන්නේ ශාන්ත හිල්මා ඉස්කෝලේ. ඉතින් අම්මා මාව මෙහාට එක්ක ආවා. අපි හවසට නාට්‍යයක් බලන්නත් යන්න හිතාගෙන ඉන්නවා. හැබැයි ඔයාලත් ඒ නාට්‍යය බලන්න යනවා කියලා නම් කියන්න එපා හොඳද?"

පැමලා සතුටෙන් සිනා වෙමින් කීවා ය.

"ඇයි නැත්තේ? අපිත් ඒ නාට්‍යය බලන්න යනවා. දැන් නම් හරි ම ෂෝක්. අපි හැමෝ'ට ම එකතු වෙලා නාට්‍ය බලන්න යන්න පුළුවන්. ඇයි තේ බොන්නත් පුළුවන්."

පැම්ගේ කට හඬ ද ප්‍රීතියෙන් බර වෙලා ය.

වැඩි වෙලාවක් යන්නට පෙර මව්වරුන් දෙදෙනා ද කුළුපග වූහ. ඒ නිසා ම ඔවුහු ළමයින්ගේ අදහස එකහෙලා ම අනුමත කළහ. සවස දෙක හමාර පමණ වන විට ඔවුන් සියලු දෙනා ම, සිනාසෙමින්, තොරතෝංචියක් නොමැති ව කතා කරමින්, අළුත් ආරංචි හුවමාරු කර ගනිමින් නාට්‍යය රඟ දක්වෙන ශාලාව කරා ඇවිද ගියහ.



අවාසනාවකි. ඔවුන් සියලු දෙනාට ම නාට්‍ය ශාලාවේ එකිනෙකට යාබද අසුන් හිමි වූයේ නැත. ඒ නිසා ඔවුන්ට නැවතත් එක් ව කතාබහ කරන්නට අවස්ථාව ලැබුණේ තේ පානයට නාට්‍යය මදකට නතර කළ අවස්ථාවේදී ය. මාර්ගරි ෆෙන්වෝර්දි ගැන පුදුම හිතෙන ආරංචියක් නිවුන් සොයුරියන්ට අසන්නට ලැබුණේ ඒ වෙලාවේදී ය.

දුර දිවීමේ තරඟයෙන් වාර්තාවක් බිහි කළ ක්‍රීඩිකාවක් ගැන නිවුන් සොයුරියෝ පැමලාට කීවෝ ය.

"ඔයාලා දන්නවද? ඒ ගැණු ළමයා හරි ම දක්ෂයි ක්‍රීඩා කරනකොට. අපිට එයත් එක්ක හැරෙන්නවත් බෑ. ඔයා දන්නවද පැමලා. එයාගේ නම තමයි මාර්ගරි ෆෙන්වෝර්දි.

ඇලිසන් එසේ කියද්දී පැමලාගේ දෑස පුදුමයෙන් මහත් වෙන ආකාරය නිවුන් සොයුරියෝ දුටහ.

"මාර්ගරි ෆෙන්වෝර්දි? ඔයාලා මේ කියන්නේ එයා සෙන්ට් ක්ලෙයාර් එකේ ඉගෙන ගන්නවා කියලද? එයා ඉගෙන ගන්නේ කොහෙද කියලා අපි කවුරුවත් දන්නේ නෑ."

"ඇයි. මාර්ගරි ඔයාලගේ ඉස්කෝලෙත් ඉගෙන ගත්තද? එයා මීට ඉස්සර ගියේ මොන ඉස්කෝලෙට ද කියලා අපිට කවදාවත් ම කියලා තිබුණේ නෑ."

පැට් ඇසුවේ දරාගත නොහැකි පුදුමයෙනි.

"නෑ..... මොන පුදුමයක්ද? ඇත්තට ම එයා දැන් ඉගෙන ගන්න ඕනෑ හය වැනි වාරයේ පංතියක."

පැමලා කල්පනාකාරී හඬකින් කීවා ය.

"ඇයි? එයාට එච්චර වයසද?"

ඉසබෙලුත් ඒ පුදුමයට හවුල් වූවා ය.

"ඔයාලට හිතාගන්න බැරිද?"

පැමලා ලොකු කථාවකට මුර පිරුවා ය.

"එයා හැම දෙයක් ම හංගනවා. සෙන්ට් හිල්මා ඉස්කෝලේ ඉගෙන ගන්නා දවස්වල එයා වාර දෙකක් ම ෆේල් වුණා කියලා මම දන්නවා. ඊට පස්සේ එයා ඉස්කෝලෙන් අයින් වුණා. මාර්ගරි කියන්නේ ඉක්මනට කේන්ති යන ගුරුවරියන් එක්ක නිතර ම ගෝරි වෙන අශීලාචාර ළමයෙක් කියලා මම හොඳට ම දන්නවා."

නිවුන් සොයුරියන් දෙදෙනා පැමලා දෙස විමසිලිමත් ව බැලූහ. ඔව්, ඇය කියන්නේ මාර්ගරි ගැනයි. ඒ ගැන කිසි ම සැකයක් නැත. එයා එක ඉස්කෝලෙකින්, තවත් ඉස්කෝලෙකට මාරු වෙමින් යන අශීලාචාර ළමයෙකි. එය මොන තරම් අභාග්‍යයක් ද?

"මොන තරම් පුදුම කථාවක් ද?"

ඇලිසන් පුදුමයෙන් බෙරිහන් දුන්නා ය.

"වැඩි දවසක් යන්නට ඉස්සර වෙලා එයා සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙනුත් එළියට දමයි. එයා පැට්ට කරපු දේ ඔයා දන්නවද?"

ඉන් පසු ව ඇලිසන් විසින් මාර්ගරි ගැන ඇති සියලු ම දේ රස කර කර කියන්නට වූවා ය. පැට් ගෙතූ ඇඳුම විනාශ කළ හැටි, පංතියේදී ඇති වූ මහා කලබැගෑනිය වැනි



දේවල් ගැන ඇලිසන් කියූ දේවල් පැමලා අසා සිටියේ පුදුමයෙන් මහත් කරගත් දෙනෙතින් යුතු ව ය.

"මාර්ගරි ඔය වගේ දේවල් කරනවා. ඒක එයාගේ පුරුද්ද?"

පැමලා කථා කරන්නට වූයේ සෑහෙන වෙලාවකට පසුවයි.

"හැබැයි එකක් තියෙනවා. පැට් ගොතපු ඇඳුම ඉරලා දැම්මා වගේ දේවල් නම් මාර්ගරි කවදාවත් ම කරන්නේ නෑ. ඒක සහතිකයි. ඒ වගේ දෙයක් කරනවා නම් හැංගිලා කරන්නේ නෑ. පැට්ගේ අතින් ඇඳුම උදුරගෙන එයා ඉස්සරහම ඉරලා දැම්මා කියලා කිව්වා නම් පිළිගන්න පුළුවන්. සෙන්ට් හිල්මා ඉස්කෝලෙදි නම් මාර්ගරි ඒ වගේ දේවල් කෙරුවේ නෑ."

"ඇයි එයා ඉස්කෝලෙන් අයින් කෙරුවේ?" ඇලිසන්ගේ කට හඬට විපරම්ශීලී බවක් එකතු වී තිබේ.

"නරක හැසිරීම. ඉක්මනට තරහා යන එක. නපුරුකම වගේ දේවල් නිසා. එයා ශාන්ත හිල්මා ඉස්කෝලේ ඉන්නකම් ඒ වගේ දේවල්වල අඩුවක් තිබුණේ නෑ. දැන් එයාට වයස අවුරුදු දහසයක්. පැට්ගෙයි ඉසබෙල්ගෙයි පංතියේ ඉන්න වයසකම ළමයා මාර්ගරි වෙන්න ඕනෑ. ඒ ගැන කිසි ම සැකයක් නෑ,"

"ඔව්...... එයා තමයි. එයාගේ වයස අවුරුදු දහසයක් වෙන්න ඇති කියලා අපි නිතර ම හිතුවා. හැබැයි එයා අපේ පංතියේ වෙන ළමයි තරම් ඉගෙන ගන්න දක්ෂ නෑ. ඇලිසනුත් එහෙමයි."

පැට් එහෙම කියනකොට ඇලිසන්ගේ මුහුණ ලැජ්ජාවෙන් රතු විය.

"එහෙම කියන්න එපා. මුල් දවස්වල මම ඉගෙන ගන්න දුර්වලයි තමා. හැබැයි දැන් මම උනන්දුවෙන් ඉගෙන ගන්නවනේ."

"හරි....... හරි....... ඒ ගැන වැඩිදුර හිතන්න එපා."

පැට් කරුණාභරිත හඬකින් ඇලිසන්ගේ හිත සැනසුවා ය.

"ඔයා ගොඩාක් මහන්සි වෙලා ඉගෙන ගන්නවා කියලා මම දන්නවා. හැබැයි ඒක ඔයයි, මොරිසුයි, මාර්ගරියි අතර තියෙන තරඟයක් කියන එක නම් අමතක කරන්න එපා. ඒ තරඟයෙන් පරාද වෙන කෙනා මේ වාරයේ පන්තියේ අන්තිමයා වෙයි. ඒ හින්දා ඔයාට ගොඩක් උනන්දු වෙන්න සිද්ධ වෙනවා. ඇලිසන් තේරුණාද?"

ඔවුන් නැවතත් පාසල කරා පැමිණෙද්දීත් සොයුරියන් තිදෙනා බොහෝ දේ පිළිබඳ ව කථා කළහ. ඕ'සුලිවාන් මහත්මිය කාර් එක පදවද්දී ගැහැණු ළමුන් තිදෙනා පිටුපස අසුනේ වාඩි වී කථා කරමින් සිටියහ.

"එතකොට මාර්ගරීට වයස අවුරුදු දහසයයි. එක පංතියේ කිහිප සැරයක් ෆේල් වෙන්න තරම් එයා මොන තරම් මෝඩ කෙල්ලෙක්ද? එයා වගේ කෙනෙක් සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙට ගත්ත එක ගැන මට ඇත්තට ම පුදුමයි."

එසේ කීවේ ඉසබෙල් ය. ඒ අතර ඕ'සුලිවාන් මහත්මිය නොඉවසිලිමත් ස්වරයකින් ළමයින්ගේ කථාවට එකතු වූවා ය.



"ඒක පුදුම වෙන්න දෙයක් නෙවෙයි ළමයි. සෙන්ට් ක්ලෙයාර් විතරක් නෙවෙයි. වෙන ඕනෑ ම ඉස්කෝලයක් වුණත් ඔය වගේ දුර්වල ළමයින්ට අත දෙන්න ඉදිරිපත් වෙනවා. මිස් තියෝබෝල්ඩ් කරලා තියෙන්නේ හරි දෙයක්. එයා මාර්ගරි ෆෙන්වෝර්දි ගැන හැම දෙයක් ම දන්නවා කියලා මට සහතිකයි. එහෙම දැනගෙනත් එයා සෙන්ට් ක්ලෙයාර් එකට අරගන්න ඇත්තේ මාර්ගරී හොඳ මාර්ගයකට ගන්න ඕනෑ නිසයි."

ගැහැණු ළමුන් තිදෙනා එක් වර ම නිහඬ වූහ. මාර්ගරි ඉක්මනින් ම ශාන්ත ක්ලෙයාර් පාසලෙන් ඉවත් කරනු ඇතැයි ඔවුන් තිදෙන මුලින් සිතුව ද මවගේ කථාවෙන් පසු ව ඔවුන්ගේ සිතිවිලි වෙනස් වී තිබිණි. නරක ළමයින් යහ මඟට ගන්නා සෙන්ට් ක්ලෙයාර් පාසල මොන තරම් උසස් පාසලක් ද?

"අම්මේ..... අපි මාර්ගරි ගැන දැන ගත්තු දේවල් ඉස්කෝලේ වෙන අයට කියන්න හොඳ නෑ නේද?"

බොහෝ වේලාවකට පසු ව පැට් එසේ ඇසුවා ය. ඉසබෙල් සහ ඇලිසන් සිතමින් සිටියේ ද ඒ පිළිබඳව යි.

"ඇත්ත වශයෙන් ම ඔයාලා කරන්න ඕනැත් ඒකමයි. ඒ ගැන කිසි ම සැකයක් නෑ. ඒ ළමයා ගැන ඔයාලා දැනගත්තු දේවල් ඉස්කෝලේ පුරා ම ප්‍රචාරය කරන එක හරිම නරක වැඩක්. මාර්ගරීට හංගන්න රහසක් තියෙනවා. ඔයාලා ඒක හෙළි කරන එක හොඳ නෑ. මේ දේවල් වෙන කවුරු හරි දැනගන්නවට එයා කැමැති නෑ. එයාට ලැජ්ජ හිතෙනවා ඇති."

නිවුන් සොයුරියන්ගේ සිත්වල තිබුණේ ද එවැනි ම සිතිවිල්ලකි. මාර්ගරි පිළිබඳ ව ඔවුන් දැනගත් දේ වෙන

කෙනෙකුට පැවසීමට ඔවුන් සතුටු නොවූව ද ඇලිසන්ගේ සිතේ තිබුණේ වෙනත් අදහසකි.

"හැබැයි මේ රහස හරි ම අපූරුයි."

ඇලිසන් එසේ කීව ද ඇගේ කථාව අවසන් වීමට පෙර පැට් සැරෙන් මෙසේ කීවා ය.

"මේ අහනවා ඇලිසන්. මේ සිද්ධිය ඕපාදූපයක් විදිහට ඉස්කෝලේ පැතිරෙව්වොත් බලාගෙනයි."

පැට් කෝපයෙන් පිපිරෙමින් එසේ කියද්දී ඇලිසන් ඇය පැත්තකට තල්ලු කළා ය.

"සද්ද කරන්න එපා. මම මේ රහස කාටවත් ම කියන්නේ නෑ. සහතිකයි. හැබැයි මට කේලාම්කාරි කියලා කියන එකත් ඔයාලා නවත්වන්න ඕනෑ. ඒ වචනෙට මම කැමති නෑ. ඉස්සර නම් මම ඕපාදූප කිව්වා. හැබැයි දැන් නෑ. ඒ බව දැන දැනත් ඔයාලා මට විහිලු කරනවා."

ඇලිසන්ගේ දෙනෙත පුරා කඳුළු කැට පොදි ගැසේ. තවත් මොහොතකින් ඒවා පිටතට පනින්නට සූදානම් ව ඇති සෙයකි. ඇලිසන්ට දැන් දුකක් දැනෙන බව පැට්ට වැටහෙයි. ඒ නිසා ඇ කරුණාවෙන් කතා කළා ය.

"කට වහගන්නවා මෝඩ කෙල්ල. ඔයා මේ ගැන වචනයක්වත් කියන්නේ නෑ කියලා මම දන්නවා. අපිට ඔයාව විශ්වාසයි."

ඔවුන් කථා වූ ලෙස ම මාර්ගරි ගැන වචනයක් හෝ පාසලේදී කීවේ නැත. මාර්ගරි අශීලාචාර ගැහැණු ළමයෙක් බව ඔවුහු තව දුරටත් විශ්වාස කළහ. එමෙන් ම පැට්ගේ



ගෙතු ඇඳුම ඉරා දැම්මේ ද මාර්ගරිම බව ඔවුහු තව දුරටත් විශ්වාස කළහ.

මාර්ගරි මේ කිසිවක් ගැන දැන සිටියේ නැත. ඇය නිතර ම තමන්ට හුරු පුරුදු ලෙස ම දවස් ගත කළා ය. නිරතුරු ව ම පොත් කියවන මාර්ගරි පාසලේ ගැහැණු ළමයින් ගැන කිසි ම තැකීමක් නොකළා ය. ඇගේ මනා පෙනුමක් ඇති මුහුණේ හැම වෙලාවේ ම තිබුණේ නොමනාපයකි. එමෙන් ම මාර්ගරි තව දුරටත් ගුරුවරියන් අතර ජනප්‍රිය චරිතයක් නොවූවා ය.



Scanned with CamScanner

# එරිකාගේ කුහක වීරකම් නැවතත්

පැට්ට හෝ ඉසබෙල්ට නපුරු කමක් කිරීමේ නොඉවසිල්ලෙන් එරිකා දවස් ගත කරමින් සිටින බව කිසිවකු හෝ දන සිටියේ නැත. තමා මොන තරම් නපුරු දේවල් කළත් ඒ වැරදි මාර්ගරිගේ පිටින් යන බව එරිකා දන සිටියා ය. එරිකා කොතරම් නොඉවසිලිමත් ව බලා සිටියද ඇයට අවස්ථාවක් උදා වූයේ සතියක් පමණ ගත වූවාට පසුවයි.

එදින සවස් වරුවේ පළමු සහ දෙවැනි වාරවල ළමුන් සියලු දෙනා ම ක්ෂේත්‍ර අවසාන චාරිකාවක් සඳහා පාසලෙන් නික්ම ගියහ. ළමුන් සියලු දෙනා ම තම තමන්ගේ ගමන් මලු ද රැගෙන ගිය අතර ඒවායේ සටහන් පොත් සහ විවිධ පරිසර ආදර්ශන ආදිය ද එකතු කර ගැනීමේ භාජන ආදිය ද තිබිණි.

මිස් රොබට් සහ මිස් ජෙන්ක්ස් ද ළමුන් සමඟ අධ්‍යාපන චාරිකාව සඳහා එක් ව සිටියහ. පාසලෙන් මදක් ඈතට වෙන්න පිහිටා ඇති කැලෑවක් සහ පොකුණක් එදින ඔවුන්ගේ අධ්‍යයනයට ලක් ව තිබිණි. මේ ගමනේදී හමුවෙන වැදගත් දේවල් චිත්‍රයට නැගීම සහ ආදර්ශන එකතු කිරීම ළමයින්ට පැවරී තිබිණි.



එදින සවස් වරුව පුරා ම පැවැති මේ ක්ෂේත්‍ර අධ්‍යයන චාරිකාවෙන් වඩාත් ම ප්‍රීතියට පත් ව සිටියේ නිවුන් සොයුරියන් දෙදෙනා ය. එදින කොතරම් නම් අපූරු දවසක් ද? හිරු දීප්තිමත් ව පායා තිබූ අතර පරිසරය පුරා ම තිබුණේ කදිම උණුසුමකි.

"පොකුණේ ගෙඹි පැටව් ඉන්න පුළුවන් කියලා මට හිතෙනවා. හොඳ වෙලාවටයි මම භාජනේකුත් අරගෙන ආවේ."

පැට් කීවේ ප්‍රීතියෙනි. ඇයට තමාගේ පරිසර සටහන් පොත ගැන තිබෙන්නේ පුදුමාකාර ආඩම්බරයකි. ඇය විසින් අඳින ලද ඉතා අලංකාර සටහන් කිහිපයක් ම ඒ පොතේ පිටු අතර තිබේ. මිස් රොබට් පවා ඒ අලංකාර සටහන් ගැන ප්‍රසාදයට පත් ව සිටියා ය. වසර අවසානයේදී පැවැත්වෙන ප්‍රදර්ශනය සඳහා ඒ චිත්‍ර ඉදිරිපත් කළ හැකියැයි මිස් රොබට්, පැට් හට කීවා ය.

"මට තව අඳින්න තියෙන්නේ චිත්‍ර කිහිපයක් විතරයි. ඒ ටික අද හවස ඇඳලා ඉවර කරන්න පුළුවන් වෙයි. ඉසබෙල් ඔයා මාත් එක්ක ම ඇවිදින්න යන්න එනව නේද?"

පැට්, ඉසබෙල්ගෙන් ඇසුවේ සතුටිනි.

"ඇයි, නැත්තේ...... මම එනවා."

ඉසබෙල් තම නිවුන් සොයුරියට කීවා ය. නිවුන් සොයුරියන් දෙදෙනා නිතර ම එකට ම ගමන් කරන නිසා වෙන කිසිවෙකුත් තමන් සමඟ පැමිණෙන්නැයි ඔවුන්ට කරදර කරන්නේ නැත. අනිත් ගැහැණු ළමයි ද තම තමන් වඩාත් ප්‍රිය කරන ගැහැණු ළමයින් සමඟ ඇවිදින්නට සූදානම් ව සිටිති. ජැනට්, හිලරි සහ ලූසි සමඟ එකතු වෙන්නට බොහෝ

දෙනෙක් උත්සාහ කරති. ඔවුන් ඒ තරමට ම මිත්‍රශීලී ගැහැණු ළමයින් ය.

දූත් ගැහැණු ළමෝ පරිසරය අධ්‍යයනය කරමින් ඇවිද යති. එරිකා සහ මාර්ගරී සමග ඇවිදින්නට කිසිවෙකුත් කැමැති වූයේ නැත. ඒ නිසා ඔවුන් දෙදෙනා එකට එක් වී නිහඬ ව ම ගමන් කළහ. මේ නිහඬ ගැහැණු ළමුන් දෙදෙනා දෙස බලන ගැහැණු ළමුන් රහස් කථා වෙන්නටත් ඉහි හිහි පාන්නටත් අමතක කළේ නැත.

"තරක බිත්තර දෙකක් ම එකට ළං වෙලා." විනි කෙඳිරුවා ය.

"ඒ අය කථා නොකරන එකෙන් ම සතුටු වෙනවා කියලයි මට හිතෙන්නේ. හැබැයි අද නම් මාර්ගරීගේ මුහුණ කළු වෙලා නෑ. ඒ කියන්නේ එයාට තරහ ගිහින් නෑ කියන එකයි."

සැබැවින් ම මාර්ගරීගේ සිතට කිසියම් අසහනයක් දැනෙමින් තිබේ. තනියම ඇවිද යාමට ඇගේ සිත තුළ කැමැත්තක් තිබේ. විශේෂයෙන් ම එරිකා වැනි ගැහැණු ළමයෙකු සමඟ එක් ව ගමන් කිරීමට මාර්ගරීගේ සිතේ එතරම් මනාපයක් නැත. ඒ නිසා ම ඇය එරිකාට නොකියා කීවේ තමාගෙන් ඉවත් ව යන ලෙසටයි.

එදින සන්ධ්‍යාව කහ පාට උණුසුම් හිරු එළිය මැද ප්‍රීතිමත් ව ගෙවී ගියේ ය. ගැහැණු ළමුන් රංචුව වනය පුරා ඇවිද යමින් සටහන් ලියා ගනිති. චිත්‍ර අඳිති. තවත් සමහරෙක් නිදර්ශන එකතු කරති. සමහර ගැහැණු ළමෝ ප්‍රිම්රෝස් මල් කැකුළු නෙළා ගවුම්වල බොත්තම් කාස අතර රඳවා ගත්හ.



ඉන් පසු ව ඔවුහු වනාන්තරයේ කෙළවරට වෙන්නට පිහිටා ඇති පොකුණ කරා පිය නැගූහ. පොකුණේ ජලය මතු පිට ඒ වන විටත් පිහිනමින් සිටින ගෙඹි පැටවුන් රංචුව දුටු සැනින් පැටිගේ මුහුණට ප්‍රීති සිනාවක් නැඟ ආවේ ය.

"මම ගෙඹි පැටව් කීප දෙනෙක් අල්ලා ගන්නවා."

පැටි එක්වර ම ප්‍රීතියෙන් කීවා ය.

"එපා පැටි. ඔයාට ඒක කරන්න බෑ. උන් ඉන්නේ පොකුණේ ඈත. පොකුණට බැස්සොත් ඔයාගේ සපත්තු තෙමෙයි."

ඉසබෙල්, තම නිවුන් සොයුරියට කීවා ය. එහෙත් පැටි හාත්පස ම විපරම් බැල්මක් හෙළුවා ය.

"මිස් රොබට්වුයි, මිස් ජෙන්කුයි දෙන්නා කොහෙද? ඒ අය තාම කන්ද උඩ වෙන්න ඇති., මම සපත්තු දෙක ගළවලා පොකුණට බහිනවා."

ගැහැණු ළමුන් පිරිස පුදුමයෙන් ගල් ගැසුණහ.

"පැටි. ඔයා කරන්න හදන්නේ එච්චර හොඳ වැඩක් නම් නෙවෙයි. ඔයාගේ කකුල්වල මඩ ගෑවිල තියෙන හැටි දැක්ක ම මිස් රොබට්ට හොඳට ම කේන්ති යයි."

ජැනට්වුත් අවවාදාත්මක හඬකින් පැටිට කීවා ය.

"කකුල් දෙක සෝද ගන්න පුළුවන්."

එසේ කියූ පැටි තමාගේ පිටේ එල්ලෙමින් තිබූ ගමන් මල්ල ගළවා අසල තිබූ කණුවක එල්ලුවා ය. ඉන්පසු ව පුංචි භාජනයක් අතට ගෙන එය පොකුණේ ඉවුර මත තැබුවා ය.

තවත් එතරම් වෙලාවක් ගත වන්නට පෙර සපත්තු සහ මේස් ගළවා දමන්නට පැට්ට හැකි විය. තවත් තත්පර කිහිපයකින් ඇය පොකුණේ ජලයට පා නැඹුවා ය.

"දෙයියනේ! පොකුණේ වතුර පුදුම විදිහට සීතලයි, පතුලේ මඩත් තියෙනවා. ඒ මදිවට මගේ කකුල් වල කටු වගේකුත් ඇනෙනවා."

"පැට්ගේ කථාවට ගැහැණු ළමුන් හැම දෙනා ම හයියෙන් සිනාසුණහ. දැන් ඔවුන් සැම දෙනා ම පොකුණ වටේ රොක් වී පැට් කරන දේ ගැන බලා සිටිති. සිනා හඬ හා තොරතෝංචියක් නැති කථා බහ පොකුණ අසලින් ගිගුම් දෙයි.

පැට් දැන් සූදානම් වෙන්නේ ගෙඹි පැටවුන් ඇල්ලීම සඳහායි. පොකුණට නැමුණු ඇය ඉතා ම සීරුවෙන් ගෙඹි පැටවකු අල්ලන්නට උත්සාහ කළ ද පැට්ගේ ඇඟිලි අතරින් මිදුණු ගෙඹි පැටවා ඉවතට පිහිනා ගියේ සැමගේ ම මුවහට සිනා නංවමිනි.

"කමෝන් පැට් ආයෙමත් ට්‍රයි කරන්න."

ඉසබෙල් තම සොයුරිය දිරිමත් කරමින් බෙරිහන් දුන්නා ය. පැට් නැවත නැවතත් ගෙඹි පැටවකු අල්ලා ගැනීමට උත්සාහ කළ ද ඒ හැම අවස්ථාවකදී ම ඇගේ අතැඟිලි අතරින් ලිස්සා යාමට තරම් ගෙඹි පැටවු ද දක්ෂයින් වූහ. ඒ සමඟ ම පොකුණ වටා රොක් වී සිනා සළමින් සිටි ගැහැණු ළමුන් පිරිස අතර නිහඬතාවයක් ඇති වී ගියේ ය. පුදුමයකි. මිස් රොබට් සහ මිස් ජෙන්ක් පොකුණ අසලට ම පැමිණ සිටිති.



"පැට්......"

1417

තවත් තත්පර කිහිපයකින් අවට නිහඬතාවය බිඳ හරිමින් මිස් රොබට්ගේ කෝපාන්විත කට හඬ ගිගුම් දුන්නේ ය.

"මොකක්ද මේ ඔයා කරන පිස්සු වැඩේ.? මෝඩ කෙල්ල. සීතලෙන් ගල් වෙලා මැරෙන්නද හදන්නෙ? මේ වගේ සීතල වතුර තියෙන පොකුණකට බහින්න තරම් ඔයාගේ මොළේ නරක් වෙලා ද? ඉක්මනට ගොඩට එන්න."

"අනේ මිස් රොබට්..... කරුණාකරලා මිස් රොබට් මම ගෙඹි පැටවෙක් අල්ල ගන්නකම් ටිකක් ඉන්න...."

දුක්බර හඬකින් මිස් රොබට්ට ආයාචනා කළ පැට් නැවතත් පොකුණේ සීතල ජලයට අතැඟිලි ඔබා ගත්තා ය.

"පැට්...... ඉක්මනට ගොඩට එනවා. ඇත්තමයි. මම ඔයාට තව එක තත්පරයක්වත් දෙන්නේ නෑ. තේරුණාද?"

මිස් රොබට් නැවතත් කෝපයෙන් බෙරිහන් දුන්නා ය.

සියලු ම ගැහැණු ළමුන් මේ සිදුවීම දෙස බලා සිටියත් ඒ ගැන වඩාත් උනන්දුවෙන් සහ සතුටින් බලා සිටියේ ගැහැණු ළමුන් දෙදෙනෙකු පමණි. ඒ දෙදෙනා නම් එරිකා සහ මාර්ගරි ය. නැනිතලාවේ සිටින අශ්වයින් රංචුවක් දෙස බලා සිටින අතරේ මාර්ගරි සහ එරිකා සතුටින් සිනා සෙමින් පොකුණ දිහාවට ද නෙත් යොමා සිටියහ.

පොකුණ දෙසින් ඇසෙන සිනා හඬ දෙස විපරම් කළ එරිකා දුටුවේ අපූරු දෙයකි. පොකුණ අසල කණුවක ගමන් මල්ලක් එල්ලෙමින් තිබේ. පී. ඕ'සුලිවාන් යනුවෙන් එහි සටහන් කොට ඇත. කිසිදු අනුමානයක් නැහැ. ඒ ගමන් මල්ල පැට්ගේ ය.

එරිකා පොකුණ දෙසට විපරම් බැල්මක් හෙලුවා ය. කිසි ම ගැහැණු ළමයෙක් ඈ දෙස බලා නොසිටියි. එමෙන් ම පඳුරු යායක් ඉදිරියේ තිබෙන නිසා කිසි ම අයෙකුට තමා නොපෙනෙන බව ද එරිකාට විශ්වාසයි. ඉන්පසු ව ඈ මාර්ගරි කොහේද යි විපරම් කළා ය. මාර්ගරි තවමත් තැනිතලාවේ අශ්වයින් නරඹමින් සිටින්නී ය.

එරිකාගේ සිතට කුරිරු සතුටක් පැන නැගුණේ ය. ඈ කණුවේ එල්ලා ඇති පැට්ගේ ගමන් මල්ල අතට ගෙන විවර කළා ය. ඉන් පසු පැට්ගේ ඉතා ම වටිනා පරිසර සටහන් පොත මඩ ගොඩ මතට විසිකර දැමුවා ය. එයින් නොනැවතුණ එරිකා පැට්ගේ නිදර්ශන එකතු කොට ඇති ටින් එක බිමට දමා පාගා දැමුවා ය. මේ සියලු ම නපුරු දේවල්, කුරිරු සතුටක් ලබමින් නිහඬ ව ම කළ එරිකා, පැට්ගේ ගමන් මල්ල පඳුරු යාය තුළට විසිකර දැමුවා ය. ඉන්පසු ව ඇය පඳුරු යාය අතරින් රිංගා ගොස් පොකුණේ අනිත් පැත්තට ඇවිද ගියා ය. කිසි ම ගැහැණු ළමයෙකු එරිකාගේ නපුරු ක්‍රියාව දුටුවේ නැත. එරිකා තනි ව ම සිනාවෙමින් සිටින බව තෙසි පමණක් දුටු නමුත් එය එතරම් ගණන් ගත යුතු දෙයක් යැයි ඇය සිතුවේ නැත.

ටික වෙලාවකට පසු ව පැට් පොකුණෙන් පිටතට පැමිණියා ය. ඇගේ දෙපා දැඩි සීතලෙන් ගල් වී ඇතිවාක් මෙනි. වහ වහා අත් ලේන්සුව, මේස් සහ සපත්තු දමාගත් පැට් කඳු මුදුනට දුව ගියේ ශරීරයට අවශ්‍ය උණුසුම ලබා ගැනීම සඳහා යි.

"මොන දේ වුණත් මට එක ම එක ගෙඹි පැටවෙක්වත් අල්ල ගන්න බැරිවුණා. ඒක තමයි මට දුක."



පැට්ගේ කටහඬ දුක් බර ය. ඉන්පසු ව ඈ අනෙකුත් යෙහෙළියන් සමඟ එක් වූවා ය.

"කෝ මගේ බෑග් එක. මම කොහෙද ඒක තිබ්බෙ?"

පැට් වටපිට බලමින් අසද්දී ඉසබෙල් ඇය අසලට ආවා ය.

"අර අතන තියෙන කණුවේ ඔයා බෑග් එක එල්ලනවා මම දැක්කා."

පැට් කණුව දිහා බැලුව ද ඇගේ බෑග් එක එතැන තිබුණේ නැත.

"මොන පුදුමයක් ද? ඔයා බෑග් එක එතැන තියනවා මම හොඳට ම දැක්කා. අර බලන්න මාර්ගරි ඒ ළඟ ම ඉන්නවා. මාර්ගරි ඔයා පැට්ගේ බෑග් එක ගත්ත නම් කරුණාකරලා ඒක මෙහාට දෙනවද?"

එසේ කීවේ ඉසබෙල් ය.

"මොකක්ද අර පඳුර අස්සේ තියෙන්නේ?"

ශීලා එක් වර ම අසල පඳුරු යාය දෙසට ඇඟිල්ලක් දිගු කළා ය. විශාල, දුඹුරු පැහැති පැට්ගේ ගමන් මල්ල පඳුරු අතර තිබෙන ආකාරය ශීලාගේ තියුණු නෙත්වලට හසු වුණේ ය.

"අනේ..... ඒ තියෙන්නේ මගේ බෑග් එක. කොහොමද ඒක එතෙන්ට ගියේ....?"

පැට් ඇසුවේ පුදුමයෙනි. තමාගේ බෑග් එකට සිදු ව ඇති දේ ඇයට වැටහෙන්නේ නැත. ඒ නිසා පැට් වහ වහා



Scanned with CamScanner

පඳුරු යාය වෙතට දුව ගියා ය. ඈ මුලින් ම දුටුවේ ඇගේ වටිනා සටහන් පොත මඩ ගොඩේ දමා තිබෙන ආකාරයයි. ඉන් පසු ව වටිනා නිදර්ශන එකතු කළ ටින් එක තලා පොඩි කර දමා තිබෙන ආකාරයත් පැට් දුටුවා ය. දෙවියනේ! මේ මොන අපරාධයක් ද? හිත හඩා වැටුණත් පැට් කිසි ම දෙයක් කීවේ නැත. එසේ වුව ද සිතේ ඇති වේදනාව ඇගේ මුහුණ මත මනා ව සටහන් ව තිබෙන ආකාරය නම් ඕනෑ ම අයෙකුට දක ගත හැකි ය.

"පැට්...... මොකද වෙලා තියෙන්නෙ.....?"

තම නිවුන් සොයුරියගෙ හදිසි වෙනස් වීම දුටු ඉසබෙල් පුදුමයෙන් ඇසුවා ය. ඊළඟ නිමේෂයේදී සිදු ව ඇති දෙය ඇයට දකගත හැකි විය. මෙයත් කිසියම් අයෙකුගේ නොවැදගත් ක්‍රියාවක් බවට කිසිදු සැකයක් නැත. සටහන් පොතේ සටහන් ව ඇති අඩි සළකුණු සහ ටින් එක පාගා තිබීමෙන් ම ඒ සැකය වඩාත් තහවුරු කර ගත හැකි ය.

"මේක හරකෙක් නැතිනම් ඒ වගේ වෙන සතෙක් කරපු දෙයක් වෙන්න බැරිද?"

ඉසබෙල් කල්පනාකාරී හඬකින් ඇසුවා ය. වෙන කිසිවෙකු මේ දේ තම සොයුරියට කළා යැයි සිතන්නටවත් ඇගේ එතරම් කැමැත්තක් නැත.

"නෑ......... ඒක කොහොමටවත් වෙන්න බැරි වැඩක්."

ජැනට් හිස සළමින් කීවා ය.

"අනික, මේ වැඩේ කෙරුවේ කවුද කියලා දක්කේ නැති වුණත් ඒ කෙනා කවුද කියලා අපි හැම දෙනා ම දන්නවනේ."



ගැහැණු ළමුන් සියලු දෙනා ම මාර්ගරි දෙස හැරී බැලූහ. මේ කිසිවක් නොදත් ඈ මදක් එහාට වෙන්නට සිටගෙන ළමයින් දෙස පුදුමයෙන් බලා සිටියා ය.

"අපිත් එක්ක පොකුණ ළඟට ආවේ නැත්තේ කවුද?"

ජැනට් නැවත වතාවක් ගැහැණු ළමුන් දෙසට හැරී ඇසුවා ය.

"එක්කෙනයි. ඒ තමයි මාර්ගරි. ඔයාලා හිතන්න ඇයි එයා අපිත් එක්ක ආවේ නැත්තේ? මට නම් කිසි ම සැකයක් නෑ. එයා තනියම ඉඳලා මේ ජරා වැඩේ කරන්න ඇති."

"ළමයි මොකක්ද වෙලා තියෙන්නේ.?"

මිස් රොබට් ඔවුන් සිටින තැනට පැමිණියේ ඒ වෙලාවේදී ය.

"ආනේ පැට්...... මොකද ඔයාගේ පොත් ටික මඩ ගොඩට වැටිලා....? කිසි ම පරෙස්සමක් නෑ. ඔයාගේ හරි ම ලස්සන චිත්‍ර ටික විනාශ වෙන්න ඇති. කොහොමද මේක සිද්ධ වුණේ.?"

"මම දන්නේ නෑ මිස් රොබට්."

දුකින් රතු වූ මුහුණෙන් යුතු ව පැට්, මිස් රොබට් දෙසට හැරෙමින් කීවා ය. මොන දේ සිදු වුණත් ඈ මාර්ගරිව පාවා නුදුන්නා ය. කෙසේ වුව ද කුමක්දෝ බරපතල දෙයක් සිදු ව ඇති බව මිස් රොබට් හට වැටහුණේ ය. ඒ අතර ගැහැණු ළමයින් මාර්ගරීගේ නම කොඳුරන ආකාරය ද ඇයට ඇසිණි.

"හ්ම්..... ඉක්මන් කරලා ඔයාගේ දේවල් අහුලා ගන්න. අපි දැනටමත් පරක්කු වෙලා. අපි පස්සේ මේ සිදුවීම ගැන හොයලා බලමු."

මිස් රොබට් එසේ කියද්දී ගැහැණු ළමෝ හනි හනික ආපසු යෑම සඳහා සූදානම් වූහ. එරිකා, මාර්ගරි සමඟ ම ඇවිද ගියා ය. දිගු කාලයක් පෙරුම් පුරමින් බලා සිට කරන ලද නොහොබිනා ක්‍රියාව සාර්ථක වීම නිසා ඇගේ හිතට සතුටක් දැනේ. ඒ අතර මාර්ගරි නැවත වතාවක් නොකළ වරදකට හසු ව තිබේ. තමා සිහිනයක් දකින්නාක් මෙන් ඇයට වැටහෙයි. ඒ නිසා ඇය ඇවිද යන්නේ සිහිනයකින් මෙනි. මෙවැනි අශෝභන වැඩ කරන්නේ කවුදැ යි මාර්ගරීට නිකමට හෝ සිතාගත නොහැකි ය. කෙසේ වුව ද තමා එවැනි දෙයක් නොකළ බව නම් ඇයට සහතික ය.

මාර්ගරි එරිකා දෙස බැලුවා ය. ඈ තමා සමග ඇවිද යමින් සිටියි. එරිකාගේ මුහුණේ තිබෙන්නේ සිනාවකි. ඈ කළ දෙයට මාර්ගරි හසුවීමේ සතුට නිසා ඇගේ මුවගට සිනාවක් නැගුණා විය හැකි ය. ඒ හිනාව මාර්ගරීගේ ඇස ගැසිණි. මීට පෙර පැට්ගේ ගෙතූ ඇඳුම විනාශ කළ දවසේදිත් එරිකාගේ මුහුණේ මෙවැනි සිනාවක් තිබුණ බව මාර්ගරීට මතක ය. එසේ නම් මේ සියලු ම දේවල් කළේ එරිකා ද? එසේ වුව ද ඒ සැකය ස්ථිර වශයෙන් ම දැන ගන්නේ කෙසේ ද? මාර්ගරි තනි ව ම සිතුවා ය.

"මම මොන තරම් අවාසනාවන්ත ළමයෙක් ද? වෙන කෙනෙක් කරපු වැරැද්දකට අදත් මම නිරපරාදේ අහුවෙලා."

එදා හවස තේ පානයෙන් පසු ව ගැහැණු ළමුන් සියලු දෙනා ම කථා කළේ පැට්ට මුහුණ දීමට සිදු වූ අළුත්



ම අත්දැකීම පිළිබඳවයි. ගැහැණු ළමුන්ගේ කෝපාන්විත දෑස් වලින් හෙම්බත් ව සිටි මාර්ගරි පාසල් පුස්තකාලය වෙතට ගොස් පොතක් කියවන්නට උත්සාහ කළා ය.

මාර්ගරි පුස්තකාලයේ සිටින අතරේදී මෙතෙක් වෙලා ඇලිසන්ගේ මල්ලේ සිටි බළලා එළියට පැන්නේ ය.

"මේ කථාව කවදාවත් නොකියන්නයි අපි හිතාගෙන හිටියේ."

වට පිටාව දෙස විපරමින් බලන ගමන් ම ඇලිසන් කථාව ආරම්භ කළා ය.

"හැබැයි මාර්ගරි අද කරපු වැඩේ නිසා මම ඒ අදහස වෙනස් කර ගත්තා. ඔන්න හැම දෙනා ම දැනගන්න..... මේක හරි ම අපූරු කතාවක්."

"ඇලිසන්...... කට වහගන්නවා."

224

පැට් නොඉවසිලිමත් ව බෙරිහන් දුන්න ද ඇලිසන්ගේ කට වැසුණේ නැත.

"නෑ........ මම කට වහන්නේ නෑ. මාර්ගරි මේ වගේ ජරා වැඩ හැමදාම කරනකොට මම කට වහගෙන ඉඳියි කියලා ඔයා හිතනවද? නෑ.... එහෙම වෙන්නේ නෑ."

ගැහැණු ළමුන් සියලු දෙනා ම නිහඬ ය. ඇලිසන් කියන්නට සූදානම් වෙන්නේ මොන තරම් රසවත් කථාවක්ද? ඔවුන් සියලු දෙනා ම කුතුහලයෙන් යුතු ව ඇලිසන් දෙස බලා සිටිති.

"පසුගිය නිවාඩු දවසේදි අපිට පරණ යාලුවෙක් හම්බ

වුණා..... එයා යන්නේ ශාන්ත හිල්මා ඉස්කෝලෙට. ඔයාලා දන්නවද? මාර්ගරි ගිහින් තියෙන්නෙත් ඒ ඉස්කෝලෙටමයි. හැබැයි එයා ශාන්ත හිල්මා ඉස්කෝලෙන් අස්කරලා."

ඇලිසන් තමා ළඟ තිබුණ පණිවිඩය කුතුහලයෙන් පිරුණු ගැහැණු ළමුන් ඉදිරියේ දිග හැරියා ය. මාර්ගරි ඉස්කෝලෙන් අස් කරලා! දෙවියනේ. ඒක මොන තරම් නින්දා සහගත ආරංචියක් ද? මාර්ගරි ශාන්ත ක්ලෙයාර් පාසලට පැමිණි දවස්වල ම ඇය මීට පෙර ගිය පාසල ගැන සඳහන් නොකළේ ඒ නිසා විය යුතු යැයි ගැහැණු ළමෝ සිතූහ.

"එච්චරක් නෙවෙයි."

ඇලිසන් තමාගේ දිදුළන දෙනෙත්වලින් ගැහැණු ළමුන් දෙස බලමින් නැවතත් කථා කරන්නට පටන් ගත්තා ය.

"මාර්ගරි මේ වෙනකොට ඉස්කෝල පහකට, නැත්නම් හයකට විතර ගිහිල්ලා තියෙනවා. ඒ හැම ඉස්කෝලෙකින් ම එයාව අයින් කරලා. ඒ විතරක් නෙවෙයි. මාර්ගරි පළමු වාරයේ හිටියට එයාට අවුරුදු දාසයක් වයසයි කියලත් ඔයාලා දන්නවද?"

ඒ සමග ම ගැහැණු ළමුන් අතරේ විශාල ගාල ගෝට්ටියක් පැතිරුණේය. මෙතරම් දවසක් එම කථාව විශ්වාස නොකළ ද දැන් නම් ඒ පිළිබඳ ව අවිශ්වාස කරන්නට හේතුවක් නැතුවා සේ ය.

"එතකොට සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ මොකටද ඒ වගේ ළමයෙක් බාර ගත්තේ? අනික අපි මොකටද ඒ වගේ ළමයෙක් එක්ක ඉගෙන ගන්නේ.? ඒක හරියට ම දැනගන්නයි මට ඕනෑ."



තෙසි නොඉවසිල්ලෙන් කීවා ය.

"එයාව අයින් කරන්න කියමු."

හිලරි ද කථාවට එකතු වූවා ය.

"අපි ගිහිල්ලා මිස් තියෝබෝල්ඩ් හම්බ වෙමු. මේ වගේ ළමයෙක් අපේ ඉස්කෝලේ ඉන්නවට අපි කැමති නෑ කියලා එයාට කියමු."

විනී ද අළුත් අදහසක් ඉදිරිපත් කළා ය.

"මාර්ගරි වගේ ළමයෙක් මෙහේ ඉන්නව කියලා අපේ අම්මා දැනගත්තොත් මාව එක දවසක්වත් මේ ඉස්කෝලේ තියන එකක් නෑ."

එසේ කීවේ එරිකා ය.

"ඔයා කට වහගන්න."

තෙසි, එරිකා පසෙකට තල්ලු කරමින් කීවා ය. එරිකා වැනි අයෙකු තමාගේ කථාවට මැදිහත් වෙනවාට තෙසි කොහොමටවත් කැමැති නැත.

"ඉතින් දැන් ආදරණීය මාර්ගරී ගැන හැම දෙයක් ම අපි දන්නවනේ. ඉස්කෝල හයකින් ම අයින් කරපු අකීකරු කෙල්ල. හත් වැනි ඉස්කෝලෙනුත් ළඟදී ම අයින් කරයි. එතකොට ආයෙමත් පැට්ට කරදර කරන්න එයාට ලැබෙන්නේ නෑ."

ඩොරිස් එසේ පවසද්දී ම දොර දෙසින් කිසියම් හඬක් ඇසුණේය. ගැහැණු ළමුන් සියල්ලෝ ම එදෙසට හැරුණෝ ය. සුදු මැලි වූ මුහුණක් සහිත මාර්ගරි එතැන සිටගෙන

සිටියා ය. ඩොරිස් කියූ දෙය මාර්ගරීට ඇසුණා නිසැක ය. ඇගේ සිතට කෝපයක් දැනුණාට කිසිදු සැකයක් නැත.

මෙතෙක් කාලයක් දිවි හිමියෙන් ආරක්ෂා කළ රහස හෙළි වී ඇත. එසේ නම් ශාන්ත ක්ලෙයාර් පාසලෙනුත් ඉවත් ව යා යුතු ය. මාර්ගරී එසේ සිතන්නට ඇත.

මාර්ගරී තමාගේ දුඹුරු පැහැති තියුණු දෙනෙත විදා ගැහැණු ළමයින් දෙස බැලුවා ය. කිසිවක් කියන්නට මුව විවෘත කළ ද ඇගේ මුවගින් වචනයක් හෝ පිට වූයේ නැත. නිහඬ ව ගල් ගැසී සිටි ළමයින් දෙස විමසිලිමත් ව බැලූ මාර්ගරී නිහඬ ව ම කාමරයෙන් පිට ව ගියා ය. තමාගේ පාවහන් පොළොව මත වදින බොල් හඬ පමණක් ඇයට ඇසේ.

"අන්තිමේදී අපි ඒ වැඩේ කෙරුවා" ඉසබෙල් දුක්බර හඬකින් කීවා ය. ඇගේ සිතට දනෙන්නේ සංතාපයකි.

"මාර්ගරිගේ රහස හෙළි වුණා. හෙට වෙනකොට මුළු ඉස්කෝලෙ ම ඒ රහස දැන ගනියි."



# මාර්ගරීට බිහිසුණු අත්දැකීමක්.

නිවුන් සොයුරියන් දෙදෙනාගේ හිත් වලට මාර්ගරී පිළිබඳ ව ඇති වන්නේ දරා ගත නොහැකි කණගාටුවකි. එහෙත් මාර්ගරිගේ රහස හෙළි කිරීම පිළිබඳ ව ඔවුන් ඇලිසන්ට දොස් කියුවේ ද නැත. පැට්ට කළ නොහොබිනා ක්‍රියාව නිසා ඇලිසන් බොහෝ සෙයින් කෝප වී සිටි බව ඔවුන්ට නොරහසකි. ඥාති සොයුරිය මාර්ගරිට එරෙහි වූයේ ඒ නිසා බව පැට් හා ඉසබෙල් තේරුම් ගෙන සිටිති.

"මාර්ගරී ඉස්කෝලෙන් අයින් වෙලා යයි ද? නැතිනම් ඒ වගේ වෙන මොනව හරි දෙයක් කරයි කියලා. ඔයාට හිතන්න බැරි ද?"

පැට්, ඉසබෙල්ගෙන් ඇසුවා ය.

"මේ වගේ දෙයක් මට වුණා නම් මම එක මොහොතක් වත් මේ ඉස්කෝලේ ඉන්නේ නෑ. මම ඒ වෙලාවෙ ම ගෙදර යනවා."

"සමහර විට මාර්ගරී ගෙදර යන්නේ නැති වෙයි."

ඉසබෙල් කීවා ය.

"ඔයාට මතක නැද්ද? මාර්ගරි කවදාවත් එයාගේ ගෙදර ගැන කියන්නේ නෑ. අම්මා තාත්තා ගැන වචනයක්වත් කථා කරන්නේ නෑ. සහෝදර, සහෝදරියෝ ගැන චූට්ටක් වත් මතක් කරන්නේ නෑ. ඇයි එයා එහෙම කරන්නේ.? මට නම් ඒක හරි ම ප්‍රෙහේලිකාවක්."

"ඒ වගේ දෙයක් තියෙනවා කියලා අපි මුලින් නිකමටවත් හිතුවේ නෑනේ."

ලූසි ඔරීල් ද ඔවුන්ගේ කථාවට මැදිහත් වූවා ය.

"හැබැයි, මාර්ගරි ගැන හැම දෙයක් ම මිස් තියෝබෝල්ඩ් දන්නවා කියලා මට විශ්වාසයි. ඒ හැම දේම දනගෙන මාර්ගරි හොඳ ළමයෙක් කරන්න ඕනෑ නිසා එයා අපේ ඉස්කෝලෙට ගන්න ඇති. ඒ විතරක් නෙවෙයි. ඉස්කෝලේ ටීචර්ලා මාර්ගරි ගැන දනගෙන ඉන්න ඇති. ඒ හැම දෙනා ම මාර්ගරීට හොඳ ළමයෙක් වෙන්න චාන්ස් එකක් දුන්නා කියලා ඔයාලට හිතෙන්නේ නැද්ද?"

ලූසිගේ බැරෑරුම් පෙනුමක් ඇති කුඩා මුහුණ දෙස නිවුන් සොයුරියන් දෙදෙන බලා සිටියේ ප්‍රීතිමයෙනි. ඈ මොන තරම් ප්‍රිය මනාප ගැහැණු ළමයෙක් ද? ඇය කියන දේවල් අසා සිටින්නට කිසිවෙකුත් අකමැති නැත. එමෙන් ම ලූසි වෙන අයෙකුගේ හිත රිදෙන දේවල් කිසි දිනෙක නොකියන බව ද නිවුන් සොයුරියෝ දනිති.

"ලූසි..... ඔයා කියන දේ හරි කියලා මට හිතෙනවා."

පැට් කීවා ය.

"මාර්ගරි මෙච්චර නපුරු, මුරණ්ඩු ළමයෙක් වුණේ



මොන හේතුවක් නිසා ද කියලා අපි නිකමටවත් හිතුවේ නෑ. ඒ වෙනුවට අපිත් එයාට නපුරුකම් කෙරුවා. ගුරුවරියනුත් මාර්ගරිට අනුකම්පා කරන කොට අපි එයාට කරපු දේ හරි නෑ කියලා මට දනුයි තේරෙන්නේ."

"ඔව්...... ලූසි කියපු දේ හරි."

හිලරි ද ඔවුන් සිටින තැනට පැමිණෙමින් කීවා ය.

"අපේ ඉස්කෝලේ හැම ගුරුවරියක් ම මාර්ගරිගේ රහස් දනගෙන හිටියා. හැබැයි ඒ අය මාර්ගරීට හොඳ ළමයෙක් වෙන්න උදව් වුණා. ඇත්තට ම සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙන් කෙරෙන්න ඕනැත් ඒ වගේ දේවල් ම තමයි."

"ඇත්තට ම මේක තේරුමක් නැති කථාවක්. අපිට දන් ගොඩාක් දේවල් කථා කරන්න පුළුවන්. හැබැයි ඒවා තේරුමක් නැති කථා නම් මම ඒකට කැමැති නෑ. අපි ඒ වෙනුවට මොනව හරි දෙයක් කරමු."

පැට් නැවතත් කීවා ය. ජැනට් කථාවට එකතු වුණේ ඒ වෙලාවේදී ය.

"ඔව්..... පැට්ගේ කථාවට මමත් එකඟයි. තේරුමක් නැති දේවල් කොච්චර කථා කෙරුවත් වැඩක් නෑ. ඇත්තට ම අපි මාර්ගරිට මොකද කරන්නේ? ලූසි. අපි මෙච්චර වෙලාවක් හිතපු නැති වැදගත් දෙයක් ගැන ඔයා කිව්වා. ඉතින් අපි ඊළඟට මොනවා කළොත් හොඳයි ද කියලා ඔයා ම කියන්නකෝ."

"මම කියන්නේ මෙච්චරයි. අපි දන් නිදා ගනිමු. ඊට පස්සේ හෙට උදේ අපි දෙන්නෙක් හරි තුන් දෙනෙක් හරි

ගිහිල්ලා මිස් තියෝබෝල්ඩ් හම්බ වෙලා අපි දන්න දේ ගැන එයත් එක්ක කථා කරමු."

ලූසී කීවා ය.

"බැරි වෙලාවත් මේ දේවල් සිද්ධ වුණාට පස්සේ මාර්ගරී අපට මුහුණ දුන්නේ නැතිනම් එයා මේ ඉස්කෝලෙනුත් අයින් වෙන්න තීරණය කරලා කියලා අපිට හිතන්න වෙනවා. එයා වෙනසක් නැති ව හිටියොත් එයා ඉස්කෝලේ ඉන්න තීරණය කරලා කියලා අපිට හිතන්න පුළුවන්. හැබැයි මේ හැම දෙයක් ම තීරණය කරන්න ඕනේ මිස් තියෝබෝල්ඩ් තමයි. අපි දැන ගෙන හිටියේ නැති වුණාට මාර්ගරීගේ නරක හැසිරීම ගැන මිස් තියෝබෝල්ඩ් හැම දෙයක් ම දන්නවා ඇති."

"හරි එහෙම නම් අපි දැන් නිදා ගනිමු." ජැනට් කීවා ය.

"අපේ අම්මා කියපු වැදගත් දෙයක් මට මතක් වෙනවා. ඕනෑ ම අමාරු දෙයක් කරන්න ඉස්සර වෙලා නිදා ගන්න කියලයි අම්මා මට කියලා තියෙන්නේ. නින්දෙන් පස්සේ අමාරු ප්‍රශ්නවලට ලේසියෙන් උත්තර හොයන්න පුළුවන්. ඒ හින්දා අපි දැන් නිදා ගනිමු. හෙට උදේ මිස් තියෝබොල්ඩ් හම්බ වෙලා අපි දන්න දේවල් එයාට කියමු."

"ඒ වැඩේ කරන්න හොඳ ම කෙනා තමයි ලූසි. ඒ වගේ දේවල් කරන්න ලූසි හරි ම දක්ෂයි. මේ කථාව හරියට ම කියන්න පුළුවන් එයාට විතරයි. ඒ වගේ ම පැටූයි, ඉසබෙලූයි දෙන්නත් මිස් තියෝබෝල්ඩ් හම්බ වෙන්න යන්න ඕනෑ. මොකද මේ හැම දෙයක් ම සිද්ධ වුණේ පැට්ටනේ.

ඒ අදහස ඉදිරිපත් වූයේ හිලරිගෙනි.



"ඒක හොඳයි. හැබැයි මිස් තියෝබෝල්ඩ් හම්බ වෙන්න නොගියොත් හොඳයි කියලා මට හිතෙනවා. මොකද මේ හැම දෙයක් ම මට ප්‍රහේලිකාවක් වගේ. කමක් නෑ. වෙන කවුරු හරි කෙනෙකුට යන්න පුළුවන්. අපි ඒ ගැන පස්සේ කථා කරමු."

ලූසි එසේ කීවා ය.

ඉන් පසු ගැහැණු ළමුන් තම තමන්ගේ ඇඳන් මත වැතිරුණාහ. කිසියම් දෙයක් සිදු කළ යුත්තේ හෙට දින උදේ ය. මේ රාත්‍රියේදී කිසියම් දෙයක් සිදු වුවහොත් ඔවුන්ගේ සිත් වලට විශාල වේදනාවක් දැනෙන්නට පුළුවන. ඒ නිසා තවත් පැය කිහිපයක් ඉවසා සිටිය යුතු යැයි ඔවුන් සැම දෙනා ම තීරණය කළහ.

ගැහැණු ළමුන් නිදා ගන්නට සූදානම් වුව ද එරිකා මේට්‍රන් හමු වීමට ගියා ය. ඇයට උණ ගතියක් ඇති වී තිබේ. මේට්‍රන් එරිකාගේ ශරීර උෂ්ණත්වය පරීක්ෂා කර බැලුවා ය. සැබැවින් ම එරිකාට උණ සැදී තිබේ. මේට්‍රන් එරිකා අසනීප කාමරයට පිටත් කර හැරියා ය.

"ඔයාට උණ හැදීගෙන එනවා එරිකා." මේට්‍රන් කීවා ය. "දැන් මේ බේත් ටික බොන්නකෝ. ඊට පස්සේ ඉක්මනට ම ඇඳට යන්න. මම තව ටික වෙලාවකින් ඔයාව බලන්න එන්නම්. කොහොමටත් හෙට උදේ වෙනකොට උණ අඩු වෙයි. අනිද්දා වෙනකොට ඔයාට ඉස්කෝලේ යන්න බැරි වෙන එකක් නෑ."

මේට්‍රන් එසේ කීව ද එරිකා ඒ ගැන සැලකිල්ලක් දැක්වූවේ නැත. මොන හේතුවකින් හෝ දවසක් හෝ දෙකක් පාඩම් වැඩ අතපසු වෙනවා නම් ඇය කැමති ය. ඈ අසනීප

කාමරයට යැමට වඩාත් සතුටු වූයේ මාර්ගරීගෙන් ඈත් වීමට ලැබුණු නිසයි. මාර්ගරී තමා පිළිබඳ ව සැක කරන බව එරිකාට ඉවෙන් මෙන් වැටහීම ඊට හේතුවයි.

"මම කරන හැම දේකට ම අනුවෙන්නේ මාර්ගරී. හැබැයි මේ වැඩේ හැමදාම කරන්න බැ. කවදා හරි මගේ හොර වැඩේ අහු වුණොත් ඔක්කොම ඉවරයි. කොහොම වුණත් මම ටික දවසක් නිශ්ශබ්ද ව ඉන්න ඕනෑ. ඒ වුණාට මට පැටිව නම් පෙන්නන්න බැ. එයා දකිනකොට මගේ හිතට එන්නේ පුදුමාකාර තරහක්."

එරිකා තනි ව ම සිතන්නට වූවා ය. ඈ දැන් තනි ව ම අසනීප කාමරයේ සිටින්නී ය. අසනීප කාමරය පාසල් ගොඩනැගිල්ලේ බටහිර පැත්තට වෙන්නට පිහිටා ඇති හුදකලා ගොඩනැගිල්ලකි. පාසලේ ගැහැණු ළමයින්ට සෑදෙන සෑම අසනීපයකදී ම මේ හුදකලා අසනීප කාමරයට ගොස් ප්‍රතිකාර ලබා ගැනීමට ඔවුන්ට සිදු වෙයි. අසනීප තත්ත්වය සම්පූර්ණයෙන් ම සුව අතට හැරෙන තෙක් මේට්‍රන්වරියගේ ඇල්ම, බැල්ම හා ප්‍රතිකාර නිරතුරු ව ම ලැබේ.

එරිකාට සැදී ඇති උණ රෝගය බෝවෙන රෝගයක් ද යි මේට්‍රන්වරියට එක් වර ම හඳුනාගත නොහැකි විය. ඒ නිසා එරිකාට ද හුදකලා කාමරයක සිටින්නට සිදු වූයේ ය. ඔක්ඩේන් පාඨශාලාවත් සමඟ ලක්‍රොස් තරඟයෙන් පසු ව සරම්ප සැදී අසනීප වූ තවත් ගැහැණු ළමයින් දෙදෙනෙක් ද අසනීප කාමරයේ සිටිති. එරිකා මේ ගැහැණු ළමුන් දෙදෙන සමඟ තැබුවහොත් ඇයට ද සරම්ප රෝගය වැළඳීමට හැකියාවක් තිබේ. එසේ සිතූ මේට්‍රන්වරිය එරිකා තනි කාමරයක තබන්නට තීරණය කළා විය යුතු ය.



අසනීප කාමරයේ උඩ කොටසට වෙන්නට පිහිටා ඇති ඒ කාමරය ඉතා ප්‍රිය මනාප ය. නින්දට යැමට පෙර එරිකා ජනේලයෙන් පිටත බැලුවා ය. පැහැදිලි අහස පුරා තරු කැට විසිරී ඇත. එය බලා සිටින්නට තරම් චමත්කාර දසුනකි. ටික වෙලාවක් එසේ සිටි ඇය ජනෙල් තිරය පහතට දමා ගොස් ඇඳ මත වැතිරුණාය. මේ රාත්‍රිය ගෙවී ගොස් උදා වන්නේ කොතරම් අපූරු උදෑසනක් ද?

උණු වතුර බෝතලයක් ද උණුසුම් ලෙමන් සහ මීපැණි බඳුනක් ද රැගත් මේට්‍රන්වරිය කාමරයට පැමිණියා ය. අසනීපය නිසා ලැබුණේ මොන තරම් රසවත් සංග්‍රහයක් ද? එරිකාගේ සිත ප්‍රීතියෙන් පිරී යයි. ටික වෙලාවක් ඇය සමඟ ගත කළ මේට්‍රන්වරිය එරිකාට සුබ රාත්‍රියක් ප්‍රාර්ථනා කරමින්, විදුලි බුබුළු ද නිවා දමමින් කාමරයෙන් පිට ව ගියා ය.

වැඩි වෙලාවක් ගත වීමටත් පෙර නින්ද එරිකා සොයා ආවේ ය. සිත තුළ මොන තරම් සිතිවිලි පෙරළි කෙරුවත් ඈ නිදා ගන්නට උත්සාහ කරයි. ඇගේ සිතේ තෙරපෙන්නේ එතරම් සුබදායක සිතිවිලි නම් නොවේ. තමාගේ කපටි උපක්‍රම සාර්ථක වීමේ ප්‍රීතිය නිසා උපන් ආඩම්බරයත් පැට් සහ ඉසබෙල් පිළිබඳ ව සිතේ උපදින වෛරයත් එරිකාගේ සිතිවිලි අතර කලවම් වී ඇත.

සියල්ල මෙසේ සිදුවෙද්දී පාසලේ එක ගැහැණු ළමයෙක් පමණක් නොනිදා සිටියා ය. ඒ මාර්ගරී ය. නිදන ශාලාවේ ඇඳ මත වැතිර සිටින මාර්ගරී අසලටවත් නින්ද නොපැමිණේ. අද දින ගැහැණු ළමයින් තමාට කළ ඇනුම් පද ගැන මාර්ගරී දිගින් දිගට ම කල්පනා කරන්නට වූවා ය. තමා මෙතෙක් කල් ආරක්ෂා කරගෙන සිටි රහස හෙළිවීම නම් මාර්ගරීගේ

සිතට ඔරොත්තු නොදෙන කාරණයකි. දැන් ඉතින් ශාන්ත ක්ලෙයාර් පාසලේ ඉගෙන ගැනීමේ ආශාවක් ඇගේ සිතට නැත. ඉක්මනින් හෝ ප්‍රමාද වී හෝ මේ පාසලට ආයුබෝවන් කිව යුතු යැයි මාර්ගරී තීරණය කළා ය. නැවත පාසල් යාමටත් විශේෂයෙන් ම මෙවැනි පාසලක නැවත ඉගෙන ගැනීමටත් මාර්ගරීගේ සිතේ කැමැත්තක් නැත. පාසලෙන් ඉවත් ව ගොස් රැකියාවක් සොයා ගෙන තනි ව ම ජීවත් විය යුතු ය යන තීරණයට ඇය එළැඹුණේ ඒ නිසා ය.

සයනාගාරයේ සිටින අනිකුත් ගැහැණු ළමයි තද නින්දේ පසුවෙති. කවරෙකු හෝ නින්දෙන් ගොරවන හඬ ද ඇසේ. මාර්ගරී තමාගේ වම් පැත්තට හැරී දෙනෙත් පියා ගත්තා ය. එහෙත් නිදිමත ඈ සොයා නොආවේ ය. ඒ වෙනුවට විවිධාකාර සිතිවිලි නැවතත් මාර්ගරිගේ සිතට වද දෙන්නට පටන් ගත්තේ ය. හෙට උදේට කුමක් සිදු වේවිද? දැන් පාසලේ ගැහැණු ළමුන් සියලු දෙනා ම තමන් පිළිබඳ රහස දැන ගෙන සිටිති. එය මොන තරම් නම් නරක දෙයක් ද?

පාසලෙන් අස් වී ඇයට ගෙදර යන්නට ද නොහැකි ය. අතේ තිබෙන්නේ සිලිං කිහිපයක සුළු මුදලක් නිසා වෙන කොහේ හෝ යන්නට ද මාර්ගරිට හැකියාවක් නැත. ඈ දෙලොවක් අතර අතරමං වෙලා ය. පාසලෙන් පිට ව යාමට හැකියාවක් නැත. එහෙත් පාසලේ නතර වීමට ද නොහැකි ය. තමා අන් අයට අකාරුණික වීම සහ දරුණු ලෙස සැලකීම යන කාරණා නිසා ඇයට දැන් පාසල පෙනෙන්නේ අපායක් මෙනි.

"දැන් නම් මට කිසි ම සැනසීමක් නැති ගානයි. මට කරන්න කිසි ම දෙයකුත් නෑ. මේ හැම දේකින් ම නිදහස්



වෙන්න ක්‍රමයක් ඇත්තෙ ම නැද්ද?"

දිගින් දිගට ම කල්පනා කරමින් සිටි මාර්ගරී දකුණු පැත්තට හැරුණාය. දෙනෙත් පියා ගත්තා ය. සුළු වෙලාවකට පසු ව නැවතත් දෙනෙත් හැරියා ය. නින්ද පෙනෙන තෙක් මානයකවත් නැත. නැවතත් උඩු අතට හැරුණු ඇය අඳුර දෙස බලා සිටියා ය. පාසලේ ඔරලෝසුව එකොළොස් වරක් නාද වෙන ආකාරය මාර්ගරිට ඇසුණේ ඒ වෙලාවේදියි. රාත්‍රී එකොළහයි ද? නින්ද පෙනෙන තෙක් මානයකවත් නැති මාර්ගරී දිගින් දිගට ම කල්පනා කරන්නට වූවා ය.

"වතුර වීදුරුවක් බීවොත් සමහර විට නින්ද යන්න පුළුවන්."

තවත් ටික වෙලාවකට පසු ව එසේ සිතූ මාර්ගරී ඇඳ මත හිඳ ගත්තා ය. ඉන් පසු ව ගවුම හැඳගෙන, සෙරෙප්පු ද දමා, කුඩා විදුලි පන්දම ද අතට ගත්තා ය. විදුලි පන්දමේ එළිය අඳුර ඉරා දමද්දී සයනාගාරයේ තද නින්දේ පසුවෙන අනෙකුත් ගැහැණු ළමයින් පිරිස ඇයට දැක ගත හැකි විය.

මාර්ගරී දොර හැරියා ය. ඉන් පසු ඇය කොරිඩෝරය වෙතට පැමිණියා ය. එහි කෙළවර නාන කාමරය පිහිටා ඇත. නාන කාමරය වෙතට ගිය මාර්ගරී වීදුරුවක් පුරවා ගෙන අයිස් මෙන් සීතල ජලය පානය කරන්නට වූවා ය. නාන කාමරයේ ඇති කුඩා ජනේලයෙන් අන්ධකාරයෙන් වැසුණු පිටත පරිසරය ඇයට පෙනේ.

නාන කාමරයේ ජනේලයෙන් පිටත බලමින් ම මාර්ගරී වතුර වීදුරුව බොන්නට වූවා ය. පුදුමයකි. පිටතින් පෙනෙන්නේ කුමක්ද? වීදුරුව පසෙකින් තැබූ මාර්ගරී දරාගත නොහැකි

පුදුමයෙන් යුතු ව ජනේලයෙන් පිටතට එබී බැලුවා ය.

"නාන කාමරයේ ජනේලය කෙළින් ම යොමු වී තිබෙන්නේ අසනීප කාමරය දෙසටයි. තට්ටු හතරක් උස සහ පටු ගොඩනැගිල්ලේ කෙළවරකට වෙන්නට පිහිටා ඇති අසනීප කාමරය කුඩා ආලෝක පුංජයක් හෝ නොමැති සඝන අඳුරේ ගිළී තිබේ.

ඉදිරියෙන් තිබෙන ගොඩනැගිල්ලේ තුන් වැනි මහලේ කෙළවරට වෙන්නට කිසියම් චලනය වන ආලෝක දහරාවක් මාර්ගරී දුටුවා ය. ඒ ආලෝකය පෙනෙන්නේ ජනේලය තුළිනි. සිතට කුතුහලයක් දනෙද්දී මේ අද්භූත ආලෝකය කුමක්ද යි මාර්ගරී කල්පනා කළා ය.

"ඒ එළිය හරියට ගිණි දැල්ලක් වගේ. ඒ වුණාට කවුද තුන්වැනි තට්ටුවේ නිදාගෙන ඉන්නේ? පොඩ්ඩක් ඉන්නකො. ඒක නිදන කාමරේක ජනේලයක් ද? නෑ නෑ මට හිතෙන හැටියට ඒක තුන්වැනි තට්ටුවට නගින පඩි පෙළ ළඟ තියෙන ජනේලයක්."

එසේ සිතූ මාර්ගරී තවත් ටික වෙලාවක් බලා සිටියා ය. එහෙත් අවට තියෙන අඳුර නිසා ඒ ආලෝකය තිබෙන තැන හරියට ම හඳුනා ගැනීමට ඇයට නොහැකි වූවාක් මෙනි. ඒ අතර ම අද්භූත ආලෝකය ටිකෙන් ටික වැඩි වෙන්නට ද පටන් ගෙන තිබිණි. එය ගිණි දැල්ලක් නම් වැඩි වෙලාවක් ගත වීමට පෙර මුළු ගොඩනැගිල්ල ම ගිණි දළුවලින් වැසී යනු ඇත.

"හොඳ ම වැඩේ තමයි ඉක්මනට ගිහින් නිදාගන්න එක. සමහර විට ඒක එරිකා ඉන්න කාමරේ වෙන්න ඇති.



මේට්‍රන් එරිකාට බෙහෙත් කරන්න ගිණි උඳුන පත්තු කරලා වෙන්නත් පුළුවන්. ඒ ගින්දර එළිය වෙන්නැති මට පේන්නේ."

එසේ නිගමනය කළ මාර්ගරී නැවත වතාවක් සයනාගාරයට ගියා ය. එහෙත් ඒ අද්භූත ආලෝකය පිළිබඳ ව ඇගේ සිතට කිසියම් දෙගිඩියාවක් දනෙමින් තිබිණි. ඒ නිසා ම මාර්ගරී නැවත වතාවක් සයනාගාරයෙන් පිටතට පැමිණියා ය.

මේ වතාවේදී ඇය නාන කාමරයේ ජනේලයකින් පිටතට එබී බලද්දී අද්භූත ආලෝකය වඩාත් පැහැදිලි ව තිබිණි. කිසිදු සැකයක් නොමැති ව එය හඳුනාගත හැකි ය. ඔව්........ එය ගින්නකි.

# වික්‍රමාන්විත මාර්ගරී

දෙවැනි වතාවේදි ආලෝකය දුටු සැනින් ම මාර්ගරී මහා හඬින් බෙරිහන් දුන්නා ය. දැන් පඩි පෙළ අසල ඇති ජනේලය සම්පූර්ණයෙන් ම ගිණි දළුවලින් වැසී තිබේ.

"ගින්නක්....."

එසේ කෑ ගසමින් ම මාර්ගරී මිස් රොබට්ගේ කාමරය වෙතට දුව ගියා ය.

"මිස් රොබට්....... මිස් රොබට්...... ඉක්මනට එන්න. අසනීප කාමරේ ගිනි ගන්නවා. අර බලන්න... අනේ ඉක්මන් කරන්නකෝ....."

මාර්ගරීගේ කෑ ගැසීමත්, දොරට පහර දීමත් නිසා මිස් රොබට් එක් වර ම අවදි වූවා ය. ඇයගේ කාමරය කෙළින් ම යොමු ව තිබෙන්නේ අසනීප කාමරය දෙසටයි. මාර්ගරී දුටු දෙය ම මිස් රොබට් ද දුටුවා ය. වහ වහා තමාගේ රාත්‍රී ඇඳුම ඇහලා ගත් මිස් රොබට් එළියට දුව යද්දී මාර්ගරී ද ඈ පසු පස ම දුව ගියා ය.

"මිස් රොබට්. මම දුවගෙන ගිහිල්ල මේට්‍රන්ට මේ



ගැන කියන්න ද? එයා තාම මේ ගැන දන්නේ නැති ව ඇති."

"ඔව් මාර්ගරී, ඉක්මනට යන්න. හැබැයි වෙන ළමයින්ට මේ ගැන දැනගන්න තියන්න එපා. මම ගිහිල්ලා මිස් තියෝබෝල්ඩ්ට මේ ගැන කියන්නම්. ඉක්මන් කරන්න මාර්ගරී....."

මාර්ගරී වහ වහා පඩි පෙළ බැස ගොස් පැති දොර විවෘත කළා ය. ඉන් පසු ව අසනීප කාමරයත්, පාසලත් අතර ඇති තණ පිටිය හරහා වේගයෙන් දුව ගොස් මේට්‍රන්වරිය නිදා සිටින කාමරය අසලට ආවා ය.

"මේට්‍රන්..... මේට්‍රන්..... ඔයා නිදි ද?"

මේට්‍රන්වරිය දෙවැනි මහලේ කාමරයක නිදා සිටියා ය. නින්ද තදකම නිසාදෝ මාර්ගරී කොතරම් බෙරිහන් දුන්න ද මේට්‍රන් පිබිදුණේ නැත. එහෙත් සීතලට ගුලි වී නිදා සිටි ක්වීනිට මාර්ගරීගේ බෙරිහන් දෙන හඬ ඇසී තිබිණි. ඈ ජනේලය අසලට ගොස් පහත බැලුවේ පුදුමයකිනි.

"මොකද මේ?..... මාර්ගරී මොකද වෙලා තියෙන්නේ?"

"අසනීප කාමරේ ගිණි ගන්නවා. ඔයාලා ඉන්න තට්ටුවට උඩින් තට්ටුව ගිණි ගන්නවා. ඉක්මනට මේට්‍රන්ට කතා කරන්න."

ක්වීනි වහ වහා මේට්‍රන්වරිය නින්දෙන් පුබුදුවන්නට උත්සාහ කළා ය. ක්වීනිගේ මොර ගෑම ඇසුණු මේට්‍රන්වරිය නින්දෙන් පිබිදුණා ය.

තවත් ගුරුවරියන් කිහිප දෙනෙකු සමඟ මිස් තියෝබෝල්ඩ් ද එතැනට පැමිණියා ය. ඒ අතර ගුරුවරියක්

ගිණි නිවන අංශයට දුරකථන ඇමතුමක් ගත්තා ය. පාසල ගිනි ගන්නා බව ඉව වැටුණු නිසාදෝ සයනාගාරවල නිදා සිටි ගැහැණු ළමෝ හැම පැත්තෙන් ම එබිකම් කරන්නට වූහ. කලබල නොකර නිදා ගන්නට යන ලෙස ගුරුතුමියෝ ඔවුන්ට අවවාද කළහ.

"මගේ දෙවියනේ........ මෙච්චර අපූරු ගින්නක් තියෙද්දි මොන හිතකින් නිදා ගන්න යන්නද?"

ජැනට් උනන්දුවෙන් කීවා ය. කොතරම් අනතුරුදායක දෙයක් වුව ද මේ ගින්දර නිසා ඇගේ හිතට සතුටක් දනෙනවා විය යුතු ය.

"මම කවදාවත් මේ වගේ ගින්දරක් දැකලා නෑ. ඒ හින්දා හොඳට බලාගන්න ඕනෑ. කාටවත් අනතුරක් වෙලා ද?"

ගැහැණු ළමුන් සියලු දෙනා ම විමසිල්ලෙන් වටපිට බලන්නට වූහ. ඒ අතර මේට්‍රන්වරිය උණ හැදී සිටි ගැහැණු ළමුන් තිදෙනා ක්වීනි, රීටා සහ එරිකා ගැන විපරම් කරන්නට වූවා ය.

"මෙච්චර සීතල වෙලාවක ඒ අයට එළියේ හිටගෙන ඉන්න හොඳ නෑ. ආ ක්විනි ඔයා ඔතැනද? ඉක්මන් කරලා දෙවැනි වාරයේ ළමයි නිදාගන්න ශාලාවට යන්න. පළමුවැනි ඇඳ ඔයාට. රීටා ඔයත් යන්න. කෝ එතකොට එරිකා....?"

මේට්‍රන්වරියගේ පෙනුම මෙන් ම හැසිරීම ද කලබලකාරී ය.

"රීටා මෙතැන ඉන්නවා. අනික මම එරිකත් කොහේදෝ හරි දක්කා වගේ මතකයි."

ක්වීනි එසේ කීවා ය.



"හොඳයි..... ඉක්මන් කරලා එයාව හොයාගෙන ඇඳට එක්ක යන්න. එතකොට කෝ අපේ සේවිකාවෝ දෙන්නා. ඒ අයට කරදරයක් නැද්ද?"

මේට්‍රන්වරිය නැවතත් හදිසියෙන් කීවා ය. සැබැවින් ම ඔවුන් සියලු දෙනා ම ආරක්ෂාකාරි ව සිටිති. එහෙත් දත් සීතල ඔවුන් වටා වෙළෙමින් ගත හිරි ගඩු නංවයි. සීත කබාවලින් සීතල මට්ටු කරගත් ගැහැණු ළමෝ විශ්මයෙන් මහත් වූ දෙනෙත් වලින් ගිණි දළු ඉහළට නැගෙන ආකාරය දෙස බලා සිටිති.

"මේට්‍රන්. අසනීප කාමරේ හිටපු හැම දෙනා ම එළියට ආව ද?"

මිස් තියෝබෝල්ඩ් මේට්‍රන්වරිය දෙසට හැරුණා ය.

"ගැහැණු ළමයි..... සේවිකාවෝ. හැම දෙනා ම එළියට ආවා කියලා ඔයාට විශ්වාස ද?"

"මම ක්විනිව නම් දැක්කා. එතකොට රීටයි ක්විනියි එරිකව දැකල තියෙනවා. ඒ අය නිදාගන්න ගියා. එතකොට සේවිකාවොත් එළියට ඇවිත් මෙතැන ඉන්නවා."

මේට්‍රන්වරිය වටපිට බලමින් කීවා ය.

"හොඳයි. එහෙනම් හැම දේ ම හරි. මිස් තියෝබෝල්ඩ් සැනසුම් සුසුමක් හෙළුවා ය."

"දෙවියනි....... ගිණි නිවන අය ඉක්මනින් ආවොත් හොඳයි. නැතිනම් තට්ටු හතරේ ගොඩනැගිල්ල ම පිච්චිලා යයි."

එහෙත් අවාසනාවකි. ක්ලිනි දැන සිටියේ නැති එරිකා නොවේ. එරිකා යැයි කියා කරන පිරිවැති වසරේ ඉගෙන ගන්නා වෙනත් ළමයෙකි. මේවුන් එරිකා යැයි සිතේ දෙවැනි වසරේ ඉගෙන ගන්නා ළමයෙකුට යැයි ක්ලිනි දැනගෙන සිටියේ නැත. දෙ වැනි වසරේ එරිකා තවමත් අසනීප කාමරයේ ය.

මැඩමොසෙල් එක් වර ම බයෙන් බෙරිහන් දුන්නා ය. ඇ තමාගේ වෙවුලන අතක් ගිනි ගන්නා ගොඩනැගිල්ලේ ඉහළ මහලට දිගුකොට බෙරිහන් දෙද්දී හැම දෙනා ම එදෙස බැලුවෝ ය.

"අර බලන්න...... අර ගිනි ගන්න ගොඩනැගිල්ලේ කවුදෝ ඉන්නවා."

අසරණ එරිකා ජනේලයක් අසල බියෙන් බලා සිටියා ය. තද නින්දේ පසු වූ ඇය අවදි වූයේ දුමේ කටුක සැර වැදීමෙනි. නින්දෙන් පිබිදුණු ඇ දුටුවේ කළු පැහැති දුම් වලින් වැසුණු වටා පිටාවකි. කාමරයේ හැම තැනමත්, පිටතත් අඳුරු දුම් රැළි වලින් වැසී තිබුණු අතර, රතු පැහැති ගිනි දළු විහිදුවමින් ඇවිළෙන ගිනි ජාලාව දුටු සැනින් එරිකා බියෙන් සලිත වූවා ය.

බියෙන් තැතිගත් එරිකා ඇඳෙන් බිමට පැන විදුලි බුබුල දල්වූවා ය. අවාසනාවකි. ගින්දරට හසු ව විදුලි රැහැන් දැවී ගොස් තිබුණු නිසා විදුලි බුබුළු දල්වුණේ නැත. ඇ තම විදුලි පන්දම දල්වාගෙන දොර අසලට දුව ගියා ය. එහෙත් දොර විවෘත කළ වහා ම විශාල දුම් කැරැල්ලක් කාමරට කඩා වැදුණේ ය. පඩි පෙළ ගිනි දළුවලින් වැසී තිබේ. ඒ නිසා පිට ව යාමේ කිසි ම මගක් නැත. එරිකා බියෙන් මුසපත් වූ සිතින් එහා මෙහා දුවන්නට වූයේ ඉන් පසුවයි.



විදුලි කාන්දුවක් නිසා ගින්දර ඇති වී තිබිණි. පැරණි, අබලන් ලී තරප්පු පෙළ මුලින් ම ගින්දරට හසු ව තිබිණි.

පිට ව යාමේ මගක් නුදුටු එරිකා ඊළඟ කාමරයට දුවන්නට උත්සාහ කළා ය. එහෙත් සණ දුමාරය ඇයට බාධාවක් වූවා සේ ය. ඇ නැවතත් මුලින් සිටි කාමරයට පැමිණ උදව් ඉල්ලා මොර දෙන්නට වූවා ය.

"බේරා ගන්න...... මාව බේරා ගන්න......"

එරිකාගේ කටහඬ දුර්වල ය. ඒ නිසා ඇගේ හඬ කිසිවෙකුටත් ඇසුණේ නැත. නමුත් මැඩමොසෙල් අහම්බෙන් හෝ එරිකා දුටුවා ය. මැඩමොසෙල්ගේ බෙරිහන් දීමත් සමඟ ඉහළ බැලූ හැම දෙනාට ම එරිකා දක ගත හැකි විය.

මිස් තියෝබෝල්ඩ්ගේ මුහුණ සුදු මැලි වූ අතර ඇගේ හද ගැස්ම ද වේගවත් ය. ගැහැණු ළමයෙක් ඉහළ කාමරයේ තනි වී සිටින්නී ය. ඇ වටා පිටාවේ ගිණි දල් බුර බුරා නැගේ.

"ගිණි නිවන යන්ත්‍රය තාම නැද්ද? දෙවියනේ ඒක එන්න මෙච්චර පරක්කු මොකද?"

මිස් තියෝබෝල්ඩ් බියෙන් වෙවුලමින් වතුර පයිප්පයක් ගෙන ගින්දරට එල්ල කරන්නට උත්සාහ කළා 'ය. බුර බුරා නැගෙන ගින්දර මෙල්ල කරන්නට ඒ කුඩා දිය පහරට හැකියාවක් නැතුවා සේ ය. එරිකා නැවත වතාවක් බෙරිහන් දුන්නේ ඒ වෙලාවේදී ය.

"උදව් කරන්න........ මාව බේරාගන්න.... අනේ මාව බේරාගන්න."

පාසලේ සියලු ම දෙනා බිම එක් රොක් වී ඉහළ බලා සිටින බව එරිකාට පෙනේ. එහෙත් ඔවුන් කිසිවෙකුත් තමා ගළවා ගැනීමට ඉදිරිපත් නොවීම ඇයට ප්‍රහේලිකාවකි. ගිනි නිවන යන්ත්‍රය මෙතරම් ප්‍රමාද ඇයි ද යි එරිකාට නොවැටහේ. තමා සිටින ස්ථානයට දිගු කළ හැකි ඉනිමහක් ද නොමැති බව ද ඇයට සැකයක් නැත. එසේ නම් තමා ගැළවෙන්නේ කෙසේ ද? එරිකා බියපත් සිතින් කල්පනා කළා ය.

"අර උස ඉනිමහ කොහෙද?"

මාර්ගරී බෙරිහන් දුන්නේ ඒ වෙලාවේදී ය.

"ඒක ඉක්මනට අරන් එන්න. ඉනිමහ දිග මදි වුණොත් කඹයක් වගේ දෙයක් අපිට උඩට දාන්න පුළුවන් වෙයි."

උයන්පල්ලා ඉනිමහ රැගෙන ඒම සඳහා වහ වහා දුව ගියේ ය. ඔවුහු ඉනිමහ බිත්තියට හේත්තු කළහ. අයෙකු ඉනිමහ දිගේ ඉහළට නැගුණ ද එරිකා සිටින ජනේලය අසලට ළංවීමට හැකි වූයේ නැත.

"ඒක එච්චර හොඳ වැඩක් නෙවෙයි." ඉනිමහ දිගේ ඉහළට නැගුණු මිනිසා පහළ බසින ගමන් කීවේ ය.

"ඉනිමහ දිග මදි. කෝ මේ ගිණි නිවන යන්තරේ තාම නැද්ද? දැන් කොච්චර වෙලාවක් ගියාද?"

"ඒක වෙන ගින්දරක් නිවන්න ගිහිං. වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා ඒක එයි."

කලබලයට පත් ව සිටි ගුරුවරියන් අතරින් කෙනෙක් බලාපොරොත්තු සහගත ව කීවා ය.



"ඉක්මනට එයි. තව කොච්චර වෙලාවක් බලාගෙන ඉන්නද? වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා එරිකා ගින්දරට මැදි වෙයි."

මාර්ගරී බෙරිහන් දුන්නා ය. ඉන් පසු ව කිසිවෙකුටත් සිතා ගැනීමටවත් ඉඩක් නොතබා ඈ ඉනිමහ දිගේ ඉහළට නැගුණා ය. ඉනිමහ දිගේ වඳුරෙකු මෙන් ඉහළට නගින මාර්ගරී දෙස බලා මිස් තියෝබෝල්ඩ් කෑගැවා ය.

"මෝඩ කෙල්ල........ පල්ලෙහාට එන්න. ඔයාට මොනවත් කරන්න පුළුවන් කමක් නෑ."

ඉනිමහ දිගේ ඉහළට ම නගින මාර්ගරී දෙස සැවො ම බලා සිටියේ පුදුමයෙනි. දැන් ගිණි දළු වඩාත් ඉහළට බුර බුරා නැගෙන්නට පටන්ගෙන තිබේ. ඉනිමහ දිගේ ඉහළට නගින මාර්ගරිගේ අඳුරු පැහැති සේයාව ගිණිදළු අතරින් සැම දෙනාට ම පැහැදිලි ව ම දකගත හැකි ය.

"මාර්ගරී වැටෙයි. එයා කරන්නේ මොනවද කියලා මට නම් හිතාගන්න බෑ."

මිස් රොබට් වික්ෂිප්ත හඬකින් කිවා ය. නමුත් තමන් කරන්නේ කුමක්දැයි වැටහීමක් මාර්ගරීට තිබේ. ඉනිමහ තබා ඇති තැනට දකුණු පසින් යකඩ පයිප්පයක් ඉහළට ඇදී යයි. සමහර විට ඇය ඒ යකඩ පයිප්පය දිගේ ඉහළට නැග එරිකා සිටින තැනට යාමට අදහස් කර ගෙන සිටිනවා විය යුතු ය. එහෙත් මාර්ගරී කරන්නට හදන දේ දන්නේ ඇය පමණකි.

මාර්ගරී ඉනිමගේ මුදුනට ම ගොඩ වූවා ය. ඉන් පසු ව ඈ බිත්තියට හොඳින් සවි කොට ඇති යකඩ පයිප්පය අල්ලා ගත්තා ය. තවත් තත්පර කිහිපයකින් ඉනිමහ අතහැර

දැමූ ඇය යකඩ පයිප්පයේ එල්ලුණා ය.

මාර්ගරි මොහොතක් හෝ ප්‍රමාද නොවුණා ය. දැන් ඈ යකඩ පයිප්පය දිගේ බඩගාමින් ඉහළට නගියි. දෑතේ සවියෙන් හා දණහිස්වල උපකාරයෙන් ඉහළට නගින්නට අවශ්‍ය ශක්තිය මාර්ගරිගේ ශක්තිමත් සිරුරේ නොඅඩු ව තිබෙන්නාක් මෙනි. විටෙක ලිස්සා යමින් ද තවත් විටක අපහසුවෙන් ද පයිප්පය දිගේ ඉහළට නැග එන මාර්ගරි දෙස එරිකා බියෙන් සැළෙමින් බලා සිටියා ය.

"අනේ මාව බේරා ගන්න."

බියෙන් මුසපත් ව සිටි එරිකා හැඩුම්බර හඬකින් කෙදිරුවා ය. මාර්ගරි දැන් ජනේලය අසලට ම පැමිණ සිටියා ය. දැන් ඇයට තරණය කිරීමට තිබෙන්නේ අමාරු ම කොටසයි. පයිප්පය අත හැර ජනේලයට ගොඩ වෙන්නට සූදානම් වෙමින් මාර්ගරි මෙසේ කීවා ය.

"එරිකා........ මේ අහන්න. මොනව හරි දෙයක් හයියෙන් අල්ලගෙන ඔයාගේ අනිත් අත මට දෙන්න. ඔයාට උඩට අදින්න පුළුවන් නම් මට ජනේලෙන් ඇතුළට එන්න පුළුවන් වෙයි."

එරිකා ඇගේ අත මාර්ගරිට දිගු කළා ය. ඒ අතේ එල්ලී මාර්ගරි ජනේලයෙන් කාමරය තුළට ගොඩ වූවා ය. එරිකා වැළපෙමින් මාර්ගරි වැළඳ ගත්තේ ඒ වෙලාවේදී ය.

"දැන් ඉතින් මෝඩ ළමයෙක් වෙන්න එපා."

එරිකාගේ උරහිස සැහැල්ලුවෙන් අල්ලා ගන්නා ගමන් මාර්ගරි කීවා ය. ඒ අතර ම ඈ අඳුරු පැහැති දුමෙන් වැසී



ඇති කාමරය හාත්පස විපරමින් බලන්නට ද අමතක කළේ නැත. මේ වන විටත් කාමරයට පිටතින් බුර බුරා නැගෙන ගිණි දළුවල උණුසුම ඇගේ දෙපයට දැනේ.

"බල බලා ඉන්න වෙලාවක් නෑ. කෝ ඔයාගේ ඇඳ කොහේද?"

සණ දුමාරය තුළට අත දිගු කොට එරිකා තම නිදා සිටි ඇඳ පෙන්නුවා ය. මාර්ගරි වහා ම ඇඳ ඇතිරිලි කිහිපයක් ඩැහැ ගත්තා ය. ඉන්පසු ව ජනේලය අසලට දුව ගොස් පිටතට එබී බලා අලුත් වාතයෙන් හුස්ම ගත්තා ය. ඈ වහ වහා ඇඳ ඇතිරිල්ල ඉරන්නට පටන් ගත්තේ ඉන් පසුවයි.

"අනේ...... මොකක්ද ඔයා කරන්නේ?" එරිකා මොර දුන්නා ය. මාර්ගරි මෝඩ වැඩක් කරනවා යැයි සිතිවිල්ලක් ඇගේ සිතේ තෙරපෙයි.

"ඔය වැඩේ නතර කරලා මාවත් අරන් මේ ජනේලෙන් එළියට යන්න."

"තව ටික වෙලාවයි."

ඇඳ ඇතිරිලි තීරු එකිනෙක තදින් ගැට ගහන ගමන් මාර්ගරි කීවා ය. තීරු හතරක් එකිනෙකට ගැට ගැසූ පසු එයින් ඉතා දිගු ලනුවක් නිර්මාණය වී තිබිණි. මාර්ගරි දැන් සොයා බලන්නේ ඒ රෙදි ලනුව ගැට ගැසීම සඳහා සුදුසු ස්ථානයකි. ඒ නිමේෂයේදී ම කාමරයේ දොර මහ හඬක් නගමින් ගැලවී ගිය අතර ගිණි දළු කාමරයට විගසින් දුව ගෙන ආවේ ය. තවත් නම් ප්‍රමාද වීම නුවණට හුරු නැත.

"අනේ ඉක්මන් කරන්න..... ඉක්මන් කරන්න." එරිකා

බෙරිහන් දුන්නා ය. "මම බිමට පනින්න ද?"

"එපා...... ඒ වැඩේ කරන්න එපා..."

මාර්ගරි එරිකාගේ අතකින් අල්ලා ගත්තා ය.

"වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා මම ඔයා
බේර ගන්නවා. මේ බලන්න. මම රෙදි පටි එකතු කරල
කඹයක් හැදුවා. අපි දැන් මේ කඹේ කෙළවර මේ ඇඳේ ගැ
ගහමු. එන්න මේ ඇඳ ජනේලේ ළඟට අරගෙන යන්න ම
උදව් වෙන්න."

මාර්ගරි මුලින් ම ජනේලයේ පඩිය මතට ගොඩ වූ
ය. ඉන් පසු ව එරිකා ද පිටතට පැමිණියා ය. පහත පොළො
ගැහැණු ළමුන් සහ ගුරුවරියන් එක පොදියට උඩ බලා ගෙ
දෑස් මහත් කරගෙන සිටිති. සිදුවන්නේ කුමක්දැයි සිතන නිසාදෙ
ඔවුන්ට හුස්ම ගැනීමට ද අමතක වූවාක් මෙනි. මාර්ගරි
උදව් කිරීම සඳහා එක උයන් පල්ලෙක් ඉනිමඟ දිගේ උඩ
නැග සිටියි.

"මේ බලන්න එරිකා. මේ රෙදි කඹය දිගේ පහත
බහින්න පුළුවන් කියල ඔයාට හිතෙනවද? මේ බලන්න...
ඒක හරි ලේසි වැඩක්."

බියපත් දෑසින් බලා සිටින එරිකා දෙස බලමින් මාර්ග
ඇසුවා ය.

"නෑ.... මට බෑ...... මට බෑ."

එරිකා බියෙන් පසු බෑවා ය. ඒ නිසා මාර්ගරිට වෙනස්
උපක්‍රමයක් යොදා ගැනීමට සිදු වූ අතර ඇ යොදා ගත්තේ
ඉතා ම නුවණක්කාර උපක්‍රමයකි.



මාර්ගරි, එරිකා පිටේ එල්ලා ගත්තා ය. බියෙන් මුසපත් ව සිටින එරිකා ඉතා ම තදින් මාර්ගරිව බදා වැළඳගෙන සිටියි. ඒ අතර මාර්ගරි වහ වහා රෙදි කඹය දිගේ පහතට බසින්නට වූවා ය. ඇඳ ඇතිරිල්ල අළුත් එකකි. ඒ නිසා එයින් සාදා ගත් කඹය ඉතා ම ශක්තිමත් ය. දෙදෙනෙකුගේ බර දරා ගැනීමට හැකි වීම වාසනාවකි.

වරෙක පැද්දෙමින් ද, තවත් වරෙක ලිස්සා යමින් ද මාර්ගරි රෙදි කඹය දිගේ පහතට ම ආවා ය. එරිකාගේ බරත් දරාගෙන පහතට බඩ ගා යෑම කොතරම් අපහසු වුව ද අවසානයේදී ඇගේ උත්සාහය සාර්ථක වෙමින් ඉනිමඟ කෙළවරේ ඇගේ දෙපා ගැටිණි.

"නියමයි මිස් නියමයි. මම ඔයාව අල්ලා ගන්නම්."

ඉනිමඟ මුදුනේ සිටි උයන් පල්ලා ප්‍රීතියෙන් බෙරිහන් දුන්නේ ය. ඔහු අත දිගු කර එරිකා අල්ලා ගත්තේ ය. ඇය මේ වන විටත් බියෙන් වැළපෙමින් සිටියා ය. උයන්පල්ලා ගේ ආධාරයෙන් එරිකා ඉනිමඟ දිගේ පහතට බැස ගත්තා ය.

ඊළඟට සිදු වන්නේ කුමක්දැයි කාටවත් කිව නොහැකි ය. මෙතෙක් වෙලාවක් රෙදි කඹයේ එල්ලී සිටි මාර්ගරි ඉනිමඟට පා තබන්නට සූදානම් වූවා ය. එහෙත් අවාසනාවකි. ඉනිමඟට පා තබන්නට සූදානම් වෙත් ම මාර්ගරීගේ සමබරතාවය ගිළිහී ගියේ ය. ඇ ඉනිමඟ දිගේ පහතට රූරා යද්දී උයන්පල්ලා ඇගේ වැටීම වළක්වන්නට උත්සාහ කළ ද එයින් පලක් නොවී ය. මාර්ගරි අඩි හතක් හෝ අටක පමණ ඉහළ සිට පොළොවට ඇද වැටුණා ය.

පොළවේ සිට ඉහළ බලා සිටි මුහුණු පේළිය බිමට

වැටුණු මාර්ගරි වටා රොක් වෙන්නට එතරම් වෙලාවක් ගියේ නැත. විලාප හඬ, සුසුම් හඬ හැමකක් ම ඇයට ඇසේ. මාර්ගරි සිහි මද ගතියකින් මෙන් පොළොව මත වැතිර සිටින්නීය. ගුරුවරියන්ගේ අත්වලින් එසැ වී මාර්ගරි පාසලට රැගෙන යද්දී ගිණි නිවන යන්ත්‍රය පැමිණියේ ය. ජල නල ගිණි දැල් වෙතට එල්ල වෙයි. මිනිත්තුවකටත් අඩු කාලයකදි තමන්ගේ වියරු අඩු හකුලාගෙන නිහඬ වීමට ගිණි දළුවලට සිදු විය.

ගොඩනැගිල්ලේ උඩුමහල සම්පූර්ණයෙන් ම දැවී ගොසිනි. එරිකා සිටි කාමරය අළු වලින් සහ අඟුරු වලින් වැසී ගිය අපායක් මෙනි. මේ විනාශය දෙස මිස් තියෝබෝල්ඩ් බලා සිටියේ දුකින් කම්පිත වූ මුහුණින් යුතුවයි.

ගැහැණු ළමුන් සියලු දෙනාට ම නැවත වතාවක් නිදන ශාලාව වෙත යන ලෙස අණ ලැබිණි. මෙවර නම් ඔවුන් ඒ අණට අවනත වූ සෙයකි. ඒ රාත්‍රියේ ඔවුන් සැම දෙනාගේ ම තොල් පෙතිවල රැව් දුන්නේ එක ම නමකි. ඒ මාර්ගරි ය. ඇය පාසලේ එක ම වීරවරියයි.

"මාර්ගරි......... එයා ඇත්තට ම වීර කෙල්ලෙක් නෙවේද? එයා එරිකාගේ ජීවිතය බේරා ගත්තා. එයා පයිප්පේ දිගේ බඩ ගාපු හැටි මට නම් හිතාගන්නවත් බෑ. එයාට අනතුරක් වෙන්න එපා කියලා අපි දෙවියන්ට කියමු."

# රහස හෙළිවෙයි.

ඊළඟ දවසේ උදෑසනින් ම මුළු පාසල ම නින්දෙන් පිබිදුණෝ ය. ගැහැණු ළමයින් මෙන් ම ගුරුවරියන් ද මුලින් ම විපරම් කළේ මාර්ගරීට කුමක් සිදු වූවා ද කියා ය. අසරණ එරිකා ගැන මතක් වූයේත්, ඈ ගැන විපරම් කළේත් කිහිප දෙනෙකු පමණකි. එහෙත් මුළු පාසල ම මාර්ගරි ගැන අනුකම්පා කළහ.

"එයාගේ කකුළ කැඩිලා. පව් අහිංසක මාර්ගරි. එයාගේ ඔලුවත් රිදෙනවලු. හැබැයි ඒක තදබල අමාරුවක් නෙවෙයි. දැන් එයා මිස් තියෝබෝල්ඩ්ගේ කාමරේට එහා පැත්තේ තියෙන විවේක කාමරේ ඉන්නවා. ඔයාලා දන්නවද මිස් තියෝබෝල්ඩ් මාර්ගරි ගැන පුදුම විදිහට ආඩම්බර වෙනවා."

එක ගැහැණු ළමයෙක් මාර්ගරි ගැන අළුත් ආරංචියක් රැගෙන ආවා ය.

"ඒ ගැන පුදුම වෙන්න දෙයක් නෑ." එසේ කීවේ ජැනට් ය.

"මාර්ගරි පහු ගිය දවස්වල කරපු, කියපු කිසි ම

දෙයක් ගැන මම මීට පස්සේ හිතන්නේ නෑ. මම ඒ හැම දේ ම අමතක කරනවා."

"මාර්ගරි වගේ කෙනෙක් ඒ වගේ මෝඩ වැඩ කරයි කියලා මට නම් හිතන්න බෑ."

ලුසි ද කථා කරන්නට වූවා ය.

"ඇත්තට ම අපිටත් වැරදීමක්වත් වුණාද? ඒ වැඩේ වෙන කවුරු හරි කළා වෙන්න බැරිද? මොකද මාර්ගරි ඊයේ රෑ අපිට පෙන්නපු වීරකම්වල හැටියට ඒ වගේ දේවල් කවදාවත් එයා කරන්නේ නෑ කියලා මට සහතිකයි. ඔව්. ඒක කොහොමටවත් වෙන්න බැරි දෙයක්."

"අපි ඒක ඇත්තට ම දැන ගන්න ඕනෑ කියලා මම හිතනවා."

ඇලිසන් කීවේ දුකෙනි. මාර්ගරිගේ රහස හෙළි කළ නිසාදෝ ඇගේ සිතට කිසියම් වරදකාරී හැඟීමක් දැනේ. මාර්ගරි පාසල් කිහිපයකින් ම පිටමං කළ ළමයෙකු බව මුළු පාසල ම දැන ගත්තේ ඇලිසන් ඒ රහස හෙළි කළ නිසා ය.

එහෙත් වැඩි වෙලාවක් ගත වන්නට පෙර මේ සියලු දෙයට ම වග කිව යුත්තේ කවුදැ යි සොයා ගැනීමට ලුසීට හැකි විය. මේ වන විට එරිකා නිදන ශාලාවේ කෙළවර ම ඇති කුඩා කාමරයක සිටියා ය. ශරීරය වෙලා ගෙන ඇති උණ ගතිය පරදා කිසියම් දුක්බර බවක් සහ පසුතැවීමක් එරිකාගේ සිතට වද දෙයි. ගින්නෙන් පසු ව සිදු වූ දේ ඇගේ සිතට නැගේ. එරිකා එදින රාත්‍රිය පුරා ම නිදි නොලබා සියලු ම දේ ගැන කල්පනා කළා ය. එපමණක් ද නොවේ. ජීවිතය පරදුවට තබා තමා බේරා ගත් මාර්ගරි ගැන ද



එරිකා දිගින් දිගට ම කල්පනා කළා ය.

දැන් එරිකාට හරි වැටහීම ලැබී ඇත. තමා කළ නොපනත්කම් නිසා සැම දෙනාගේ ම අපවාදයට ලක් වූ, එමෙන් ම තමාගේ ජීවිතය බේරා ගත් නිර්භීත ගැහැණු ළමයා පිළිබඳ ව එරිකා දුකින් කල්පනා කළා ය. මේ දේවල් පිළිබඳ ව දිගින් දිගට ම කල්පනා කිරීමේදී එරිකාගේ සිත යකාගේ කම්මලක් සේ අවුල් විය.

උදේ වරුවේ පංති හමාර වීමෙන් පසු ව ලුසී ඈ බලන්නට පැමිණියා ය. එහෙත් මාර්ගරි බලන්නට නම් කිසිවෙකුටත් අවසර නැත. ඇයට දින ගණනක් යන තුරු විවේකී ව ගත කිරීමට අවස්ථාව ලබා දී තිබේ.

කිසිවෙකුත් එරිකා බලන්නට උනන්දු නොවූව ද කරුණාවන්ත හදවතක් ඇති ලුසී ඇය බලන්නට පැමිණියා ය. පුංචි කාමරයේ තනි ව ම නිදා සිටින එරිකා සමඟ කථා කිරීමට ඈ මුලින් ම මේට්‍රන්වරියගෙන් අවසර ලබා ගත්තා ය.

"ඔව් කමක් නෑ. අද උදේ වෙනකොට එයාගේ තත්ත්වය සාමාන්‍ය අතට හැරුණා. උණයි, කම්පනයයි ඇරෙන්න දැන් එයාට වෙන කිසිම අසනීපයක් නෑ. එයාව බලන්න ගියාට කමක් නෑ කියලා මට හිතෙනවා." මේට්‍රන් කීවා ය.

ඉන් පසු ව ලුසි, එරිකා නිදා සිටින පුංචි කාමරයට ගොස් ඈ අසල සිට ගත්තා ය. ඔවුන් දෙදෙනා ටික වෙලාවක් කථා කළහ. එරිකා මාර්ගරි ගැන විස්තර ඇසුව ද නිකමටවත් ලුසි දෙස නොබැලුවා ය. තමා කර ඇති වරද නිසා ඇගේ සිතට දැනෙන කම්පනය නිමක් නැත.

"ඒ අය ඔයාට මාර්ගරි ගැන කිව්වෙ නැද්ද?"

ලුසි, එරිකා දෙස පුදුමයෙන් බැලුවා ය.

"හරි ම අවාසනාවන්ත දෙයක් වෙලා තියෙන්නෙ. මාර්ගරිගේ කකුළක් කැඩිලා.. පව් අහිංසක කෙල්ල. එයාට සැහෙන කාලයක් යනකම් සෙල්ලම් කරන්නවත්, ව්‍යායාම කරන්නවත් බැරි වෙයි. මාර්ගරිගේ ඔලුවත් රිදෙනවලු. හැබැයි ඒක එච්චර අමාරුවක් නෑ. එරිකා, ඔයා දන්නවද මාර්ගරි කියන්නේ හැබෑ වීරවරියක්."

ලුසිගේ කථාව ඇසූ එරිකා පුදුමාකාර ලෙසට දුක් වූවා ය. මාර්ගරි ඉක්මනට සුව වෙනු ඇතැ යි ඈ කල්පනා කළා ය. කැඩුණු කකුළක් සහ රිදුම් දෙන හිසක් සහිත ව ඇඳක් මත වැතිර සිටින මාර්ගරිගේ රූපය ඇයට මැවී පෙනේ. පාසලට ම වීරවරියක් වූ මාර්ගරි ගැන මුළු පාසල ම කථා වෙන ආකාරය ද සිතුවමක් මෙන් එරිකාගේ සිතට ඇතුළු විය.

ඈ වහ වහා බිත්තිය පැත්තට මුහුණ හරවාගෙන ඊළඟට කර යුත්තේ කුමක් ද යි කල්පනා කරන්නට වූවා ය. ඇගේ පෙනුම ශෝකාකුල ය. ලුසී, එරිකාට එතරම් කැමැති නොවුණත් ඇගේ මුහුණේ ඇති ශෝකාකුල පෙනුම ගැන විමසිලිමත් වූවා ය.

ලුසී, එරිකාගේ අතකින් අල්ලා ගත්තා ය. "කකුළට ප්ලාස්ටරයක් දමලයි තියෙන්නේ. ඒක ඉක්මනට ම හොඳ වෙයි. ඇත්තට ම අපි හැම දෙනා ම මාර්ගරි ගැන ගොඩාක් ආඩම්බර වෙනවා."

"ඇත්තට ම අර නපුරු දේවල් කෙරුවේ මාර්ගරි කියලා ඔයා තාමත් හිතනවද?"

එරිකා, ලුසී දෙස නොබලමින් ම ඇසුවා ය.



"නෑ..... මට නම් හිතෙන්නෙ නෑ."

ලුසී එක් වර ම කීවා ය.

"ඒ වගේ මෝඩ, අසමජ්ජාති වැඩ මාර්ගරි කවදාවත් කරන්නේ නෑ. ඒක නම් මට සහතිකයි. හැබැයි එයාගේ දුර්වලකම් ගොඩක් තියෙනවා. සමහර ඒවා ගොඩාක් නරක ඒවා. ඒ වුණාට පැට්ට කළා වගේ නපුරු දේවල් නම් එයා කරන්නේ නෑ."

මේට්‍රන්වරිය දොරෙන් ඇතුළට එබී බැලුවේ ඒ වෙලාවේදී ය.

"ලුසී, දැන් ම ම එන්න. ඔයාට දුන්නු විනාඩි දහය ඉවරයි."

"අනේ.... දැන් ම ම යන්න එපා. යන්න එපා."

එරිකා, ලුසිගේ අත අල්ලා ගන්නා ගමන් කීවා ය. සිතේ තෙරපෙන වේදනාව ලුසි ඉදිරියේ දිග හරින්නට එරිකාට අවශ්‍ය වූව ද ලුසී කාමරයෙන් එළියට යන්නට ගියා ය.

දැන් එරිකාගේ සිතට භයානක තනිකමක් දැනෙයි. සිතේ තෙරපෙන දහසකුත් එකක් දේවල් කාට හෝ කියාගත යුතු ය. එහෙත් ඈ දැන් හිඳින්නේ තනි ව ම යි.

ඈ නැවත වතාවක් බිත්තිය පැත්තට හැරුණා ය. ඈ රාත්‍රියට හෝ කිසිදු අහරක් ගත්තේ නැත. මේට්‍රන්වරිය පැමිණ ඇගේ ශරීර උෂ්ණත්වය බැලුව ද එය සාමාන්‍ය තත්වයට පත් ව තිබිණි.

"ඔයා මොනව හරි දේකට කණගාටුවෙන් ද ඉන්නේ?"

මෙට්‍රන්වරිය එසේ අසද්දී එරිකාගේ දෑස කඳුළෙන් බොඳ වී ගියේ ය. ඒ කරුණාවන්ත වචන ඇයට දරාගත නොහැකිවාක් මෙනි.

"ඔව්..... මගේ හිතට මහා විශාල කණගාටුවක් දැනෙනවා. මට ඒක දරාගන්න බෑ."

එරිකා ශෝකාකුල හඬකින් කීවා ය.

"මට ඒ ගැන කියන්න එරිකා."

මෙට්‍රන්වරිය කරුණාවන්ත හඬකින් කීව ද එරිකා ඒ අදහසට කැමති වූයේ නැත. ඈ නැවත වතාවක් බිත්තිය පැත්තට මුහුණ හරවා ගත්තා ය. තමාගේ සිතේ තෙරපෙන වේදනාව වෙන අයෙකුට පැවසීමට එරිකාට අවශ්‍ය ව තිබේ. මෙට්‍රන්වරිය කාමරයෙන් පිට ව යාමට හැරෙද්දී එරිකා නැවත ඇයට කථා කළේ ඒ නිසා ය.

"මෙට්‍රන්..... මට ලූසී හම්බ වෙන්න ඕනැ."

"ඒක කරන්නේ කොහොමද ළමයෝ? මේ වෙලාවේ ලූසී ඉන්නේ පංතියෙනේ. ඔයා කැමැති නම් තේ වෙලාවට එයාට එන්න පුළුවන් වෙයි ඔයාව බලන්න."

මෙට්‍රන් කීවා ය. ඒ සමඟ ම එරිකා මහ හඬින් වැළපෙන්නට වූවා ය. දෙකම්මුල් දිගේ කඳුළු වැල් පෙරමින් වැළපෙන එරිකා දුටු මෙට්‍රන්වරියට දුක සිතිණි.

"මොකක්ද ඔයාට වෙලා තියෙන්නේ?"

"අනේ මෙට්‍රන්. ලූසීට එන්න කියන්න. අනේ ලූසීට එන්න කියන්න."



එරිකා කඳුළු සලමින් ම මෙට්‍රන්වරියට ආයාචනා කළා ය. එරිකාගේ දුක් ගැනවිල්ල නිසා හිත උණු වූ මෙට්‍රන්වරිය කාමරයෙන් පිටතට පැමිණ ලූසී කැඳවාගෙන ඒම සඳහා අයෙකු පිටත් කර හැරියා ය. එරිකාගේ මුහුණ ශෝක වළාකුළුවලින් වැසිලා ය. තමාගේ හිතේ තෙරපෙන වේදනාව කිසිවෙකුට හෝ පැවසීමට එරිකාට ඇවැසි ව තිබේ. ඒ සඳහා සුදුසු ම කෙනා ලූසී ය.

එරිකාගේ පණිවුඩය ලද ලූසී ආපසු ආවේ පුදුමයෙනි.

"එරිකාගේ හිතේ මොකක්දෝ වේදනාවක් තියෙනවා ලූසී. ඒක මොකක්ද කියලා දැන ගන්න පුළුවන් ඔයාට විතරයි."

ලූසී දුටු සැනින් මෙට්‍රන්වරිය කීවා ය.

"එරිකාගේ ශරීර උෂ්ණත්වයත් වැඩි වෙලා. එයා මේ විදිහට හිටියොත් ඇත්තට ම අසනීප වෙයි."

පුංචි කාමරය තුළට ගිය ලූසී, එරිකාගේ ඇඳ මත වාඩි වූවා ය. එතැනින් ම එරිකාගේ හැඬීම නතර විය. හැඬීම නිසා දෝ ඇගේ මුහුණ සුදුමැලි ව, ඉදිමී තිබිණි. එරිකා කඳුළින් බොඳ වූ දෙනෙතින් යුතු ව ලූසී දෙස බැලුවා ය.

"ඇයි එරිකා? මොකක් ද ඔයාට තියෙන ගැටලුව.?"

ලූසී ඇසුවා ය. ඇගේ කරුණාවන්ත කුඩා මුහුණේ මිත්‍රශීලී හැඟීම් දහරාවක් ගලා යයි.

"ලූසී..... මට ඔයාට කියන්න වැදගත් දෙයක් තියෙනවා. ඒ දේවල් කිව්වේ නැතිනම් මට පිස්සු හැදෙයි."

එරිකා ශෝකාකුල හඬකින් තෙපළුවා ය.

"ඔයා දන්නවද ලුසී? පැට්ට කරපු හැම නපුරුකමක් ම කෙරුවේ මම. ඒ දේවල් කෙරුවේ මාර්ගරි නෙවෙයි. මම."

"දෙවියනි එරිකා......"

ලුසී තෙපළුවේ කම්පනය වූ හඬකිනි.

"අනේ පව් අහිංසක මාර්ගරි."

එරිකා කිසිවක් නොකීවා ය. ඇය නැවත වතාවක් බිත්තිය පැත්තට හැරුණා ය. ඇය සම්පූර්ණයෙන් ම අසනීප වී ඇති සෙයකි.

ලුසී ද ඒ ආකාරයෙන් ම ටික වෙලාවක් වාඩි වී සිටියා ය. එරිකා කියූ අරුම පුදුම රහස පිළිබඳ කම්පනය ඇගේ සිතට කිසියම් කම්පනයක් ඇති කරන්නට සමත් ව ඇති සෙයකි. ටික වෙලාවකට පසු ව ඈ එරිකාගේ සීතල අතක් අල්ලා ගත්තා ය. අසරණ ගැහැණු ළමයාට අනුකම්පා කළ යුතු ය යි ඇයට සිතේ. එමෙන් ම නොකළ වරදකට දඬුවම් විඳි මාර්ගරි පිළිබඳ ව ලුසීගේ සිතේ තිබෙන්නේ කියා නිම කළ නොහැකි සංතාපයකි.

"එරිකා...... ඔයා මේ කථාව මට කියපු එක ගැන මම ගොඩාක් සන්තෝෂ වෙනවා. මේ කතාව මම අනිත් අයටත් කියනවා. ඔයා දැනගෙන හිටියා. එහෙම නේද? මේ නපුරු දේවල් මාර්ගරි ඇත්තට ම කළා ද කියලා අපි නිකමටවත් හිතුවේ නෑ. ඒ විතරක් නෙවෙයි අපි මාර්ගරිට ගොඩාක් අකාරුණික විදිහටත් සැලකුවා. ඒ නිසා ම මේ කතාව අනිත් අයට කියන්න මට සිද්ධ වෙනවා. ඔයාට තේරෙනව නේද එරිකා.?"



"ඔයා එහෙම දෙයක් කරනවද ලුසී....?"

එරිකාගේ දෑස නැවත වතාවක් කඳුළු බිඳුවලින් වැසී ගියේ ය.

"ඔයා ඒ වගේ දෙයක් කෙරුවොත් මම කොහොම ද ඉස්කෝලේ ළමයින්ට මුහුණ දෙන්නේ."

"මම දන්නේ නෑ එරිකා."

ලුසී කීවා ය.

"ඒක ඔයා ම තීරණය කරන්න. ඇත්තට ම ඔයා කරල තියෙන්නේ හරි ම නරක වැඩක්. ඇත්තට ම ඇයි ඔයා මේ ගැන මිස් තියෝබෝල්ඩ්ට කියන්නේ නැත්තේ? දැන් ඔයා ම මේ කාරණාව කිව්වා. මිස් තියෝබෝල්ඩ් මේ කථාව ඇහුව ම මොනාව කියයි ද කියලා බලන්න ඔයා කැමති නැද්ද?"

"නෑ......මම එයාට මේ කථාව කියන්න කැමති නෑ."

එරිකා බියෙන් තෙපළුවා ය. ඇයට මිස් තියෝබෝල්ඩ්ගේ නීති ගරුක මුහුණ සිහිපත් වෙයි.

"ලුසී..... ඔයා මේ කථාව මිස් තියෝබෝල්ඩ්ට කියන්න. අනේ ලුසී...... මම මේ ඉස්කෝලෙන් අයින් වෙන්න ඕනෑ. මම හරි ම නරක දෙයක් කෙරුවේ. කිසි ම කෙනෙක් මට කැමති නෑ මේ කථාව ඇහුවට පස්සේ කවදාවත් ම. කවුරුවත් ම මට කැමති නැති තැනක මට ඉන්න පුළුවන්කමක් නෑ. ඔයාට තේරෙනව නේද ලුසී?"

එරිකාගේ කථාව අඳෝනාවක් මෙනි.

"මට තේරෙනවා."



Scanned with CamScanner

ලූසී බැරෑරුම් හඬකින් කීවා ය.

"ඒ වුණාට කවද හරි දවසක මේ වගේ දේවල් වලින් පාඩමක් ඉගෙන ගන්න ඔයාට සිද්ධ වෙනවා.. තේරුණාද එරිකා.? මේ වගේ නපුරු දේවල් කෙරුවොත් හැමදාම ඔයාට දුක්වෙන්න වෙනවා. කවදාවත් ම සතුටක් ලැබෙන්නේ නෑ. කමක් නෑ. මම ගිහිල්ලා මිස් තියෝබෝල්ඩ් හම්බ වෙන්නම්. හැබැයි. මේ දේවල් ගැන වැඩිපුර දුක් වෙන්න එපා. අනික ඔයා කරපු වරද පිළි අරගෙන ඒ දේවල් මට කියන්න තරම් ඔයා අවංක වුණ එක ගැන මම ආඩම්බර වෙනවා."

එරිකාට සිතන්නට බොහෝ දේවල් ඉතිරි කර ඉන් පසු ව ඇ කෙළින් ම ගියේ මේට්‍රන්වරිය හමුවීම සඳහා ය.

"මේට්‍රන්.... එරිකා දුක් වෙන්නේ ඇයි කියලා මට කිව්වා. හැබැයි ඒක මිස් තියෝබෝල්ඩ්ට කියන්න තරම් වැදගත් දෙයක්. මම දැන් ම ම යන්නද?"

"ඔව් කමක් නෑ. දැන් ම ම යන්න. මම ඒ ගැන මිස් රොබට්ට දැන් ම ම දන්වන්නම්."

මේට්‍රන්වරිය සිනා වෙමින් ම කීවා ය. ශාන්ත ක්ලෙයාර් බාලිකා විද්‍යාලයට මෙතෙක් පැමිණි ප්‍රියමනාප සහ දක්ෂ ම ළමයා ලූසී ය. ඒ නිසා සැම දෙනා ම ඇයට ඉතාමත් කැමති ය.

ඉන් පසු ව එරිකාගේ භයානක රහසත් රැගෙන එරිකා මිස් තියෝබෝල්ඩ් හමුවීමට ගියා ය. ලූසීගේ ප්‍රිය මනාප, මිහිරි කටහඬින් සියලු දේ හෙළි වෙද්දී විදුහල්පතිනිය බැරෑරුම් මුහුණක් මවා ගනිමින් ඒ කථාවට සාවධාන ව සවන් දුන්නා ය. ඇ ලූසීගේ කථාවට කිසිදු බාධාවක් කළේ නැත.



"දෙවියනි........ මාර්ගරි ගැන හැම දෙනා ම වැරදියට හිතුවා, අහිංසක කෙල්ල. එයා නම් හරි ම අවාසනාවන්ත ළමයෙක්. හැබැයි එයා ඊයේ රෑ කාටවත් හිතා ගන්න බැරි තරම් වීරකමක් කළා. එයා මොන තරම් නිර්භීත කෙල්ලෙක් ද? මාර්ගරිගේ ජීවිතයේ පැති දෙකක් තියෙනවා. ඊයේ රෑ අපි හැමෝ ම දැක්කේ එයාගේ ජීවිතේ ශක්තිමත් පැත්තයි."

"මිස් තියෝබෝල්ඩ්..... මාර්ගරි ඉස්කෝල කිහිපයකින් ම අයින් කරපු ළමයෙක් කියලත් අපි දන්නවා."

විදුහල්පතිනිය දෙස කෙළින් ම බලමින් ලූසී කීවා ය.

"හැබැයි මාර්ගරිට හැදෙන්න අවස්ථාවක් අපේ ඉස්කෝලෙන් ලැබෙයි කියලත් මම විශ්වාස කරනවා. මම මේ ඉස්කෝලෙට අලුත් ළමයෙක්. ඒ වුණාට යම් යම් දුර්වලකම් තියෙන ළමයින් මේ ඉස්කෝලෙදි හරි මාර්ගයේ යන හැටි මට පෙනෙනවා. අන්න ඒක තමයි ශාන්ත ක්ලෙයාර් ඉස්කෝලේ තියෙන විශේෂත්වය. මම මේ ඉස්කෝලෙට හරි ම ආදරෙයි. ඇත්තට ම මගේ දෙමව්පියෝ මාව මේ ඉස්කෝලෙට එවන්න තීරණය කරපු එක ගැන මම හරියට ආඩම්බර වෙනවා."

මිස් තියෝබෝල්ඩ් ලූසීගේ අවංක සහ කීකරු, ප්‍රියමනාප මුහුණ දෙස සතුටු සිතින් බලා සිටියා ය. ඉන් පසු ව ඇ සුන්දර සිනාවක් ලූසී දෙසට විසි කළා ය.

"ඒ විතරක් ද? ඔයාලගේ දෙමාපියන් ඔයාව මේ ඉස්කෝලෙට එවපු එක ගැන මමත් ආඩම්බර වෙනවා. ඔයා වගේ ගැහැණු ළමයෙක් ඕනෑ ම ඉස්කෝලෙකට ආභරණයක්. ඒ වගේ ම ආඩම්බරයට හේතුවක්. ඔයාට තේරුණාද ලූසී."

ලූසීගේ හිතට අභිමානයක් මෙන් ම කිසියම්

ආඩම්බරයක් ද දැනේ. විදුහල්පතිනිය තමා පැසසීම පිළිබඳ ව ලූසීට දැඩි සතුටක් දැනේ. තවත් ටික වෙලාවකට පසු ව ඔවුන් මෙතෙක් වෙලාවක් කථා කරමින් සිටි මාතෘකාවට නැවතත් අවතීර්ණ වූහ.

"එතකොට මාර්ගරිට මොකද කරන්නේ? ලූසී ඔයා දැන් ම ම ගිහින් මාර්ගරි හම්බ වෙන්න. ඊට පස්සේ මේ හැම දෙයක් ම එයාට කියන්න. ඔයාලා හැම දෙනා ම එයා ගැන වැරදියට හිතාගෙන හිටියා කියලා දැනගත්ත ම එයාට පුදුම හිතෙයි. අනික එරිකා ඒ හැම දෙයක් ම කළා කියලා දැන ගත්ත ම මාර්ගරිට මොන තරම් පුදුම හිතෙයි ද? හැබැයි එරිකට නම් විශාල අකරතැබ්බක් වෙන එක නම් වළක්වන්න බෑ."

"මේ සිද්ධියෙන් පස්සේ මාර්ගරිගේ ලොකු වෙනසක් වෙයි කියලා මට හිතෙනවා. දැන් හැම දෙනාට ම එයා වීරවරියක්. ඉක්මනට තරහා යන, නපුරු මාර්ගරි ගැන කාටවත් මතක නෑ. මේක නම් මාර්ගරිගේ හොඳ ම හොඳ වෙලාවක්."

ලූසී එසේ කියද්දී ඇගේ ප්‍රිය මනාප දෑස ප්‍රීතියෙන් දිළිසෙමින් තිබිණි.

"ඔව්..... දැන් එයාට හොඳ කාලයක් ලබයි කියලා මටත් හිතෙනවා."

විදුහල්පතිනිය ද එසේ කීවා ය.

"ඔයා දන්නවද ලූසී? මාර්ගරිගේ ගෙදර තත්වය වුණත් එච්චර සතුටුදායක නෑ. ඒක සාමාන්‍ය ගෙදරක් නෙවෙයි. ඒ දේවලුත් මාර්ගරිගේ හැසිරීමට බලපාලා තියෙනවා කියලා මම දන්නවා. මම ඒ ගැන වැඩි විස්තර කියන්න සතුටු නෑ.



ඒ වුණාට ඒ ගැනත් හිතන්න ලූසී. එතකොට දැන් එරිකට මොකද වෙන්නේ?"

විදුහල්පතිනිය ලූසී දෙස බැරෑරුම් ලෙස බලා සිටියා ය. ඇය තමාගේ අදහස් ගැන විමසීම පිළිබඳ ව ලූසීගේ හිතට කිසියම් අභිමානයක් ද ඇති වෙයි.

"මිස් තියෝබෝල්ඩ්. එරිකාට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ හරි ම දුක හිතෙන දේකට. ඔයා දන්නවනේ එයා හරි ම දුර්වල ළමයෙක්. මේ සිද්ධිය දැන ගත්තට පස්සේ ගැහැණු ළමයින්ගෙන් එල්ල වන චෝදනා විඳ දරා ගන්න එරිකාට බෑ. එයා උත්සාහ කෙරුවත් ඒ දේ කරන්න බෑ කියලා මම දන්නවා. ඉතින් මම හිතන විදිහට එයාට කරන්න පුළුවන් හොඳ ම දේ තමයි, වෙන ඉස්කෝලෙකට ගිහින් හැම දේ ම අලුතින් පටන් ගන්න එක. එරිකව ඉස්කෝලෙන් අයින් කරන්න කියල නෙවෙයි මම කියන්නේ මිස් තියෝබෝල්ඩ්. ඒ වුණාට එයා ඉස්කෝලෙන් අයින් වෙන්න කැමතියි."

"ඔව් සත්තකින් ම....."

මුල් ගුරුතුමිය බැරෑරුම් හඬකින් කීවා ය.

"මේ හැම දෙයක් ම එරිකගේ අම්මට තේරුම් කරලා දෙන්න මට පුළුවන්. ඔයා දන්නවද? එරිකට තාත්තා කෙනෙක් නෑ. මේ වාරේ මැද්දී ම ඉස්කෝලෙන් අයින් වෙලා ගිහිං එයාට අළුත් ඉස්කෝලෙකට යන්න පුළුවන්. පව්..... අහිංසක එරිකා.... හැබැයි එයාට හොඳ අනාගතයක් තියෙනවා කියල මට සහතිකයි."

ලූසී විදුහල්පතිනියගේ කාමරයෙන් පිට ව ආවේ ඉතා ම සැහැල්ලු සිතිනි. ඕනෑ ම අයෙකු කරුණාවන්ත සහ

නුවණක්කාර වුවහොත් මෙවැනි බැඳීරුම් ගැටලු පහසුවෙන් නිරාකරණය කරගත හැකි බව ඇය හොඳාකාර ව ම තේරුම් ගත්තා ය. දැන් එළැඹ තිබෙන්නේ තේ වෙලාවයි. ලූසී කෑම කාමරයට පිය නැඟුවේ දරාගත නොහැකි තරමේ බඩගින්නක් ද සමගිනි.

"ලූසී...... ඔයා කොහෙද ගියේ....?"

ඇය දුටු සැනින් කට හඬවල් රැසකින් ම ඒ හඬ ඇසිණි.

"අද ඔයාට චිත්‍ර පාඩමත් බැරි වුණා. ඔයා ඒකට කොච්චර ආසද?"

"ඇත්ත ම තමයි. මට ඒක අමතක ම වුණා."

ලූසී කීවේ ශෝකයෙනි.

"ඒ වුණාට ලූසී ඔයා කොහෙද ගියේ? ඔයා මොනවද කෙරුවේ? අපිට කියනවද ඒක? ඔයාගේ පෙනුමේ හැටියට නම් ඒක ගොඩක් වැදගත් කාරණාවක්."

පැට් ද කථාවට එකතු වූවා ය.

"ඇත්ත ම කියනවා නම් ගොඩක් පුදුම හිතෙන දෙයක් මට දැනගන්න ලැබුණා."

පාන් පෙත්තක බටර් සහ ජෑම් තවරමින් ලූසී කීවා ය.

"තේ බිව්වට පස්සේ විවේක කාමරේට එන්නකෝ. එතකොට මම හැම දෙයක් ම ඔයාලට කියන්නම්කෝ. දැන් නම් මට කථා කර ගන්න බැරි තරම් බඩගිනියි."



# මාර්ගරී නිදොස් වෙයි.

**තේ** පානයෙන් පසු ව පළමු සහ දෙවැනි වාරවල සිසුවියන් සැම දෙනා ම ඔවුන්ගේ විවේක කාමරයට එක් වූහ. ලූසී කියන්නට සූදානම් වෙන රහස දැන ගැනීමට ඔවුන්ගේ සිත් තුළ තිබෙන්නේ දැඩි ඕනෑකමකි. එය ඉතා ම වැදගත් කාරණාවක් වෙන බවට කිසිදු සැකයක් ඔවුන්ට නැත.

ලූසී මේසයක් මත වාඩි වූවා ය. ඉන් පසු ව ඈ තමාගේ පැහැදිලි හා සන්සුන් ස්වරයෙන් සිදු වූ හැම දෙයක් ම සිය යෙහෙළියන්ට විස්තර කරන්නට වූවා ය. ඇගේ කතාව අතරතුර විවිධාකාර බාධා කිරීම් රැසකි. පැට්ගේ ගෙතූ ඇඳුම මෙන් ම, ක්ෂේත්‍ර සටහන් පොත ද විනාශ කළේ එරිකා බව දැනගත් විගස ගැහැණු ළමයින්ගේ කෝපය තව තවත් වැඩි වූවා සේ ය.

"නපුරි....... විශ්වාස කරන්න බැරි නපුරි."

"මට එයාව අහුවුණොත් ඔලුවේ තියෙන හැම කොණ්ඩ ගහක් ම ගළවනවා. මම අහිංසක මාර්ගරිට බැන්නේ හරියට ඊරියක් වගේ."

ඉස්කෝලෙ ම ගිනි තිබ්බු විනාශකාරී කෙල්ල.

"ආ.... ඉස්කෝලෙ ම ඉන්න තාක් කල් ඔය කෙල්ල එක්ක කථා මම මේ ඉස්කෝලේ ඉන්න තාක් කල් ඔය කෙල්ල එක්ක කථා කරන්නේ නම් නෑ."

"එයා පංතියට එනකම් අපි ටිකක් ඉවසමුකෝ. මම එයාට අමතක නොවෙන පාඩමක් උගන්වනවා. ඒ මෝඩ කෙල්ලව බේරන්න ගිහිං මාර්ගරි කකුළක් කඩා ගත්තා. ඒක තමයි මට තියෙන එක ම වේදනාව."

"දැන් මම කියන දේ අහන්නකෝ."

ගැහැණු ළමයින්ගේ ඇනුම් බැනුම් සහ කෑකෝ ගැසීම වළක්වන්නට උත්සාහ කරමින් ම ලූසී කථා කරන්නට වූවා ය.

"මේ අහන්නකෝ...... මට තව දෙයක් කියන්න තියෙනවා."

නැවතත් සියලු දෙනා ම නිහඬ වුණා. එරිකා පාසලෙන් අස් වෙන බවත්, ඇය අලුත් පාසලකට ගොස් ඉගෙන ගැනීම නැවතත් ආරම්භ කිරීමට සිතා සිටින බවත් ලූසී සියලු දෙනාට ම පැහැදිලි කළා ය.

"එයා හොඳ පාඩමක් ඉගෙන ගත්තා. ඒ වගේ ම ඉදිරියේදී මේ වගේ මෝඩ වැඩ එයා කරන්නේ නැති වෙයි කියලා අපිට හිතන්න පුළුවන්."

ලූසී කථාව අවසන් කරමින් ම කීවා ය.

"මිස් තියෝබෝල්ඩ් ආයේමත් පන්තියට එන්න දුන්න නම් තමයි එයා ජීවිතේට ම අමතක නොවෙන පාඩමක් ඉගෙන ගන්නේ."

ජැනට්ගේ කට හඬ කෝපයෙන් පිරී ගොසිනි.



"ඔව්.... හැබැයි එරිකා පාඩමක් ඉගෙන ගත්තේ වැරදි විදිහටයි. එයා තමන්ගේ ජීවිතය ගැන පුදුමාකාර විදිහට බය වුණා. ඒ වගේ ම කරපු වැරදි ගැන හොඳට ම පසු තැවෙනවා. අවංක ව ම කියනව නම් කෙනෙක් කණගාටුවෙන් බයෙන් ඉන්නව නම් එයාට කවදාවත් ම හොඳ විදිහට හැසිරෙන්න අමාරුයි."

ලූසී එසේ කීවේ දැනමුත්තියක ලෙසිනි. ලූසී හැම දේ ම ගැන හිතන්නේ ගොඩක් නුවණක්කාර විදිහට. ඇත්තට ම ඔයා හරි ලූසී. ඔයා ගොඩාක් ඥාණවන්ත කෙල්ලක්.

පැට්, ලූසී උණුසුම් ලෙස වැළඳ ගන්නා ගමන් ම කීවා ය.

ඉන් පසු ව දවස් කිහිපයේ දී කිසිවෙකුටවත් එරිකා දැකගත නොහැකි විය. එමෙන් ම ලූසී හැරෙන්නට වෙන කිසිවෙකුත් ඇයට ආයුබෝවන් කියන්නට නොගියා ය. උණ රෝගයෙන් සුවය ලැබීමෙන් පසු ව ද එරිකාගේ මුහුණ සුදුමැලි ව, අසතුටෙන් පිරී තිබිණි.

"එරිකා සිද්ධ වුණ හැම දේ ම අමතක කරන්න. හැබැයි මේ හැම දේ ම ඔයාගේ අම්මට කියන්නත් අමතක කරන්න එපා. අලුත් ඉස්කෝලෙට ගියා ම ඔයාට හැම දේ ම අලුතෙන් පටන් ගන්න පුළුවන්. අලුත් ඉස්කෝලේ කොහොමද කියලා මට ලියල එවන්නත් අමතක කරන්න එපා හොඳද?"

එරිකාට ආයුබෝවන් කියන්නට ගිය ලූසී එසේ කීවා ය.

අසරණ එරිකා ශාන්ත ක්ලෙයාර් පාසලෙන් නික්ම ගියා ය. ඇය වෙනත් පාසලකට ගොස් නැවතත් අධ්‍යාපනය ලබනු ඇත. ඇඳුම් බෑගය ටැක්සියක පටවාගෙන පාසලෙන් නික්ම යන එරිකාට අත් වනා සුබ පතන්නට හෝ කිසිවෙකුවත්

ඉදිරිපත් වූයේ නැත. තමන් කළ වැරැද්දට ඇය ඇති තරම් දඬුවම් විඳ ගත්තා ය.

"දැන් මාර්ගරීට කොහොමද?"

දිනකට දහ දොළොස් වතාවක් ගැහැණු ළමුන් මෙට්‍රන්වරියගෙන් ඒ පැනය ඇසූහ. බැරි ම තැන ඇය පුංචි තුණ්ඩුවක් ලියා මාර්ගරීගේ කාමරයේ දොරේ සවි කළා ය.

"මාර්ගරී ඉක්මනින් ම සුව වෙනවා."

ඒ දැන්වීමේ සඳහන් ව තිබුණේ එවැන්නකි.

"දෙයියනේ...... ඒක රාජකීය වැඩක්නේ."

දොරේ සවි කර ඇති දැන්වීම දුටු ජැනට් සිනාසෙමින් කීවා ය.

"ඔයාලා දන්නවද එක රජ කෙනෙක් අසනීප වුණාට පස්සෙත් රජ ගෙදර ගේට්ටුවේ මේ වගේ දැන්වීමක් සවි කෙරුවා."

ටික දිනකට පසු ව මාර්ගරීව මුලින් ම දැක බලා ගැනීමේ අවසරය ලූසීට හා පැට්ට ලැබිණි. ඔවුහු මල් පොකුරක් සහ මිදි පොකුරු කිහිපයක් ද රැගෙන මාර්ගරී සිටි කාමරයට ඇතුළු වූහ. දීප්තිමත් ව දැල්වෙන ගිණි උදුනින් කාමරය ආලෝකමත් ව තිබිණි.

"හලෝ..... දැන් කොහොමද අපේ වීර කෙල්ලගේ තොරතුරු?"

පැට් මල් පොකුර මාර්ගරීට පිරි නමන ගමන් ඇසුවා ය.

"මෝඩයෙක් වෙන්න එපා."



මාර්ගරී නොසන්සුන් ව කීවා ය.

"මේ මොන පුදුමයක් ද? මේ දම් පාට ලොකු මිදිවලට මම ගොඩක් කැමතියි කියලා ඔයාලා කොහොමද දැනගත්තේ?"

"මේක ඉසබෙල් ඔයාට දුන්නා."

පැට් හරස්පද ප්‍රෙහේලිකා කට්ටලයක් මාර්ගරීට දුන්නා ය.

"එතකොට මේක ජැනට් දුන්නා. ඔයා දන්නවද මාර්ගරී. ළමයි හැම දෙනා ම ඔයාට තෑගි එව්වා. ඒ වුණාට මෙට්‍රන් ඒවා ගේන්න දුන්නෙ නෑ."

මාර්ගරීගේ හිත ප්‍රීතියෙන් පිරේ. ඉසබෙල් ඇයට දුන් ප්‍රහේළිකා කට්ටලය දෙසත් ජැනට් එවා තිබූ පොත දෙසත් ඇය බලා සිටියේ ප්‍රීතියෙනි. මේ අපූරු දේවල් අතරේ තම පාදයේ වේදනාව පවා ඇයට අමතක වූවාක් මෙනි."

"කොහොමද එරිකට?"

මාර්ගරීගේ පැනයට පිළිතුරු දුන්නේ ලූසී ය.

"එයා ඉස්කෝලෙන් අයින් වුණා. එරිකා ආයේ කවදාවත් සෙන්ට් ක්ලෙයාර් එකට එන්නේ නැති වෙයි."

"එරිකා ඉස්කෝලෙන් අයින් වුණා! ඇයි එයාට සනීප නැද්ද?"

මාර්ගරීගේ දෑස් පුදුමයෙන් මහත් වෙයි.

"නෑ.... එරිකා ඉස්කෝලෙන් අයින් වුණේ ඒ නිසා නෙවෙයි. එයාට ඉස්කෝලෙට මුහුණ දෙන්න බෑ. පැට් ගොතපු ඇඳුම විනාශ කළේ, පැට්ගේ පොත ඉරලා දම්මේ කවුද කියලා දැන් හැමෝ ම දන්නවා."

මාර්ගරි පුදුමයෙන් මහත් වූ දෑස ලූසී දෙසට යොමු කළා ය.

"ඒ දේවල් කෙරුවේ මම කියලනේ ඔයාලා කිව්වේ. ඇත්තට ම ඒ දේවල් කරලා තියෙන්නේ එරිකද? කොහොමද ඔයාලා ඒක හොයා ගත්තේ.?"

ටික වෙලාවකට පසු ව ලූසී නැවතත් කථා කරන්නට වූවා ය.

"අපි හරියට හොයල බලන්නේ නැති ව ඔයාගේ හිත රිදෙව්වා. මාර්ගරි ඒකට අපිට සමාවෙන්න. කරුණාකරල අපිට සමාව දෙන්න මාර්ගරි. ඒ හැම දෙයක්ම අපිට දැනගන්න ලැබුණේ ගොඩක් පරක්කු වෙලා."

මාර්ගරිගේ දෙනෙතට කඳුළු පිරුණේ ඉබේට ම ය. දෙකම්මුල් දිගේ පහතට ගලා එන්නට අමතක වූ විශාල කඳුළු බිඳු දෙකක් ඇගේ දෑසෙහි දිළිසෙයි. කිව යුත්තේ කුමක්ද යි සිතාගත නොහැකි ව මාර්ගරි ටික වෙලාවක් නිහඬ ව බලා සිටියා ය. ඈ කථා කළේ සෑහෙන වෙලාවකට පසුවයි.

"ඒ වගේ ජරා වැඩ මම කවදාවත් ම කරන්නේ නෑ. ඔයාලා තිකමටවත් ඒ ගැන හිතුවේ නැති එක ගැන මට පුදුමයි. ඔයාලා මට බොරුවට චෝදනා කළාට පස්සේ මට හරියට දුක හිතුණා."

සෑහෙන වෙලාවකට පසු ව මාර්ගරි කථා කරන්නට වූවා ය.

"නපුරුකමයි, අකීකරු කමයි හින්දා ඉස්කෝල හයකින් ම මාව අයින් කරපු කථාව නම් සම්පූර්ණ ඇත්ත. ඔයාලා දන්නව ද? අපේ ගෙදර කිසි ම කෙනෙක් මං ගැන සැලකිලිමත් වෙන්නේ නෑ. ඇත්ත ම කියනව නම් මම නපුරු අකීකරු



ළමයෙක් වුණේ ඒ නිසයි."

"ඔයා කැමති නැතිනම් ඒ කථාව අපට කියන්න එපා. හැබැයි ඒකෙන් ඔයාට ප්‍රයෝජනයක් වෙනව නම් අපිට කියන්න. අපිට ඔයාව හොඳට තේරුම් ගන්න පුළුවන්."

ලූසී මිත්‍රශීලී හඬකින් කියද්දී මාර්ගරි සිනාසුණා ය.

"මම හිතන්නේ ඒකේ කියන්න තරම් වැදගත් දෙයක් නෑ. ඇත්ත ම කියනව නම් ඒක මගේ මෝඩ වැරදි නිසා සිද්ධ වුණ දෙයක්. මම පුංචි කාලෙදි ම අම්මා මැරුණා. එයා හරි ම හොඳ කෙනෙක්. අම්මා මැරුණට පස්සේ තාත්තා තවත් කෙනෙක් කසාද බැන්දා. ඒ කුඩම්මා මට කැමති නෑ. එයා මම ගැන තාත්තට බොරු දේවල් කිව්වා. ඒ නිසා තාත්තත් මාත් එක්ක තරහ වුණා. මොනව වුණත් මම තාත්තට හරි ම ආදරෙයි. ඒ ආදරේ තවමත් වෙනසක් වෙලා නෑ. එයා මට ආදරේ වෙනව නම් මේ ලෝකේ තියෙන ඕනෑ ම දෙයක් මම තාත්තට දෙනවා. ඇත්තට ම මගේ තාත්තා හරි ම අපූරු කෙනෙක්."

මාර්ගරි කථාව මදකට නතර කොට දෙතොල් සපා ගත්තා ය. ලූසී සහ පැට් වචනයකුදු කථා කළේ නැත.

"මගේ කුඩම්මට පිරිමි ළමයි තුන් දෙනෙක් ම ඉන්නවා. තාත්තා පිරිමි ළමයින්ට ගොඩක් කැමති නිසා එයාට හරි ම සතුටුයි. ඒ නිසා ඒ අය මාව කොන් කෙරුවා. මාව කාටවත් ඕනෑ නැති කෙනෙක් විදිහටයි ඒ අය හැම දෙනා ම කල්පනා කරන්නේ. මේ හේතු හින්දා මම නපුරු වුණා. ඒ වගේ ම අකීකරු ළමයෙක් වුණා. මම කුඩම්මා කියන කිසි ම දෙයක් ඇහුවේ නෑ. මම නපුරු, අකීකරු ළමයෙක් වුණ හින්දා තාත්තත් මම එක්ක තරහා වුණා. ඇත්තට ම මාව පවුලෙන්

කොන් කෙරුවා. කවුරුවත් ම මට ආදරේ කරන්නේ නෑ කියලා මම හිතුවේ ඒ නිසයි."

"ඒ හේතු හින්දා ඔයාට මේ වගේ ඉස්කෝලෙක නතර කරන්න ඔයාලගේ ගෙදර අය තීරණය කෙරුවා. එහෙම නේද මාර්ගරි."

ලූසි, මාර්ගරිගේ විශාල ශක්තිමත් අත අල්ලා ගැනීමට තමාගේ කුඩා අත දිගු කළා ය.

"අනේ මාර්ගරි...... මට ඔයා ගැන හරි ම කණගාටුයි. ඔයා මොන තරම් අවාසනාවන්ත දේවල්වලට මුහුණ දුන්න ළමයෙක් ද?"

"ඒ වුණාට මාර්ගරි. ඔයා එරිකගේ ජීවිතය බේර ගත්තු හැටි ඇහුව ම ඔයාගේ තාත්තාට ගොඩාක් ආඩම්බර හිතෙයි."

මෙතෙක් වෙලාවක් නිහඬ ව ම සිටි පැට් උද්දාමයෙන් මොර දුන්නා ය.

"එයාට කියන්න මට බෑ."

මාර්ගරි කීවා ය.

"මේ කථාව ඇහුව ම බොරුවක් කියල එයා කියනවා. ඒක සිකුරුයි. අපේ තාත්තා හරි ම අමුතු කෙනෙක්. එයා කවුරුවත් ම කියන දෙයක් එක පාරට ම විශ්වාස කරන්නේ නෑ. ඔයාලා දන්නව ද? මගේ තාත්තා හරි ම නිර්භීත, දක්ෂ කෙනෙක්. එයා එවරස්ට් කන්දත් නැගලා තියෙනවා."

"මොනවා..."

පැට් පුදුමයෙන් බෙරිහන් දුන්නා ය.



"මම කිව්වේ එයා හරි අපූරු කෙනෙක්. මාර්ගරි ඔයත් තාත්තා වගේමයි. නිර්භීතයි. ශක්තිමත්."

මාර්ගරිගේ දෑස එක් වර ම ප්‍රීතියෙන් දීප්තිමත් විය. පැට් කියුවේ මොන තරම් අපූරු දෙයක්ද? ඈ පැට් දෙස මිත්‍රශීලී ආකාරයෙන් බලා සිටියේ ඒ නිසා ය.

"මම මීට ඉස්සර වෙලා නිකමටවත් ඒ ගැන හිතුවේ නෑ. ඔව්...... කවදාවත් ම හිතුවේ නෑ. ඒ වුණාට මම තාත්තා තරම් දක්ෂ කෙනෙක් කියල හිතෙනකොටත් මට හරි ම සතුටුයි. ඔව්. ඇත්තට ම මම ශක්තිමත්. ඒ වගේ ම මම නිර්භීතයි කියලත් මට හිතෙනවා. පැට් ඔයා මේ දේවල් කියුවට පස්සේ මගේ හිතට ලොකු සතුටක් දනෙනවා. මමත් තාත්තා වගේ ශක්තිමත්, නිර්භීත කෙනෙක් කියලා දනගත්ත ම එයා ගොඩක් සතුටු වෙයි කියලා මට හිතෙනවා."

ගැහැණු ළමුන් තිදෙනාගේ සංවාදයේ උච්චතම අවස්ථාවට පැමිණ තිබේ. මේට්‍රන්වරිය එතැනට පැමිනුණේ ඒ වෙලාවේදී ය. මාර්ගරීගේ ප්‍රීතිමත් මුහුණ දුටු සැනින් මේට්‍රන්වරියගේ මුහුණට සිනාවක් නැගුණේ ය.

"ඔයාලා මාර්ගරිව සතුටු කරලා. ඒ වුණාට ඔයාලා දැන් ම ම ගියොත් හොඳයි. දෙයියනේ මොන තරම් ලස්සන මල් පොකුරක් ද ඔයාලා අරගෙන ඇවිත් තියෙන්නේ? ලූසී, ඉසබෙල්ටයි, ජැනට්ටයි හෙට මාර්ගරි බලන්න එන්න කියලා මතක ඇති ව කියන්න හොඳද?"

ගැහැණු ළමුන් දෙදෙනා මාර්ගරිට ආයුබෝවන් කියා කාමරයෙන් පිටතට පැමිණියහ. කාමරයෙන් පිට වූ වහා ම පැට්, ලූසිගේ අතින් අල්ලා ගත්තා ය. ඇගේ දෑස ප්‍රීතියෙන් බැබළෙමින් තිබේ.

"ලූසී..... ලූසී..... ඔයා දන්නවද මට අපූරු අදහසක් ආවා."

"මොකක්ද ඒ?"

ලූසී ඇසුවේ පුදුමයෙනි.

"මෙ අහන්නකෝ. එරිකගේ ජීවිතය බේර ගත්තු විදිහ ගැන විස්තරයකුත් එක්ක මාර්ගරිගේ ෆොටෝ එකක් පත්තරේ ගියා කියලා ඔයා දන්නව නේද? අපි ඒ විස්තරේ කපලා මාර්ගරිගේ තාත්තට අරිමු. ඒත් එක්ක ම මාර්ගරි ගැන සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ මොන තරම් සතුටු වෙනවද කියලත් අපි ලියුමක් ලියමු."

පැට්ගේ කථාවට සවන් දුන් ලූසී ප්‍රීතියෙන් හිස සැළුවා ය.

"දෙවියනි...... ඒක නම් හරි ම අපූරු අදහසක් පැට්. ඇත්ත ම කියනව නම් මමත් ඒ ගැන කල්පනා කළා. මාර්ගරිගේ තාත්තගේ එඩ්‍රස් එක මිස් තියෝබෝල්ඩ්ගෙන් ඉල්ල ගන්න පුළුවන්. මාර්ගරි ගැන සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ ගොඩක් සතුටු වෙනව කියලා දැනගත්ත ම මාර්ගරිගේ තාත්තා ගොඩාක් සන්තෝෂ වෙයි. මේක මාර්ගරිගේ හොඳ කාලය වෙයි කියලා මට සහතිකයි."

මේ දිගු කථා බහට පසු ව විවේක කාමරයට පැමිණෙන තෙක් ම ගැහැණු ළමුන් දෙදෙනා වෙනත් කිසිවක් කථා කළේ නැත. පැට් පුවත්පතක් සොයා ගෙන "නිර්භීත පාසල් සිසුවිය වීරවරියක්" යන ශීර්ෂ පාඨය සහිත ව මාර්ගරි පිළිබඳ විස්තරය සඳහන් කොටස කපා ගත්තා ය. එහි මාර්ගරිගේ ඡායාරූපය ද පළකොට තිබිණි.

"ඔයා මොනවද කරන්නේ?"



පැට් අසලට පැමිණි ඉසබෙල් ඇ දිහා කල්පනාකාරී ව බැලුවා ය.

"මම ඔයාට කියන්නම් ඉසබෙල්. හැබැයි වෙන කාටවත් කියන්න එපා."

පැට්, ඉසබෙල්ට සියල්ල ම කියුවා ය. ඉන් පසු ව ඔවුන් දෙදෙනා සහ ලූසී එතැනම හිඳ මාර්ගරිගේ පියාට ලිපියක් ලියන්නට පටන් ගත්තා හ. පහත දැක්වෙන්නේ ගැහැණු ළමුන් තිදෙනා විසින් ලියන ලද ලිපියයි.

හිතවත් ෆෙන්වෝර්දි මහත්මයාණෙනි,

ඔයා හරි ම නිර්භීත කෙනෙක් කියල අපිට දැනගන්න ලැබුණා. ඇත්තට ම මාර්ගරි තමයි අපිට ඔයා ගැන කිව්වේ. ඉතින් ඔයාගේ දුව මාර්ගරි කරපු නිර්භීත ක්‍රියාව ගැන දැනගන්න ඔයා කැමැති ඇති කියලා අපිට හිතුණා. මාර්ගරිගේ නිර්භීත ක්‍රියාව ගැන හැම තොරතුරක් ම අපි මේ ලියුමේ ලියන්න උත්සාහ කරනවා.

ගිනි ගත්තු කාමරයට මාර්ගරි ගොඩ වුණේ යකඩ පයිප්පයක් දිගේ බඩගාමිනුයි. තමන්ගේ ජීවිතය ගැන පවා නොසිතමින් ගිණි ජාලාවට මැදි වුණ කාමරයට ගොඩ වෙලා එයා එරිකා කියන ළමයව බේරා ගත්තා. ඊට පස්සේ මාර්ගරි ඇඳ රෙදි ඉරල හදා ගත්තු කඹයකින් බිමට බැස්සේ එරිකවත් පිටේ එල්ලගෙනයි. ඒ වුණාට බිමට බහින්න ඔන්න මෙන්න කියා තිබියදී මාර්ගරි බිමට වැටුණා. දැන් එයාගේ කකුළ කැඩිලා. ඇත්තට ම එරිකගේ ජීවිතය බේරගත්තු මාර්ගරි හැබෑ ම වීරවරියක්.

මාර්ගරි හරි ම ශක්තිමත් ළමයෙක්. එයා අපේ ඉස්කෝලේ වෙනුවෙන් කරපු හැම ක්‍රියාවකදී ම පුදුමාකාර

විදිහට දක්ෂකම් දක්වූවා. පහුගිය දවසක තිබුණ ලක්‍රොස් තරඟයෙන් අපේ ඉස්කෝලෙට දිනන්න පුළුවන් වුණේ මාර්ගරීගේ දක්ෂකම් නිසයි. මාර්ගරී ඔයා තරම් ම දක්ෂ කෙනෙක් කියලා අපට සහතිකයි. ඒ මොකද දන්නවද? එයා හරි ම ශක්තිමත්. උස් කඳු නගින්න වුණත් එයා නිර්භීතයි. ඒ වගේ දක්ෂ කමක් වෙන කාටවත් කරන්න බෑ. මාර්ගරීගේ කකුල දැන් ටික ටික හොඳ වෙනවා. ඒ වුණාට මාර්ගරීට පුදුමාකාර විදිහට තනිකම දැනෙනවා කියලා අපට හිතෙනවා. පුංචි වෙලාවක් අරගෙන ඔයා මාර්ගරීව බලන්න ආවොත් එයාගේ හිතේ තියෙන තනිකම නැති වෙනවා කියලා අපට විශ්වාසයි.

අපි හැම දෙනාමත් මාර්ගරී ගැන පුදුම විදිහට ආඩම්බර වෙනවා. ඒ වගේ ම ඉස්කෝලෙන් අයින් වෙනකම් ම එයා සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ ඉඳියි කියලත් අපි විශ්වාස කරනවා. මේ දේවල් දැනගත්තට පස්සේ ඔයා මාර්ගරී ගැන ආඩම්බර වෙයි කියලත් අපට සහතිකයි.

ඔබට ගොඩාක් ස්තූතියි.

මීට මාර්ගරීගේ හොඳ ම යාළුවෝ.

පැට් සහ ඉසබෙල් ඕ'සුලිවාන් සහ ලූසි ඔරිල්.

ලියුම නැවතත් කියවා බැලූ ඔවුහු ඒ ගැන වඩාත් සතුටු වූහ. ඔවුහු ලිපිය එදින ම තැපැලට දැමූහ. ලියුමේ ප්‍රතිචාරය ලැබෙන්නට වැඩි දවසක් ගත වූයේ නැත. පසු දින ම මාර්ගරීගේ හිතට සතුටක් ඇති කරමින් ඇගේ පියාගෙන් විදුලි පණිවුඩයක් ලැබිණි.

"ඔයා ගැන මට ගොඩක් ආඩම්බරයි. ඔයාව බලන්න මම අද ම එනවා."

ආදරණීය තාත්තා.



මාර්ගරී ටෙලිග්‍රෑමය ඉසබෙල්ට පෙන්නුවා පමණක් නොව ඒ ගැන පැට්ට හා ලූසීටත් කියන්නැයි ඉල්ලීමක් ද කළා ය.

"මට හරි ම සතුටුයි ඉසබෙල්. ඇත්තට ම ඒ සතුට කියන්න වචන නෑ. තාත්තට මාව බලන්න එන්න වෙලාවක් තිබුන එක ගැන හරි ම පුදුමයි. එයා මම ගැන ආඩම්බර වෙනවලු. ඒක නම් මොන තරම් පුදුම කථාවක් ද? මට හරි ම පුදුමයි."

මාර්ගරී සතුට උතුරා යන හඬින් කීවා ය. ඈ මෙතරම් සතුටින් සිටි දවසක් පිළිබඳ ව මෙතෙක් මතක නැත.

මාර්ගරීගේ තාත්තා පාසලට පැමිණෙන ආකාරය ගැහැණු ළමුන් සියලු දෙනා ම දුටුවෝ ය. ඔහු ඉතා ප්‍රිය මනාප පෙනුමක් ඇති පුද්ගලයෙකි. උස, පළල් උරහිස් ඇති ඔහුගේ ශරීරය ශක්තිමත් ය. බැලූ බැල්මට ඔහු මාර්ගරීට සමාන ලක්ෂණවලින් හෙබි පුද්ගලයෙකි. ඔහු මිස් තියෝබෝල්ඩ්ගේ කාමරයේ වාඩි වූවාට පසු ව මාර්ගරී එතැනට කැඳවාගෙන එන ලදී.

මාර්ගරී සහ ඇගේ පියා අතර ඉන් පසු සිදු වූ දේ ගැන කිසිවෙකුත් හරියාකාර විස්තරයක් දැන සිටියේ නැත. හැබැයි තාත්තා තමා වැළඳගෙන සුබ පැතූ බව නම් මාර්ගරී ලූසීට කීවා ය.

"පැට්, ඉසබෙල්, ලූසී. ඔයාලා නේද මගේ තාත්තට ලියුම ලියුවේ?"

ඊළඟ දිනයේදී මාර්ගරී ඇසුවා ය. ඇගේ දෑස ප්‍රීතියෙන් බැබළෙයි.



Scanned with CamScanner

"තාත්තා මට ඔයාලගේ ලියුම පෙන්නුවා. ඔයාලා මොන තරම් හොඳ යාළුවොද? ඒ ලියුම හින්දා මොන තරම් පෙරළියක් සිද්ධ වුණාද? මම කොයි වගේ කෙනෙක් ද කියලා තාත්තා මෙච්චර දවසක් දැනගෙන හිටියේ නෑ. මමත් එයා වගේ දක්ෂ කෙනෙක් කියලා දැනගත්තට පස්සේ එයා පුදුම විදිහට සතුටු වුණා. ඊළඟ නිවාඩුවෙදි මම තාත්තා එක්ක කඳු නගින්න යනවා. ඔයාලා දන්නවා ද? මම දිගට ම සෙන්ට් ක්ලෙයාර් එකේ ඉන්නවා. මට අවුරුදු දහ අට වුණා ම ක්‍රීඩා පුහුණු විද්‍යාලයට ගිහිං ක්‍රීඩා ගුරුවරියක් විදියට පුහුණු වෙනවා. ඔයාලා දන්නවද මම හැමදාම ආසා කෙරුවේ ඒකටයි."

"මාර්ගරි දූත් ඔයා හරි ම වෙනස්. මාර්ගරිගේ මුහුණේ මෙතෙක් දවසක් තිබූ රෞද්‍ර බව දූත් පෙනෙන්නටවත් නෑ." පැට් ඇගේ මුහුණේ නව පෙනුම දෙස බැලුවේ පුදුමයෙනි.

"මට දූත් ගොඩාක් හොඳට, සන්තෝසෙන් වැඩ කරන්න පුළුවන්. ආයේත් නම් මම පංතියේ දුර්වල ම ළමයා වෙන්නේ නෑ. ඔයාලට ඇහුණා නේද?"

එසේ කියූ මාර්ගරි හයියෙන් සිනාසුණාය.

"ඒක නෙවෙයි මාර්ගරි. ඔයාට පුළුවන් නම් ඉහළ පංතියට යන්න. එතකොට අපිට පුළුවන් ඔයාගේ සපත්තු පිරිසිදු කරලා දෙන්න."

එසේ කියූ ලූසී මෙන් ම පැට් හා ඉසබෙල් ද මාර්ගරි ගේ සිනාවට හවුල් වූහ.



# ලූසීගේ අවාසනාව

තවත් දවස් කිහිපයක් ගත වෙන කොට මාර්ගරිට කිහිලි කරුවලින් ඇවිදින්නට අවසර ලැබුණා. හැබැයි කකුළ හොඳට ම සුවපත් වෙන තුරු ඇයට ක්‍රීඩා කිරීමට හෝ ව්‍යායාම් කටයුතු වලට අවසර ලැබෙන්නේ නෑ. ඒ වුණත් මාර්ගරිගේ හිත දූත් සතුටින් පිරිලා. කිහිලි කරුවලින් හෙමින් හෙමින් ඇවිද යන මාර්ගරි දකින කොට ගුරුවරියන්ටත් හරි ම සතුටුයි. ඔවුනුත් මාර්ගරිව උනන්දු කරවනවා.

මේ වෙනකොට මාර්ගරිගේ හොඳ ම යෙහෙළිය බවට පත් වෙලා හිටියේ ලූසියි. ඔවුන් දෙදෙනා හැම වෙලාවෙ ම එකටමයි හිටියේ. ලූසිත් නිතර ම විහිලු කථා කියමින් සිනහ වෙමින් මාර්ගරිගේ හිත සතුටින් තියන්න උත්සාහ කරනවා.

"ලූසි හැම වෙලාවෙ ම ඉන්නේ ගොඩක් සතුටින්."

කිහිලිකරු වලින් ඇවිද යන මාර්ගරිගේ අතකින් අල්ලා ගෙන පැසේජය දිගේ ඉදිරියට යන ලූසී දෙස බලමින් පැට් කීවා ය.

"ඒක තමයි ලූසිගේ තියෙන හොඳ ම දේ. අනික එයා හැමෝටම ම උදව් කරනවා."

"ඇත්ත තමයි. එයාට දුක් වෙන්න මොන ම හේතුවක් වත් නෑ."

ඉසබෙලුත් කථාවට එකතු වූවා ය.

"ලූසීට හරි ම කරුණාවන්ත අම්මා කෙනෙක් ඉන්නවා. ඒ විතරක් ද එයාගේ තාත්තා හරි ම ජනප්‍රිය කෙනෙක්. ලූසි හරි ම දක්ෂයි, ඒ වගේ ම ලස්සනයි. සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ හැම දෙනාමත් ලූසීට ආදරෙයි. ඉතින් එයාට දුක් වෙන්න කිසි ම හේතුවක් නෑ. ඔයා දන්නවද ලූසී මට කිව්වා කවද හරි දවසක එයා ශිෂ්‍ය නායිකාව වෙනවා කියලා. එයා ඒ දේ කරනවාමයි. මට ඒ ගැන නම් කිසි ම සැකයක් නෑ."

ඔවුන් එසේ සිතුවත් ඊළඟ සතිය වෙද්දී ම අවාසනාව, අහිංසක ලූසී සොයා ගෙන ආවා. මිස් තියෝබෝල්ඩ්ගේ නමට විදුලි පුවතක් ලැබී තිබූ අතර ඉතිහාසය පාඩම ඉගෙන ගනිමින් සිටි ලූසී වහ වහා ම විදුහල්පතිනියගේ කාමරයට කැඳවිණි. ලූසී පංතියෙන් නික්ම ගියේ දෙගිඩියාවෙනි. ඇත්තට ම සිදු ව ඇත්තේ කුමක් ද?

මිස් තියෝබෝල්ඩ්ගේ මුහුණේ තිබෙන්නේ කිසියම් බැරෑරුම් පෙනුමකි. කාමරයට ඇතුල් වූ ලූසී දෙස කණගාටුවෙන් මෙන් බලා සිටි විදුහල්පතිනිය ඇගේ අතකින් අල්ලා ගත්තා ය.

"ලූසී... ඔයාට කියන්න ටිකක් නරක ආරංචියක් තියෙනවා. ඔයාට ඒක අහන්න පුළුවන් නේද?"

විදුහල්පතිනියගේ හඬ ශෝකාකුල ය.

"ඔව්......... අනේ මට ඉක්මනට කියන්න."

ලූසීගේ දෙතොල වෙවුළයි.



"ඔයාගේ තාත්තා එක්සිඩන්ට් වෙලා. ඇත්තට ම එයාට සැහෙන්න තුවාලයි. ඉතින් තාත්තා ඔයා එනකම් බලාගෙන ඉන්නවා."

"අනේ තාත්තා මැරෙයිද? මිස් තියෝබෝල්ඩ්. අනේ එහෙම වෙන්නේ නැති වෙයි නේද?"

ලූසී හැඩුම්බර හඬකින් ඇසුවා ය. ඇගේ මුහුණ සුදුමැලි ය.

"එහෙම නොවෙයි කියලා මට විශ්වාසයි." මිස් තියෝබෝල්ඩ් ලූසී සනසන හඬකින් නැවතත් කීවා ය.

"ඉක්මනට ගිහිල්ලා කවුරු හරි ළමයෙක් එක්ක ඔයාගේ ඇඳුම් බෑග් එක ලෑස්ති කර ගන්න. ඊට පස්සේ මම ඔයාව ස්ටේෂන් එකට එක්ක යන්නම්. සිද්ධ වුණ දේ ගැන මටත් හරි ම කණගාටුයි. ගොඩාක් වෙලාවට සිද්ධ වෙන්නේ අපි හිතන දේවල් නොවෙයි. ඔයා දක්ෂ ළමයෙක්. ඒ නිසා හිත දුර්වල කරගන්න එපා."

ලූසී වහ වහා පංතියට ගියා ය. ඉන් පසු ව ඇ තම ගමන් මල්ල සකස් කර ගැනීම සඳහා මාර්ගරීට කථා කළා ය. තමාගේ හොඳ ම යෙහෙළිය දුකින් සිටීම මාර්ගරීට ද ඉවසුම් නොදෙන්නකි. ඇ ලූසීගේ කර වටා අතක් දමා ගත්තා ය.

"ලූසී දුක් වෙන්න එපා. හැම දෙයක් ම ඉක්මනට හරි යයි. ඒ හින්දා හිතට ධෛර්ය ගන්න. ඕනෑ දේවල් කියන්නකෝ. මම ඔයාගේ බෑග් එක ලෑස්ති කරලා දෙන්නම්."

වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර සුදුමැලි වූ මුහුණින් යුතු ලූසී ද කැටුව මිස් තියෝබෝල්ඩ් දුම්රිය නැවතුම් පොළ

කරා ගියා ය. ලුසීට සිදු ව ඇති විපත ඇසූ පළමු වාරයේ ළමෝ දඩි සේ දුක් වූහ. ඒ අතර මාර්ගරීට තමාගේ හොඳ ම යෙහෙළිය අහිමි ව ගොස් තිබිණි.

"ලුසීගේ තාත්තා වෙනුවෙන් මම යාඥා කරනවා."

ජැනට් දුකින් කීවා ය. සැබැවින් ම ජැනට් පමණක් නොව අනික් ගැහැණු ළමයි ද ලුසීගේ තාත්තා වෙනුවෙන් යාඥා කළහ.. පාසලේ යෙහෙළියන්ගේ මේ ක්‍රියාව දැන ගත් විට ලුසී මොන තරම් පුදුම වෙනු ඇද්ද? තවත් දින හතරකට හෝ පහකට පසු ව මාර්ගරීට ලිපියක් ලැබිණි. ඒ ලුසිගෙනි. ලිපියේ තිබූ දේ ගැන මාර්ගරී අනිත් අයට කීවා ය.

"ලුසීගේ තාත්තට දන් එච්චර අමාරුවක් නැතිලු. ඒ වුණාට හරි ම අවාසනාවන්ත දෙයක් තමයි සිද්ධ වෙලා තියෙන්නේ. ලුසීගේ තාත්තගේ දකුණු අත වැඩ කරන්නේ නෑ. එයා චිත්‍ර ශිල්පියෙක්. ඉතින් කොහොමද එයා චිත්‍ර අඳින්නේ."

ගැහැණු ළමුන් සියල්ලෝ ම මාර්ගරිගේ කථාව අසා සිටියේ පුදුමයෙනි.

"ඒක නම් හරි ම අවාසනාවක්." මාර්ගරි නැවතත් කීවා ය.

"ලුසීගේ තාත්තගේ විතරක් නෙවෙයි ඒක ලුසීගෙත් අවාසනාව. ලුසීගේ තාත්තට චිත්‍ර අඳින්න බැරි නිසා එයාට සල්ලි හම්බ කරන්නත් බෑ. ඒ නිසා ලුසීට සෙන්ට් ක්ලෙයාර් එකේ තව දුරටත් ඉන්න බැරි තත්වයක් තමයි ඇති වෙලා තියෙන්නේ."

"මොන තරම් අවාසනාවක් ද?"



තෙසි බෙරිහන් දුන්නා ය.

"මෙච්චර දවසකට සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙට ආපු දක්ෂ ම ළමයා තමයි ලුසී."

"එයා කවද හරි දවසක ඉස්කෝලේ ශිෂ්‍ය නායිකාව වෙන්නත් හිතාගෙන හිටියා."

පැට් ද ශෝකයෙන් කීවා ය.

"අනේ දෙවියනි...... මොන තරම් අවාසනාවක් ද? අහිංසක ලුසී. එයා තාත්තා ගැන ගොඩාක් දුක් වෙලා ඉන්න වෙලාවක එයාගේ අනාගතය සම්පූර්ණයෙන් ම වෙනස් වෙන්න පටන් අරගෙන. ඒක හරි ම අවාසනාවක්."

"මම හිතන විදිහට එයා ඉස්කෝලෙන් අයින් වෙලා රස්සාවක් හොයා ගනියි. මොකද සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ ඉගෙන ගන්න සෑහෙන මුදලක් වියදම් වෙනවා. ඇත්තට ම ශිෂ්‍යත්වයක් වගේ එකක් ලැබුණොත් නම් ඒක ලුසීගේ වාසනාව."

ඒ අදහස හිලරිගෙනි.

"ලුසී තුන්වැනි පංතියේ හිටිය නම් ශිෂ්‍යත්වයක් ගන්න තිබුණා. මොකද ශිෂ්‍යත්ව විභාගය තියෙන්නේ තුන්වැනි වාරයේදි. ඒ විභාගෙන් පාස් වුණොත් නම් කිසි ම ගෙවීමක් නැති ව විශේෂ ඉස්කෝලෙක ඉගෙන ගන්න ලැබෙනවා."

තෙසී ද ඔවුන්ගේ කථාවට එකතු වූවා ය.

"ඒ වුණාට ලුසී තාම ඉන්නේ පළමු වාරයෙනේ."

පැට් කීවේ දුකෙනි.

"පොඩ්ඩක් ඉන්නකෝ...... මොනව හරි දෙයක් කරන්න පුළුවන් වෙයි කියලා මට හිතෙනවා. මාර්ගරි, ලුසී ආයෙමත් එනවා කියලා කිව්වද?"

"ඔව්........ තව දවස් දෙකකින් එයාගේ තාත්තා ඉස්පිරිතාලෙන් ගෙදර එක්ක යනවලු."

මාර්ගරි නැවතත් ලිපිය දෙස බලමින් කීවා ය.

"හැබැයි එයා ආපහු එන දවසක් හරියට ම කියන්න අමාරුයිලු. අනික, අපි එයා ගැන ගොඩක් දුක් වෙන බව දන්නවා කියලා ලුසී ලියලා තියෙනවා."

ලුසී නැවතත් පාසලට පැමිණි දා ඇගේ යෙහෙළියන් වෙතින් ලැබුණේ ඉතා උණුසුම් පිළිගැනීමකි. ඇගේ මුහුණ සුදු මැලි ව තිබූ අතර එය මදක් කෙට්ටු වී තිබිණි. කෙසේ වුව ද ලුසීගේ මුහුණේ නිතර ම ගැවසෙන සුන්දර සිනාව නම් එදා මෙන් ම අදත් නොවෙනස් ව තිබේ. සැබැවින් ම ඈ මාර්ගරි මෙන් නිර්භීත ව සෑම දෙයකට ම මුහුණ දෙන්නට ඉගෙන ගෙන ඇති සෙයකි.

ගැහැණු ළමෝ ලුසී වැඩිපුර වෙහෙස කරමින් ඈ සමඟ වැඩිපුර කථා කරන්නට උත්සාහ නොකළහ. ඒ අතර මාර්ගරි තම හොඳ ම මිතුරිය පිටතට කැඳවාගෙන ගියා ය. පංතියේ ළමුන් සියලු දෙනා ම තම පියා වෙනුවෙන් යාඥා කළ බව මාර්ගරිගෙන් දැනගත් ලුසී බෙහෙවින් ම ප්‍රීති වූවා ය. ඈ මාර්ගරිගේ සුරත ආදරයෙන් සෙළවූයේ ඒ නිසා ය.

"ඔයා හරි ම හොඳ යාලුවෙක් මාර්ගරි. ඔයාට ස්තුතියි. අනික ඔයා මට එවපු ලියුම නිසා මම සැහෙන්න හිත හදා ගත්තා. පව් අහිංසක තාත්තා. මාර්ගරි, තාත්තා කොච්චර



උත්සාහවන්ත ද කියලා ඔයා දන්නවද? ආයේ කවදාවත් චිත්‍ර අඳින්න බෑ කියලා තාත්තා දන්නවා. හැබැයි එයා වම් අතෙන් චිත්‍ර අඳින්න උත්සාහ කරනවා. අනික එයා කවදාවත් ම සල්ලි ඉතිරි කෙරුවේ නෑ. ඒ ගැනත් දැන් හරියට දුක් වෙනවා. ඒ දවස්වල තාත්තට ඇති තරම් සල්ලි හම්බ වුණා. ඒ සල්ලි වියදම් කෙරුවා මිසක් අපි කවදාවත් ඉතිරි කිරීමක් ගැන හිතුවේ නෑ. ඒ කරපු මෝඩ වැඩේ පාඩුව දැන් තමයි හොඳට ම තේරෙන්නේ."

ලුසිගේ ප්‍රිය මනාප මුහුණ මත කිසියම් දුක්බර බවක් ඇඳී යයි.

"ඇත්තට ම ලුසී. මේ වාරෙන් පස්සේ ඔයා සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙන් අයින් වෙනවද?"

"ඇත්තට ම ඔව් මාර්ගරි. ඉස්කෝලෙට සල්ලි ගෙවන්න මට පුළුවන් කමක් නෑ. වෙන ඉස්කෝලෙකින් ශිෂ්‍යත්වයක් වත් ලැබුණොත් මට දිගට ම ඉගෙන ගන්න පුළුවන් වෙයි. කොහොම වුණත් අම්මා දැනටමත් මට රස්සාවක් හොයනවා. සෙකට්‍රි ජොබ් එකක්වත් හොයා ගන්න මට බැරි වෙන්නේ නැති වෙයි මාර්ගරි."

"මට ඔයාව නැති වෙනවා. ඒක තමයි මට දරාගන්න බැරි."

මාර්ගරිගේ කටහඬ ශෝකයෙන් බර වෙලා.

"මගේ ජීවිත කාලෙට ම හම්බ වුණ එක ම යාලුවා ඔයා විතරයි ලුසී. අනේ. ඔයාව නැති වෙන්න දෙන්න බෑ. ඇත්තට ම මම ඔයා වෙනුවෙන් මොනව හරි දෙයක් කරනවා."

මාර්ගරි යනු කිසියම් අභියෝගයක් හමුවේදී පසු බා යන තැනැත්තියක නොවේ. ලුසීට උදව් වෙන්නේ කෙසේද?

ඈ නිරන්තරයෙන් ම කල්පනා කරන්නට වූවා ය. වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර කදිම අදහසක් ඇගේ සිතට නැඟිණි. ඇගේ අදහස ක්‍රියාවට නැඟුහොත් ලූසීට දිගට ම සෙන්ට් ක්ලෙයාර් බාලිකාවේ සිටීමේ වාසනාව හිමි වෙන බව මාර්ගරීට සහතික ය. ඒ අදහස ගැන කෙළින් ම සාකච්ඡා කළ යුත්තේ මිස් තියෝබෝල්ඩ් සමඟ ය. ඈ වහ වහා විදුහල්පතිනියගේ කාමරයට ගියේ ඒ නිසා ය.

විදුහල්පතිනිය ඒ වෙලාවේ තවත් ගුරුවරියක සමඟ සාකච්ඡාවක නිරත ව සිටිය ද මාර්ගරි කාමරයේ දොරට තට්ටු කළා ය.

"ඇතුළට එන්න."

විදුහල්පතිනියගේ කැඳවීමත් සමඟ ම මාර්ගරි කාමරයට ඇතුළු වූවා ය. ඇගේ ප්‍රිය මනාප මුහුණ කිසියම් දීප්තියකින් ඔපවත් වෙලා ය. මෙවැනි ප්‍රිය මනාප බවක් මාර්ගරි ගේ මුහුණේ තිබෙනු දකින්නට මිස් කිගේබෝල්ඩ් ඉතා ම කැමති ය.

"ආ..... මිස් තියෝබෝල්ඩ් මම හිතුවේ ඔයා ඉන්නේ තනියම කියලයි."

මාර්ගරිගේ කට හඬ වික්ෂිප්ත බවකින් පිරී ඇත.

"ඇත්තට ම ගොඩක් වැදගත් දෙයක් ගැන කතා කරන්නයි මම ආවේ."

පාසලේ චිත්‍ර ගුරුවරිය වන මිස් වෝකර් විදුහල්පතිනිය සමඟින් කථා බහ කරමින් සිටියි. ඔවුන්ගේ බැරෑරුම් කථා බහ තවමත් නිමා වී නැතුවා සේ ය. එහෙත් මාර්ගරි දෙස බැලූ විදුහල්පතිනියට ඇගේ මුහුණේ ඇති දැඩි ඕනෑකම හඳුනාගත හැකි විය.



"ඇත්තට ම මොනවද ඔයාට මාත් එක්ක කථා කරන්න තියෙන්නෙ? ඒක පුද්ගලික දෙයක් ද?"

විදුහල්පතිනිය ඇසුවා ය.

"ඒ වගේ දෙයක් තමයි මිස් තියෝබෝල්ඩ්. ඇත්ත ම කියනවා නම් ඒ කාරණාව ලූසී ගැන."

මාර්ගරි කීවා ය.

"මේ මොන පුදුමයක් ද?"

විදුහල්පතිනියගේ මුහුණ පුරා විස්මයක් ඇඳී ගිය අතර එය සිනාවකින් ද ඔපවත් වී තිබිණි.

"මිස් වෝකර් මාත් එක්ක කථා කරමින් සිටියෙත් ලූසී ගැනමයි. දැන් ඔයා ඇවිත් ඉන්නෙත් ලූසී ගැන කථා කරන්නයි. ඉතින් මාර්ගරි ඔයාගේ කථාව කියන්න. මිස් වෝකර් හිටියට කමක් නෑ. ලූසී චිත්‍රවලට දක්ෂ හින්දා මිස් වෝකරුත් ලූසීට හරි ම කැමතියි."

"මිස් තියෝබෝල්ඩ්. මේ වාරෙන් පස්සේ ලූසී ඉස්කෝලෙන් අයින් වෙනවා. ඔයා ඒ ගැන දන්නවද?"

මාර්ගරි දිගු කථාවකට මුල පිරුවා ය.

"ඒක හරි ම අවාසනාවන්ත සිදුවීමක්. මොකද ලූසී, සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙට ගොඩාක් ආස කෙරුවා. අපි හැම දෙනාමත් ලූසීට කැමතියි. ඉතින් ලූසී අපේ ඉස්කෝලේ තියාගන්න ම ඕනෑ ළමයෙක් කියලා ඔයාට හිතෙන්නේ නැද්ද මිස් තියෝබෝල්ඩ්. ඉතින් මට හරි අපූරු අදහසක් ආවා."

"ඒ මොකද්ද මාර්ගරි?"

විදුහල්පතිනිය ඇසුවේ පුදුමයෙනි. ඇගේ දෑසේ තිබෙන්නේ විස්මයකි. එහෙත් ඈ සිනාසෙන්නට උත්සාහ නොකළා ය.

"මිස් තියෝබෝල්ඩ්. ලුසී ගොඩක් දක්ෂ ළමයෙක් කියලා ඔයා දන්නවනේ. එයා හැම සැරේ ම අපේ පංතියේ පළවෙනියා වෙනවා. ඒ විතරක් නෙවෙයි. ලුසීට ඕනෑ ම දෙයක් එක පාරට ම මතක හිටිනවා."

"ඒක හරි ම වාසනාවක්. ලුසීට ඒ වගේ දක්ෂතාවයක් තියෙනවා කියලා මම දන්නවා. ඉතින්. ඔයාගේ කථාව දිගට ම කියන්නකෝ මාර්ගරි."

"ඉතින් ශිෂ්‍යත්ව විභාගෙට වාඩි වෙන්න තරම් ලුසී දක්ෂ ළමයෙක් කියලා ඔයාට හිතෙන්නේ නැද්ද? මම කියන්නේ තුන්වැනි වාරයේදී පැවැත්වෙන විභාගේ ගැන."

මාර්ගරිගේ දෑස ප්‍රීතියෙන් දිළිසෙයි.

"ලුසීට ගොඩාක් මහන්සි වෙලා පාඩම් කරන්න පුළුවන්. ඒ නිසා ශිෂ්‍යත්ව විභාගයෙන් පාස් වෙන්න එයාට පුළුවන් කියලා මට සහතිකයි. මිස් තියෝබෝල්ඩ් ලුසීට ශිෂ්‍යත්ව විභාගෙට වාඩි වෙන්න අවස්ථාවක් දෙන්න බැරිද? කිසි ම සැකයක් නෑ. ලුසී ශිෂ්‍යත්වය පාස් වෙනවාමයි."

"ඇත්ත මාර්ගරි. ලුසීට උදව් කරන්න ඕනෑ කියලා අපි හැමෝ ම දන්නවා. මට එයාගෙන් අඩුවෙන් ගාස්තු අය කරලා ඉස්කෝලේ තියා ගන්න පුළුවන්. ඒ වුණාට ලුසීගේ දෙමාපියන්ට ඒ තරම්වත් ගෙවන්න විදිහක් නෑ. මාර්ගරි පොඩ්ඩක් හිතන්නකෝ. ලුසීට තාම අවුරුදු දාහතරයි. අනිත් ළමයි ශිෂ්‍යත්ව විභාගෙට. වාඩි වෙන්නේ අවුරුදු දාසයෙන්.



ලුසී දක්ෂ ළමයෙක් බව ඇත්ත. ඒ වුණාට ශිෂ්‍යත්ව විභාගේ පාස් වෙන්න තරම් එයා දක්ෂ වෙයි ද කියලා මට පොඩි සැකයක් තියෙනවා. ඒක හරි අමාරු විභාගයක්. තුන්වැනි වාරයේ ඉගෙන ගන්න ළමයින්ගෙන් එක් කෙනෙක් නැතිනම් දෙන්නෙක් විතරක් ශිෂ්‍යත්ව විභාගයෙන් පාස් වෙයි."

මාර්ගරිගේ බලාපොරොත්තු බිඳ වැටුණා සේ ය. එහෙත් ඈ තම අදහස හදවතේ රඳවා ගත්තා ය. ඕනෑ ම ශිෂ්‍යත්ව විභාගයක් ජය ගැනීමට තරම් ලුසී දක්ෂ සිසුවියක් බව මාර්ගරීට සහතික ය. මාස කිහිපයක් හෝ ඉගෙන ගැනීමට ලැබුණොත් ලුසී හොඳින් විභාගයට මුහුණ දෙන බව මාර්ගරීට නොඅනුමාන ය.

මිස් වෝකර් ඔවුන්ගේ සංවාදයට මැදිහත් වූයේ ඒ වෙලාවේදී ය.

"ලුසීට ශිෂ්‍යත්ව විභාගෙට ලියන්න ඉඩ දුන්නා කියමුකෝ. එතකොට කොහොමද එයා සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ ඉන්නේ? මට නම් ඒක හිතාගන්න අමාරුයි."

"ආ..... මිස්.... වෝකර්. ඇත්තට ම ඒක කරන්න පුළුවන්."

මාර්ගරි සතුටින් බෙරිහන් දුන්නා ය.

"ශිෂ්‍යත්වයක් දිනාගෙන නොමිලේ ඉගෙන ගන්න පුළුවන් ඉස්කෝලවල ලැයිස්තුව මම බැලුවා. මේ අවුරුද්දේ අපේ ඉස්කෝලෙත් ඒ ලැයිස්තුවේ තියෙනවා. ලුසී ශිෂ්‍යත්වය දිනා ගත්තොත් එයා සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙ ම තෝරා ගනියි. ඒ ගැන කිසි ම සැකයක් නෑ."

මිස් තියෝබෝල්ඩ් සිනාසෙන්නට වූවා ය. මාර්ගරි

හැම දෙයක් ම ගැන ඉතා ම හොඳින් විපරම් කොට තිබේ. ඇගේ උනන්දුව කෙතරම් ද යි එයින් ම වටහා ගත හැකි ය.

"මාර්ගරි ඔයා යාලුවා ගැන මොන තරම් උනන්දු වෙනවද කියලා මට හිතාගන්න පුළුවන්. ඇත්තට ම ලූසී හරි ම ජනප්‍රිය ඒ වගේ ම අපූරු ළමයෙක්. එරිකගේ සිද්ධියේදී එයා ක්‍රියා කරපු හැටි. ඔයාගේ තාත්තට ලියුමක් ඇරලා ගෙන්න ගත්තු හැටි මට හොඳට ම මතකයි. ඉතින් මාර්ගරි ලූසීව මේ ඉස්කෝලෙ ම තියා ගන්න අපි මොනවද කරන්න ඕනෑ කියලා ඔයාට කියන්නම්කෝ."

විදුහල්පතිනිය මාර්ගරි දෙසට හැරී ඇසුවා ය.

"මිස් තියෝබෝල්ඩ් ඔයා කොච්චර හොඳට මේ ඉස්කෝලේ පාලනය කරනවද කියලා අපි හැමෝ ම හොඳට දන්නවා."

මාර්ගරිගේ මුහුණ ප්‍රීතියෙන් රතු වෙයි.

"ඒ වුණාට අපේ ඉස්කෝලේ ළමයි අතර ලූසී මොන තරම් ජනප්‍රිය කෙනෙක් ද කියලා ඔයා හරියට ම දන්නේ නෑ. මෙච්චර කාලෙකට මට හම්බ වෙච්ච හොඳ ම යාලුව දිගට ම ඉස්කෝලේ තියා ගන්නේ කොහොමද කියලා මම හැම වෙලාවෙ ම කල්පනා කෙරුවා. එතකොට තමයි මට මේ අදහස ආවේ. ඇත්තට ම මේක හොඳ අදහසක් නේද මිස් තියෝබෝල්ඩ්?"

"ඔව්.... මාර්ගරි..... හැබැයි ඒක මොන තරම් සාර්ථක වෙයිද කියල නම් මට කියන්න බෑ."

මිස් තියෝබෝල්ඩ් බැරෑරුම් හඬකින් කීවා ය.

"හැබැයි ලූසීගේ පුංචි මොළයට ඕනෑවට වඩා බරක්



පටවන්න නම් මම කැමති නෑ. එයා පාස් වෙයි ම කියලා ස්ථිර විදිහට ම හිතාගන්නේ නැති ව එයාට ශිෂ්‍යත්ව විභාගෙට ඉදිරිපත් කරන්න මට බෑ. මොකද එයාට තව අවුරුදු දෙකක් ම තියෙනවා. මිස් වෝකරුත් ලූසී ගැන යෝජනා කිහිපයක් ම ගෙනාවා. අපි ඒ ගැනයි කථා කර කර හිටියේ."

"ආ..... අපේ මිස් වෝකර් ඔයා කොච්චර හොඳ කෙනෙක්ද?"

මාර්ගරි කීවා ය. එහෙත් ඈ මීට පෙර නම් චිත්‍ර ගුරුවරියට එතරම් කැමැත්තක් දක් වූයේ නැත. වෙනකක් තබා මිස් වෝකර්ගේ හරිම ප්‍රිය මනාප චිත්‍ර පංතියට ඇතුළු වෙන්නටවත් මාර්ගරි කැමති වූයේ නැත. එහෙත් දන් ඈ ලූසී ගැන කරුණාවෙන් සලකයි. ඒ නිසා මිස් වෝකර් ගැන සාවධානයෙන් සිතා බලන්නට මාර්ගරිගේ සිත ලිහිල් ව ඇති සෙයකි.

"ඉතින් මෙන්න මේකයි මගේ අදහස. අපි කොහොම හරි අවුරුදු දෙකක් යනකම් ලූසීව මේ ඉස්කෝලේ තියා ගත්තොත් එයාට කලා ශිෂ්‍යත්ව විභාගෙට ඉදිරිපත් කරන්න පුළුවන්."

මිස් වෝකර් තමාගේ හිතේ ඇති අදහස ඉදිරිපත් කරන්නට වූවා ය.

"එයාගේ චිත්‍ර හරි ම විශිෂ්ටයි. ඒ හින්දා කලා ශිෂ්‍යත්වයක් දිනා ගන්න එච්චර ම අමාරු නෑ. ඊට පස්සේ ලූසීට අපේ රටේ තියෙන හොඳ ම කලා විද්‍යාලයකට ඇතුළු වෙන්න පුළුවන්. අනික ටයිපින්, ෂෝර්ට් හැන්ඩ්, වගේ දේවල් ඉගෙන ගත්තොත් ලිපිකරු රස්සාවක් හොයා ගන්න වුණත් ලූසීට අමාරු වෙන එකක් නෑ."

"අපි දැනටමත් අඩු ගාස්තු යටතේ අවුරුදු දෙකක් ඉගෙන ගැනීමේ අවස්ථාව ලූසීට දීලා තියෙනවා. ඒ නිසා එයාට කලා ශිෂ්‍යත්වයට ඉදිරිපත් වෙන එක ගැන උනන්දු වෙන්න පුළුවන්. ඒ වුණාට එයාගේ දෙමව්පියන් දැන් ඒ ගැන එච්චර ම හිතන්නේ නෑ. ඇත්තට ම මේ වෙලාවේ ලූසීට අපි ගොඩාක් උදව් කරන්න ඕනෑ. මොකද එයාගේ තාත්තට චිත්‍ර අඳින්න බැරි නිසා ඒ අය දැන් හරි ම අසරණ වෙලයි ඉන්නේ."

"මිස් තියෝබෝල්ඩ් ලූසීට තව එක ම වාරයක් ඉගෙන ගන්න දීලා ශිෂ්‍යත්ව විභාගෙට ඉදිරිපත් වෙන්න අවස්ථාවක් අරන් දෙන්න බැරිද?"

මාර්ගරි නැවතත් උනන්දුවෙන් ඇසුවා ය.

"ශිෂ්‍යත්වය දිනා ගත්තොත් තව අවුරුදු දෙක තුනක් ලූසීට මෙහේ ඉන්න පුළුවන්. එතකොට කලා ශිෂ්‍යත්වයට ඉදිරිපත් වෙන්නත් ලූසීට අවස්ථාවක් ලැබෙනවා."

"හොඳයි මාර්ගරි...... කරන්න පුළුවන් මොනවද කියලා අපි බලමුකෝ. මේ යෝජනා ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා මම තව ටිකක් කල්පනා කරන්න ඕනෑ. ඒ විතරක් නෙවෙයි. අනික් ගුරුවරියන් එක්ක කථා කරන්නත් ඕනෑ. අපි මොනව හරි දෙයක් තීරණය කෙරුවොත් ඔයාටත් ඒ ගැන කියන්නම්කෝ. හොඳද මාර්ගරි? අනික වෙන කෙනෙකුට උදව් කරන්න ඔයා හරි ම උනන්දු වෙනවා කියලා මට තේරෙනවා. ඒ ගැනත් ඔයාට ස්තුතියි. අනික ඔයා සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙට ආපු එක ගැනත් අපිට සතුටුයි. ඔයාට උදව් කරන්න අපිට පුළුවන් වෙයි."



# අඳුරු වළාවක රිදී රේඛාවක්

කිහිලි කරුවලට වාරු දෙමින් මාර්ගරි කාමරයෙන් එළියට ඇවිද ගියා ය. ඇගේ මුහුණ කිසියම් බලාපොරොත්තු සහගත හැඟීම් සමුදායකින් ඔපවත් වී තිබේ. සත්තකින් ම මේ හැම දෙයක් ම ලූසී වෙනුවෙනි. එහෙත් තමා විදුහල්පතිනියට යොමු කළ අදහස පිළිබඳ ව මාර්ගරි වෙන කිසිවෙකු සමඟ වචනයක් හෝ කථා නොකළා ය. මේ ගැන ලූසීට කියන්නට මාර්ගරිට ලොකු ඕනෑකමක් තිබුණ ද එයට ද අවස්ථාවක් උදා වුණේ නැත.

"මිස් තියෝබෝල්ඩ් මගේ යෝජනාව ගැන හොඳට හිතල බලයි. ඒක මට සහතිකයි."

මාර්ගරි තනි ව ම සිතමින් පංතිය හරහා බැල්මක් හෙළුවා ය. දුකෙන් බර වුණ ලූසීගේ ප්‍රියමනාප කුඩා මුහුණ ඇ දුටුවේ ඒ වෙලාවේදී ය. ලූසී යනු ඉතා ම උත්සාහවන්ත දැරියකි. එහෙත් මේ වෙලාවේදී ඇගේ සිත දුකින් බර ව තිබේ. ඇයට සිදු ව ඇත්තේ මොන තරම් අවාසනාවන්ත දෙයක් ද? ලූසීගේ දීප්තිමත් අනාගතය දැන් මුළුමනින් ම අවාසනාවන්ත තත්වයකට පත් ව ඇත.



Scanned with CamScanner

මාර්ගරිට පොරොන්දු වූ ආකාරයට ම මිස් තියෝබෝල්ඩ් ක්‍රියා කර තිබිණි. ඇ මුලින් ම පළමු, දෙවැනි සහ තෙවැනි වාරවල ගුරුවරියන් සමඟ මේ ප්‍රශ්නය ගැන කථා කරන්නට තීරණය කළා ය. මැඩමොසෙල්, මිස් ලුවිස්, සහ ඉතිහාස ගුරුවරිය ද මේ සාකච්ඡාවට එකතු වී සිටියහ. මාර්ගරි ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ ව විදුහල්පතිනිය කෙටියෙන් විස්තර කළා ය.

ඉන් පසු ව ගුරුවරියන් සියලු දෙනා ම ඒ කාරණය පිළිබඳ ව කතා කරන්නට වූහ. සෑම ගුරුවරියක් ම ලූසී ඔරිල්ට කැමති ය. එමෙන් ම ඇගේ නුවණක්කාර කම හා දක්ෂතාවය ගැන හැම දෙනා ම ප්‍රසාදයට පත් ව සිටියහ. ශිෂ්‍යත්ව විභාගයට අදාල ඉතිහාස පාඩම ලූසීට ඉගැන්වීමට මිස් ලුවිස් එක් වර ම කැමති වූවා පමණක් නොව ලූසීට විභාගයෙන් සමත් වීමට හැකි බවට ද විශ්වාසය පළ කළා ය.

"ලූසීගේ ප්‍රංශ දැනුමත් හරි ම හොඳයි." මැඩමොසෙලුත් කීවා ය.

"එයා ප්‍රංශයේ සෑහෙන කාලයක් ඉඳලා තියෙනවා. ඒ නිසා ලූසි මම වගේ ම හොඳට ප්‍රංශ භාෂාව කථා කරනවා."

ලූසීට මදක් හෝ අපහසු වූයේ ගණිත පාඩමයි. එහෙත් ලූසීගේ විශ්මිත මතකය නිසා ම ගණිතය ද ඇයට එතරම් අමාරු නොවන බවට ගුරුවරියන් හැම දෙනා ම විශ්වාස කළහ. කෙසේ වුව ද මිස් තියෝබෝල්ඩ් අති දක්ෂ ගණිත ගුරුවරියකි. ඒ බව දැනගෙන සිටියේ ද කිහිප දෙනෙකි.

"මම ලූසිට ගණිතය උගන්වනවා." මිස් තියෝබෝල්ඩ් එක් වර ම කීවා ය.



"මේ ළමයා අමාරුවක වැටිලා. අපි එයාට උදව් කරන්න ඕනෑ. මුළු දවස ම ඉස්කෝලෙ ම ගත වෙන හින්දා මට උගන්වන්න වෙලාවක් නෑ. ඒ වුණත් මම ලූසී ඔරිල් වෙනුවෙන් කොහොම හරි වෙලාව හොයා ගන්නවා."

හරියට ම පැයකට පසු ව රැස්වීම නිමා වූ අතර ගුරුවරියන් ඔවුන්ගේ කාමරවලට නික්ම ගියහ. ගුරුවරියන් පැමිණෙන්නේ මිස් තියෝබෝල්ඩ්ගේ කාමරයේ සිට බව මාර්ගරීට රහසක් නොවේ. ඇත්තෙන් ම ඔවුන් ලූසි ගැන ගත්තේ මොන වගේ තීරණයක් ද? එය දැන ගැනීම සඳහා මාර්ගරීගේ සිතේ ඇත්තේ බලවත් නොඉවසිල්ලකි. වැඩි වෙලාවක් ගත වෙන්නට පෙර මාර්ගරීට ඒ තීරණය දැනගත හැකි විය.

"හොඳයි මාර්ගරි, අපේ තීරණය මොකක්ද කියලා ඔයාට කියන්නම්කෝ."

මිස් තියෝබෝල්ඩ් එක් වර ම කථා කළා ය.

"අපි ලූසිගේ අනාගතය ගැන ගොඩාක් සාකච්ඡා කළා. ඇත්තට ම ඔයාගේ යෝජනාව ගොඩාක් හොඳ එකක් කියලත් අපි තීරණය කෙරුවා. ඉතින් ලූසීට ශිෂ්‍යත්ව විභාගය පාස් වෙන්න පුළුවන් කියලත් අපිට විශ්වාසයි. අපි ඉස්සර වෙලා ම ලූසිගේ දෙමාපියන්ට මේ ගැන දන්වලා ඒ අයගේ අදහස දැන ගන්නවා."

ඊළඟ දවසේදී ඔරිල් මහත්මිය, විදුහල්පතිනියට දුරකථනයෙන් ඇමතුවා ය. මිස් තියෝබෝල්ඩ්ගේ අදහස ගැන ඇ ඉතා දැඩි ව සතුටට පත් ව සිටියා පමණක් නොව එයට අනුමැතිය ද ලබා දුන්නා ය. සෙන්ට් ක්ලෙයාර් පාසලේ දිගට

ම නතර වන්නට ලූසී ඉතා ම දැඩි කැමැත්තෙන් සිටින බව ද ඔරිල් මහත්මිය දැනගෙන සිටියා ය. යම් හෙයකින් ලූසී ශිෂ්‍යත්ව විභාගයෙන් පාස් වුවහොත් ඇයට දිගට ම පාසලේ රැඳී සිටීමට හැකි බවත් ඉන් පසු ව ඇයට චිත්‍ර විද්‍යාලයට ඇතුල්වීමට හැකි වෙන බවත් ලූසීගේ මව සිහිපත් කළේ උතුරා යන සතුටිනි. සැබැවින් ම එය මොන තරම් අගනා උපකාරයක් ද?

"ඔයා ඒ විදිහට හිතපු එක ගැන මට හරි ම සන්තෝසයි මිසිස් ඔරිල්. අනික ඒ ගැන ඉක්මනට දන්වපු එක ගැනත් ඔයාට ස්තූතියි. මම මේ ගැන අද රෑට ලූසී එක්ක කථා කරන්නම්."

මිස් තියෝබෝල්ඩ් එසේ කීවේ උතුරා යන සතුටිනි. එදා රෑ ම ලූසීට විදුහල්පතිනියගේ යෝජනාව ගැන දැනගත හැකි විය. ඈ ඒ කථාව අසා සිටියේ ප්‍රීතියෙන් මුකුලිත වූ දෑසින් යුතු ව යි. ඉතා ම අවාසනාවන්ත සිදුවීමකට පසු ව ඇති වූයේ පුදුමාකාර සතුටකි.

"ආනේ මිස් තියෝබෝල්ඩ් ඔයාට ගොඩාක් ස්තූතියි."

ලූසී සතුටින් දොඩමළු වූවා ය.

"මම පුළුවන් තරම් හොඳට ඉගෙන ගන්නවා කියලා පොරොන්දු වෙනවා. නිවාඩු දවස්වල විතරක් නෙවෙයි අනිත් හැම දවසෙ ම ගොඩක් මහන්සි වෙලා පාඩම් කරන්නත් මට පුළුවන්. මම කොහොම හරි මේ ශිෂ්‍යත්වය දිනාගෙන සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලෙ ම දිගට ම ඉන්නවා. මේ ඉස්කෝලෙන් යන්න වෙනවා කියලා හිතනකොට මට වාවගන්න බැරි දුකක් ඇති වුණා. හැබැයි දැන් නම් මගේ හිතට දැනෙන සතුට කියලා නිම කරන්න බැරි තරම්."



"හොඳයි........ දැන් ඉතින් හැම දෙයක් ම හරිනේ."

මිස් තියෝබෝල්ඩ්ගේ කට හඬ ද සැහැල්ලුවෙන් පිරී තිරී ගොසිනි.

"මේ හැම දෙයක් ගැන ම අනිත් ගුරුවරියොත් එක්කත් කථා කළා ලූසී. ඒ හැම දෙනා ම ඔයාට වැඩිපුර උගන්වන්න පොරොන්දු වුණා. අනික මම ඔයාට ගණිතය උගන්වනවා. අපි ඒ පාඩම මේ සතියෙ ම පටන් ගනිමු. ඒ විතරක් නෙවෙයි ලූසී. මම ඔයා වෙනුවෙන් විශේෂ කාල සටහනකුත් හදනවා. මොකද දැන් ඔයාට වැඩිපුර දේවල් ඉගෙන ගන්න වෙනවා. මේක ඔයාට ලැබෙන හරි අපූරු අවස්ථාවක්. මෝඩකම් නැති ව ගොඩක් මහන්සි වෙලා ඉගෙන ගන්න ඔයාට සිද්ධ වෙනවා. හොඳද? අනික ගොඩාක් මහන්සි වෙන කොට ඔයාගේ හිතට විවේකය අරන් දෙන්න පුළුවන් මාර්ගරිට විතරයි. ඉතින් මම මේ ගැන මාර්ගරිත් එක්කත් කථා කරනවා."

"ආ.... ඇත්තට මාර්ගරි මොන තරම් සතුටු වෙයිද? ඔක්කොට ම ඉස්සර වෙලා ගිහිං මම මේ ගැන එයාට කියන්න ඕනෑ."

ලූසී නැවත වතාවක් සතුටින් බෙරිහන් දුන්නා ය.

"ඔව්..... දැන් ම ම ගිහින් මාර්ගරිව හොයා ගන්න. මේ ආරංචිය ඇහුව ම එයා හරියට සතුටු වෙයි."

මිස් තියෝබෝල්ඩ් කීවා ය. එසැනින් ම ලූසී, මාර්ගරී සොයා දිව ගියා ය. ටික වෙලාවකින් විවේක කාමරයේ තවත් ළමයින් දෙතුන් දෙනෙකු සමඟ සිටින මාර්ගරී සොයා ගැනීමට ඇයට හැකි විය. ලූසී තමාගේ හිතවතිය වැළඳ ගත්තේ දරාගත නොහැකි ප්‍රීතියකිනි.

"මාර්ගරී...... මේ අහන්නකෝ. හරිම සතුටු හිතෙන ආරංචියක් කියන්න තියෙනවා. මම දිගට ම සෙන්ට් ක්ලෙයාර් ඉස්කෝලේ ඉන්නවා කියලා කිව්වොත් ඔයාට පුදුම හිතෙන්නේ නැද්ද?"

ලූසීගේ මුහුණේ මෙන් ම කට හඬෙහි ද සතුට උතුරා ගලා යමින් තිබේ.

"ආනේ ලූසී. ඒ කියන්නේ ඔයාට ශිෂ්‍යත්ව විභාගෙට ලියන්න අවසර ලැබුණා. එහෙම නේද?"

එසේ කියූ මාර්ගරී තමාගේ හොඳ පාදයට බර දී රවුමක් කැරකුණා ය. ඇගේ හිතට දනෙන ප්‍රීතිය නිමක් නැත.

"ඔව්...... ඒක නෙවෙයි මාර්ගරී. ඔයා කොහොමද මේ හැම දෙයක් ම දන්නේ?"

ලූසීගේ කට හඬ පුරා ම පුදුමය මෙන් ම විශ්මය ද ඉතිරී ඇත.

"ඒ කොහොමද දන්නවද ලූසී. ඔය යෝජනාව මිස් තියෝබෝල්ඩ්ට ඉදිරිපත් කෙරුවේ මම. හැබැයි ඒ සැලැස්ම හරි යනකම් ඔයත් එක්ක වචනයක්වත් ඒ ගැන කියන්නේ නෑ කියලත් මම හිතා ගත්තා. බැරිවෙලාවත් මගේ සැලැස්ම හරි ගියේ නැති නම් ඔයාට දුක හිතෙනවා. ඒ නිසයි මම ඔයාට මේ ගැන කිව්වේ නැත්තේ. කොහොම වුණත් දැන් හැම දේ ම හරිනේ. මගේ හිතට දනෙන සතුට ගැන කියලා නිම කරන්න බෑ ලූසී. ඇත්තමයි."

"ඇත්තට ම ඔයා මොන තරම් හොඳ යාළුවෙක් ද මාර්ගරී."



මාර්ගරීගේ ශක්තිමත්, ප්‍රියමනාප මුහුණ දෙස පුදුමයෙන් බලා සිටින ගමන් ලූසී කීවා ය.

"ඔයා වගේ යාලුවෙක් ඉන්න එක මගේ වාසනාවක්. මම අමාරුවේ වැටිලා ඉන්න වෙලාවේ ඔයා කරපු මේ උදව්ව මම ජීවිතේට ම අමතක කරන්නේ නෑ. මම ජීවත් වෙලා ඉන්නකම් ඔයාගේ කරුණාවන්ත කම ගැන මට මතක් වෙයි."

"මෝඩ ළමයෙක් වෙන්න එපා ලූසී. ඔයා විතරක් නෙවෙයි. මමත් වාසනාවන්තයි. ඒ මොකද දන්නවද? දැන් මට ඔයත් එක්ක තවත් සෑහෙන කාලයක් මේ ඉස්කෝලේ ඉගෙන ගන්න පුළුවන්. එක ම වෙනස තමයි ඔයාට දැන් ගොඩාක් මහන්සි වෙලා ඉගෙන ගන්න වෙන එක. ඔන්න අමතක කරන්න එපා. මමත් ඔයා ඉගෙන ගන්න එක දිහා හොඳට බලාගෙන ඉන්නවා හොඳද?"

"මොන තරම් හිතා යන වැඩක් ද මේ? ඒකත් මිස් තියෝබෝල්ඩ් ඔයාට පවරපු වැඩක් ද?"

ලූසීගේ සිනාවෙන් විවේක කාමරය ම දෙවනත් වෙයි.

"ඉස්කෝලේ ගුරුවරු මට වැඩියෙන් උගන්වන්න හිතාගෙන ඉන්නවා. ඔයා මාව වැඩියෙන් බලාගන්න හිතාගෙන ඉන්නවා. හරි ම අපූරු වැඩක් නේ."

"ළමයි.... මොකක්ද සිද්ධ වෙලා තියෙන්නේ?"

විවේක කාමරයේ කොණක සිටි පැට්, ලූසී සහ මාර්ගරීගේ කථා බහ දෙස විමසිලිමත් ව බලා සිට එසේ ඇසුවා ය.

"ඔයාලා දෙන්න ඔච්චර සන්තෝසෙන් කථා වෙන්නේ

මොනව ගැනද? මොකද මැඩමොසෙල්ගෙන් ගොඩක් හොඳයි කියලවත් අහ ගත්තද?"

"මේ වගේ දවස් වල එහෙම දෙයක් ගැන හිතන්නටවත් බෑ."

මාර්ගරී කීවා ය. සැබැවින් ම මැඩමොසෙල්ගේ පාඩමකට "ඉතා හොඳයි" යන වචනය කිසි දිනෙක හෝ ලබාගත නොහැකි තරම් අසීරු දෙයකි.

"මේක ඒකට වඩා අපූරු ආරංචියක්. ලුසී තව දුරටත් අපේ ඉස්කෝලේ ඉන්නවා. ඒ කොහොමද දන්නවද? තුන්වෙනි වාරයේ අන්තිමට තියෙන ශිෂ්‍යත්ව විභාගෙට ලුසී මේ වාරයේ අන්තිමට පෙනී සිටිනවා. ඉතින් ලුසී ඒ විභාගෙන් පාස් වුණොත් දිගට ම සෙන්ට් ක්ලෙයාර් එකේ ඉන්න පුළුවන්."

සියලු ම ගැහැණු ළමුන් එකැනට රොක් වී තමන්ගේ හිතේ තිබූ සතුට ප්‍රකාශ කරන්නට වූහ. ලුසීගේ හිතට නැවතත් ප්‍රීති සහගත හැඟුම් ඇතුළු වේ. මෙතරම් හොඳ මිතුරියන් පිරිසක් සිටීම මොන තරම් වාසනාවක් ද? තම පියාගේ දකුණත ආබාධයට ලක් නොවී තිබුණා නම් ඒ ප්‍රීතිය දෙගුණ තෙගුණ වී ඇගේ සිතට දනෙනු නොඅනුමාන ය.

"ලුසී....... ඔයාට කියන්න දෙයක් තියෙනවා." එදා ඒ නින්දට යාමට පෙර මාර්ගරී, ලුසී සමඟ කථාවකට මුල පිරුවා ය.

"දෙවියනි..... තවත් සැලැස්මක් එහෙම නෙවෙයි නේද?"

ලුසී සිනාසෙමින් ම ඇසුවා ය.

"ඔව්...... ඒ සැලැස්ම මම ගැන. මේ පාර ඔයාට ඒ



සැලැස්ම අදාළ නෑ." මාර්ගරීගේ කට හඬට කිසියම් බැරෑරුම් බවක් එක් ව තිබේ.

"මට දැන් වයස අවුරුදු දාසයක් කියලා ඔයා දන්නවනේ. ඉතින් ඉස්කෝලේ පහළ පංතියක ඉගෙන ගන්න මට අයිතියක් නෑ. ඒ වුණාට මම ඉස්කෝල කිහිපෙකින් ම අයින් කරපු නිසා මට හරියට ඉගෙන ගන්න බැරි වුණා. ඒ වුණාට මගේ මොළේ එච්චර ම නරක නෑ කියලා මට හොඳට ම විශ්වාසයි. ඉතින් අනිත් දේවල් වගේ ම මගේ මොළෙත් හොඳට පාවිච්චි කරන්න ඕනෑ කියලා මම හිතුවා. මමත් හොඳට ඉගෙන ගන්නවා ලුසී. මට ඔයාගේ උදව්වත් ඕනේ."

"නියමයි මාර්ගරී....... ඒක නම් හරි ම අපූරු අදහසක්."

ලුසී එක් වර ම කීවා ය.

"ශිෂ්‍යත්ව විභාගේ පාස් වුණොත් අනිත් පංතියට යන්න පුළුවන් වෙයි කියලා මට හිතෙනවා. ඉතින් ඔයත් මහන්සි වෙලා ඉගෙන ගත්තොත් අපි දෙන්නට ම එක පංතියකට යන්න පුළුවන්. ඒ හින්දා ගොඩාක් මහන්සි වෙලා ඉගෙන ගන්න මාර්ගරී. මමත් ඔයාට උදව් කරන්නම්.

මේ ආරංචිය ඇසූ හැම ගුරුවරියකට ම හරි ම පුදුම හිතුණා. පළමු වාරයේ සිටි ශක්තිවන්තම ගැහැණු ළමයා මාර්ගරී පෙන්වෝර්දි ඇගේ මොළයේ ශක්තිය උපරිම විදිහට පෙන්වන්න උත්සාහ ගන්නවා. සතියක් ගත වෙන කොට ඇගේ දක්ෂකම් හැම දෙනාට ම දක ගන්න පුළුවන් වුණා. ඈ දැන් ලුසි තරම් ම දක්ෂ සිසුවියක් බවට පරිවර්තනය වෙලා.

"ප්‍රාතිහාර්ය සිද්ධ වෙන්නේ කවුරුවත් ම හිතපු නැති වෙලාවට."

පංතියේ ප්‍රශ්න පත්‍රවල ලකුණු සටහන් කරන ගමන් මිස් රොබට් කීවා ය. ඇගේ මුහුණේ ප්‍රීතිය සමඟ සුන්දර සිනාවක් පිරී තිබේ.

"මාර්ගරි ඇත්තට ම ඔයා හිතා ගන්න බැරි තරම් දක්ෂ ළමයෙක්. මට හරි ම සන්තෝෂයි ඒ ගැන. ඩොරිස්, මාව ඊළඟට පුදුම කරන්න ඕනෑ ඔයා. දැනට පංතියේ අන්තිමයා වුණාට මාර්ගරියි, ලුසියි එක්ක පංතියේ පළවෙනියා වෙන්න ඔයාට බැරි වෙන එකක් නෑ, තේරුණාද ඩොරිස්.?"

මිස් රොබට්ගේ කථාවට ඩොරිස් පමණක් නොව මුළු පන්තිය ම හඬ නගා සිනාසුන හ. සැබැවින් ම පළමු වාරයේ අන්තිම සති කිහිපය මොන තරම් ප්‍රීතිමත් වේදැයි කාට නම් කිව හැකිද?



# ජැනට්ගේ දඟකාර කම් නැවතත්.

**ත**ත්ත්වය මෙසේ වුව ද මැඩමොසෙල්ගේ තත්වය නම් ඒ සතිය පුරා ම එතරම් හිතකර වූයේ නැත. ඇගේ හිත හැම වෙලාවේ ම නොසන්සුන් ව තිබූ අතර මැඩමොසෙල්ට නිතර ම කේන්ති ගියේ ය. ඒ කේන්තිය බොහෝ විට පිට ව ගියේ ගැහැණු ළමයින් වෙතටයි. මැඩමොසෙල්ගේ අකාරුණික බැනුම් වලට ඔවුහු නිතර ම ලක් වූහ.

මේ ඇනුම් බැනුම් වලින් වැඩි පුර ම වෙහෙසට පත් ව සිටියේ ජැනට් ය. ඇයට ද වැඩිපුර කේන්ති යන නිසා තත්වය තවත් නරක අතට හැරී තිබිණි. මැඩමොසෙල්ගේ ඇනුම් බැනුම් වලට ලක් වූ ජැනට් ඉවසා දරාගෙන සිටියේ ඉතා ම අපහසුවෙනි.

"ආ..... ජැනට් ඔයා ආයෙත් ඒ වැරැද්දම කරලා. මේ වාරෙට මේ වැරැද්ද සිය පාරකට වඩා කරන්න ඇති. මට ඒ ගැන සහතිකයි. ඔයා වගේ මෝඩ, වගකීමක් නැති කෙල්ලන්ට උගන්වන එක මට එපා වෙලා තියෙන්නේ."

ජැනට්ගේ පොත පැත්තකට විසි කර දමන ගමන් මැඩමොසෙල් එක් දිනෙක කෝපයෙන් බෙරිහන් දුන්නා ය.

"ඇත්ත..... මටත් මේ විදිහට ඉගෙන ගන්න එපා වෙලයි තියෙන්නේ."

ජැනට් ද කෝපයෙන් මිමිණුවා ය. ජැනට් ඒ දෙය කීවේ ඉතා ම සෙමින් වුව ද එය මැඩමොසෙල්ගේ දෙකන් පෙති වලට හසු විය. ඈ ජැනට් දෙස කෝපයෙන් දිළිසෙන දෑස් වලින් බලා සිටියේ ඒ නිසාය.

"ජැනට්..... මොකක්ද ඔයා කිව්වේ? කරුණාකරලා ඒක ආයෙමත් කියනවද?"

මැඩමොසෙල්ගේ බෙරිහන් දීම ඇසුණු සැනින් මුළු පංතිය ම මීයට පිම්බාක් මෙන් නිහඬ වූයේ ය. මැඩමොසෙල් කෝපයෙන් මුසපත් ව සිටින්නී ය. ඒ කෝපය ජැනට් කෙරේ යොමු ව තිබීම මොන තරම් අවාසනාවක් ද?

එහෙත් කවුරුවත් විශ්වාස නොකරන තරම් වේගයකින් ජැනට් ඒ වචන පෙළ නැවත වතාවක් කිවා ය.

"මටත් මේ විදිහට ඉගෙන ගන්න එක එපා වෙලා කියලයි මම කිව්වේ."

"ඇත්තට ම මේ පන්තියේ ළමයින්ට මොනව වෙලාද? ඔයාලා හැමෝ ම තපුරු, කිසි ම වගකීමක් නැති, තකතීරු කෙල්ලෝ ටිකක්."

මැඩමොසෙල්ගේ කෝපය දෙගොඩ තලා ගලා යනවා. මේ සිදුවීම වූයේ මැඩමොසෙල්ගේ ම වරද නිසා බව පංතියේ ළමුන් දන්නවා. එය ඔවුන්ගේ වරදක් නොවේ. මැඩමොසෙල් ඉක්මනින් ම කෝන්ති ගන්න නිසයි මේ හැම දෙයක් ම සිද්ධ වුණේ. පංතිය ම කිසිදු කථාවක් නොමැති ව, නිහඬ ව බලා



සිටි අතර ලුසි පවා මැඩමොසෙල්ගේ දිළිසෙන දෑස මග හරිමින් බිම බලාගෙන සිටියා ය.

"ජැනට්...... මේ ඇහුණද? මේ පොතේ තියෙන ප්‍රංශ කවි හැම එකක් ම ඔයා ඉගෙන ගන්න ඕනැ. ඒ විතරක් නෙවෙයි. ඒ කවි හැම එකක් ම තුන් පාර ගානේ මට ලියලා දෙන්න ඕනැ. ඒක තමයි ඔයාට ලැබෙන දඬුවම තේරුණාද?"

මැඩමොසෙල් ගැඹුරු හඬකින් කිවා ය. ඇගෙ කට හඬ කෝපයෙන් වෙවුලයි. මුළු පංතිය ම නිහඬතාවයේ ගිලී ඇත. ඒ ප්‍රංශ කවි පිටු තුනක් පමණ දිග ය.

"අනේ මැඩමොසෙල්."

ජැනට් කලබලකාරී හඬකින් කෙඳිරුවා ය.

"මට ඒ වැඩේ කරන්න අමාරුයි කියලා ඔයා දන්නවා. ඒක මට ගොඩක් වෙලාවක් යන වැඩක්. අනික මම ප්‍රංශ කවි ඉගෙන ගන්න එච්චර දක්ෂ කෙනෙකුත් නෙවෙයි. පේලි හත අටක් ඉගෙන ගන්නෙත් හරි ම අමාරුවෙන්. ඉතින් මේ වගේ දෙයක් මට ලොකු දඬුවමක් නේද?"

"ඒ දඬුවම නින්දා ඔයා මට තපුරු විදිහට කථා කරන්න හිතුවොත් ඒ ගැන ඔයාට හිතන්න වෙනවා."

අනුකම්පා විරහිත හඬකින් එසේ කියූ මැඩමොසෙල් උපැස් යුවල ගෙන තමාගේ විශාල නාසය මත රඳවා ගත්තා ය. ඇගේ මුහුණ කෝපයෙන් රතු ව තිබූ අතර එය තොලුවසිලිමත් ලෙස එහාට මෙහාට සෙළවෙයි. දෙයියනේ මේ එංගලන්ත කෙල්ලෝ මොන තරම් නරකද? මීට පස්සර මැඩමොසෙල් මේ ගැහැණු ළමයින්ට කොතරම් කැමති වුණි



224

දැන් නම් ඒ කැමැත්ත පෙනෙන්නටවත් නැත.

මැඩමොසෙල්ගේ පංතියෙන් අනතුරු ව ජැනට් තමාගේ දඬුවම පිළිබඳ ව කෝපයෙන් කථා කරන්නට වූවා ය.

"ඒක සාධාරණ දඬුවමක් නෙවෙයි. මේ හැම දෙයක් ම වුණේ මැඩමොසෙල්ගේ වරදින්. අපි ගිය වාරේ වගේ ම මහන්සි වෙලා ඉගෙන ගන්නවා. ඒ ගැන සැකයක් නෑ. බලන්නකෝ ලුසී දිහා. එයා ප්‍රංශ භාෂාව මොන තරම් හොඳට ඉගෙන ගන්නවද? එහෙම තත්ත්වයක් තියෙන කොට මැඩමොසෙල් අපිට දොස් කියන එක හරි ම නරක වැඩක්."

"මේ වාරේ පුරා ම මැඩමොසෙල්ට ඔය විදිහට තරහ යයි ද?"

පුදුමයෙන් මහත් කර ගත් දෙනෙතින් යුතු ව ලුසී බයාදු කර ගත් හඬකින් ඇසුවා ය.

"දෙවියනේ එහෙම වෙන්නේ නැති වෙයි."

ජැනට් විශ්වාසය පළ කළා ය.

"මැඩමොසෙල්ට සාමාන්‍යයෙන් තරහ යනවා තමයි. හැබැයි මේ විදිහේ දරුණු විදිහට තරහ යනවා මම කවදාවත් ම දැකලා නෑ."

"ජැනට්...... මම ඔයාගේ කවිය එක පාරක් ලියලා දෙන්නම්. අද දවස ඇතුළත ඔය කවිය තුන් පාරක් ලියන්න ඔයාට කොහොමටවත් බෑ."

ජැනට් අසලට ආ කැත්ලීන් කීවා ය.

"ආනේ...... කැත් ඔයාට ගොඩක් ස්තුතියි. ඒක මට



ලොකු උදව්වක් වෙයි. මට දුන්නු දඬුවමට ඔයාලව හවුල් කරගන්න මම කොහොමටවත් කැමති නෑ. ඒ වුණාට මැඩමොසෙල් මට දුන්නේ ලේසියෙන් කරන්න පුළුවන් දඬුවමක් නෙවෙයිනේ."

කැත්ලීන්, ජැනට් වෙනුවෙන් එක් වරක් කවි පංතිය පිටපත් කොට දුන්නා ය. ශීලා තවත් එක් වරක් කවි පංතිය පිටපත් කළා ය. එහෙත් ශීලාගේ අකුරු ජැනට්ගේ අකුරු වලට සමාන නොවූ නිසා ඒ කවි පංතිය මකා දමා නැවත වතාවක් එය පිටපත් කිරීමට ජැනට්ට සිදු විය. මේ දුෂ්කර ක්‍රියාව නිසා ජැනට්ගේ සිතට දැනෙන ශෝකය සහ වේදනාව පංතියේ අනිත් ගැහැණු ළමයින්ට ද දැනෙන්නාක් මෙනි. ජැනට් කවි පංති පිටපත් කොට හමාර වෙන තෙක් ඔවුන් දුකින් බලා සිටියේ ඒ නිසා ය.

එදින රාත්‍රී හතට පමණ තමන් ලියූ කවි පංති ද ර ගෙන ජැනට්, මැඩමොසෙල් හමුවීම සඳහා ගියා ය. ඇ නොසැලකිලිමත් හඬකින් කවි පංති සියල්ල ම කියා නිම කළ ද ප්‍රංශ ගුරුවරිය දෙස එක් වරක් හෝ නොබැලූවා ය. මැඩමොසෙල් ගේ සිතෙහි වූ කෝපය අඩකින් පමණ නිවී ගොසිනි. ජැනට්ට මෙතරම් විශාල දඬුවමක් දීම පිළිබඳ ව ඇගේ සිතට ද කණගාටුවක් දැනෙමින් තිබෙන්නාක් මෙනි.

කෙසේ වුව ද ජැනට් මැඩමොසෙල්ට සිනාවකින් හෝ සංග්‍රහ කළේ නැත. කාමරයෙන් පිට ව එද්දී ඇයට සුබ රාත්‍රියක් යැයි ප්‍රාර්ථනා කරන්නට හෝ ජැනට්ගේ සිත කාරුණික වූයේ නැත.

"ආහ්..... මේ ඉංග්‍රීසි කෙල්ලන්ට කිසි ම හැදියාවක් නැති හැටි. මේ අය ප්‍රංශ ඉස්කෝලෙකට ගියොත් හොඳ දරුද

මොනවද, මහන්සි වෙලා ඉගෙන ගන්නේ කොහොමද කියන දේවල් ගැන හොඳට ඉගෙන ගනියි."

ජැනට් පිට ව ගියාට පසු ව මැඩමොසෙල් තනිවම කල්පනා කරන්නට වූවා ය.

තමාගේ ක්‍රියාව පිළිබඳ ව ජැනට් මැඩමොසෙල්ගෙන් සමාව නොගත්තා ය. ජැනට් යනු විවිධාකාර විහිලු කිරීමේ දක්ෂ කමක් ඇති ගැහැණු ළමයෙකු බව මුළු පාසල පුරා ම ප්‍රචලිත ය. මීට පෙර දිනයක පංති කාමරයේ ගිණි උඳුනට රතිඤ්ඤා විසිකොට මහා කලබැගෑනියක් සිදු වූ අන්දම සියලු දෙනාට ම මතක ය. මේ වාරයේදී ඇය කිසිදු දඟකාර කමක් නොකළා ය. එහෙත් වාරයේ අන්තිම සති දෙක තුන තුළදී මැඩමොසෙල්ට කිසියම් විහිලුවක් කිරීමට ජැනට් තීරණය කොට තිබූ බව කිසිවෙකුත් නොදත්හ. ඒ රහස ගැන අනිත් අය දැන ගත්තේ දින කිහිපයකට පසුවයි.

"මැඩමොසෙල් මට මේ විදිහට සලකන්න හිතෙනවා නම් එයා ලොකු වැරැද්දක් කරනවා. මම එයාට හොඳ පාඩමක් උගන්වන්නම්කෝ. මම මේ දවස්වල පොඩි වැඩක් ගැන කල්පනා කරනවා."

ජැනට් එක් දිනෙක තම යෙහෙළියන්ට කීවා ය. මේ ආරංචිය අහපු ගමන් ම පංතියේ හැම දෙනාගෙ ම සිත්වල කිසියම් චකිතයක් මෙන් ම සතුටක් ද දැනුණා. ජැනට් විහිලුවලට ම උපන් හපනෙකි. ඒ නිසා ඇ කරන විහිලුවලින් හොඳ සතුටක් ලැබෙන බව සියලු දෙනාට ම නොරහසකි. ඇත්තෙන්ම ජැනට් මෙවර කිරීමට සූදානම් වෙන්නේ මොකක් ද?

"ඔයාලා දන්නවද? අපි ගිය වාරේ ගිනි උඳුනට



රතිඤ්ඤා දමල සිද්ධ වුණ දේ."

පැට්, මාර්ගරිට සහ ලූසිට කීවා ය.

"ඇත්තට ම අපි ඒ විහිලුව කෙරුවේ මිස් කෙනඩිට. එයා තමයි මිස් ලුවිස් නිවාඩු ගිය දවස්වල අපිට ඉතිහාසය ඉගැන්නුවේ. එදා මිස් රොබට් පංතියට එනකොට ම ජැනට් රතිඤ්ඤා පනහක් විතර ගිනි උඳුනට විසි කෙරුවා. දෙවියනි.... ඊට පස්සේ මිස් රොබට්ගෙනුත් රතිඤ්ඤා වගේ ම සැර බැනුම් ගොඩක් අහන්න අපිට පුළුවන් වුණා."

"ජැනට් කරන්න හදන්නේ මොකක්ද කියලා මට නම් හිතාගන්නවත් බෑ."

ඩොරිස්, ජැනට් වැළඳ ගන්නා ගමන් ම කීවා ය. ඇ විහිලුවලට කොහොමටත් කැමති ය.

"පහුගිය නත්තල් නිවාඩුවට මම හරි අපූරු විහිලුවක් කෙරුවා. ඇත්තට ම ඒක කළේ මගේ ඥාති සහෝදරියකට. එයා තීන්ත භාජනේකින් හොඳටම නෑවා."

"ආ.... එහෙමනම් ඇයි ඔයා ඒ විහිලුව අපිට කරල පෙන්වන්නේ නැත්තේ? ආ ඔයා කියන්නේ මොකක්ද කියල මම දන්නවා. ඒක හරි අපූරු විහිලුවක්. ඔයා ළඟ ඒක තියෙනවද?"

ජැනට් කථා කරන්නේ ප්‍රීතියෙන් මුකුලිත වූ කට හඬකිනි.

"ඔව්...... ඇත්තට ම ඒ විශේෂ දේ මම ඉස්කෝලෙට අරන් ආවා කාට හරි හොඳ විහිලුවක් කරන්න හිතාගෙන. ඒ වුණාට මට දැන් ඒක තිබ්බ තැන හොයාගන්න බෑ. හැබැයි කොහේ හරි තැනක තියෙනවා කියලා මට හොඳට ම විශ්වාසයි.

ඩොරිස් එසේ කීවා ය.

"යන්න ඩොරිස්...... දැන් ම ම ගිහිල්ලා බලන්න. ඔව්.... දැන් ම ම බලන්න."

පැට්, ඩොරිස්ට ආයාචනා කළා ය.

"මීට ඉස්සර බලන්න බැරි වුණ තැනක ඒක තියෙන්න පුළුවන්. උදාහරණයක් විදිහට කියනවා නම් ඔයා කෑම ගෙනියන පෙට්ටියේ. මේ වාරේ පටන් ගත්තට පස්සේ ඔයා කෑම පෙට්ටිය ඇරියෙ ම නැහැනේ."

සැබැවින් ම ඩොරිස්ගේ හරි අපූරු දේ තිබුණේ ඇගේ කෑම පෙට්ටිය තුළමයි. ඈ එය තම හිතවත් යෙහෙළියන්ට පෙන්වූවා ය. ඩොරිස්ගේ විහිලුව ඉතා තුනී කඩදාසි පටියක් වැනි දෙයකි. එය පොතේ පිටුව මත ඇතිරූ වහා ම විශාල තීන්ත පැල්ලමක් පොත මත පතිත වෙයි. ඒ තුනී කඩදාසිය අයින් කළා. තීන්ත පැල්ලම නැති ව යයි.

"ජැනට්ගේ මුහුණ ප්‍රීතියෙන් මුකුලිත වූයේ නිමේෂයකිනි."

"ඒක නම් නියමයි. ඩොරිස්. අනේ මට ඒක දෙන්න. මට තමයි ඒක හොඳ."

"ඇත්තමද? ඔයා මොකක්ද මේකෙන් කරන්න හදන්නෙ?"

"හෙට වෙනකම් ඉවසන්නකෝ. එතකොට ඔයාලට බලාගන්න පුළුවන් වෙයි."

ජැනට් කීවා ය. පහුවදා ප්‍රංශ පාඩම පටන් ගන්නා තෙක් මුළු පංතිය ම බලාගෙන හිටියේ නොඉවසිල්ලෙන්. තවත් ටික වෙලාවකින් හැමෝ ම බලාපොරොත්තුවෙන් හිටපු මැඩමොසෙල් පංතියට ආවා.



මේ උදෑසන වෙන් ව තිබෙන්නේ ප්‍රංශ භාෂා ඒකාධිපතියා වෙනුවෙනි. එනම් මැඩමොසෙල් වෙනුවෙනි. ඇය උගන්වන්නේ ඒකාධිපතිනියක මෙනි. පංතියට පැමිණි මැඩමොසෙල් මුළු පංතිය පුරා ම විමසිලිමත් බැල්මක් හෙළුවා ය.

"හ්ම්..... ඔයාලගේ සටහන් පොත් අරගෙන මේ වාක්‍ය ටික ලියා ගන්න."

මැඩමොසෙල් ගැහැණු ළමයින්ට නියෝග කළා. ඔවුන් නිහඬ ව ම අභ්‍යාසය කරන්නට පටන් ගත්තා. තවත් ටික වෙලාවකට පසු ව නිවැරදි පිළිතුරු ලියූ සටහන් පොත් මැඩමොසෙල්ගේ අසලට රැගෙන යා යුතු ය. ගැහැණු ළමුන් එකිනෙකා තම තමන්ගේ අභ්‍යාස පොත් රැගෙන ගිය අතර මැඩමොසෙල් ඒවා පරීක්ෂා කොට හරි වැරදි ලකුණු කරන්නී ය.

දැන් එළැඹ තිබෙන්නේ ජැනට්ගේ අවස්ථාවයි. ඈ වහ වහා තම 'මැජික් කඩදාසිය' පොතේ පිටුව යටින් එලා මැඩමොසෙල් වෙත රැගෙන ගියා ය. ජැනට්ගේ අභ්‍යාස පොතේ හරි වැරදි ලකුණු කරන්නට මැඩමොසෙල් තමාගේ තීන්ත පෑන පොත මත තැබුවා පමණි. ඇගේ දෑස පුදුමයෙන් මහත් වූයේ නිමේෂයකිනි. ජැනට්ගේ හරි අපූරු අභ්‍යාස පොත මත අප්‍රසන්න, දිලිසෙන විශාල තීන්ත පැල්ලමක් පතිත වී තිබේ. එය සිදු වූයේ කෙසේද? මැඩමොසෙල් පුදුමයෙන් බලා සිටිද්දී ජැනට්ගේ වේදනාබර කට හඬ පංතිය පුරා රැව් දුන්නේ ය.

"අනේ මැඩමොසෙල් බලන්නකෝ ඔයා මගේ පොතට මොනවද කෙරුවේ? මගේ පොත ඉවරයි. ඔයාගේ පෑනෙන් තීන්ත වැක්කෙරෙනවා ඇති. මම මොන තරම් අමාරුවෙන් ද ඔය ප්‍රශ්න වලට උත්තර ලියුවේ."

මැඩමොසෙල් ජැනට් දෙස බැලුවේ පුදුමයෙනි. එමෙන් ම දුකෙනි. සිදු ව ඇත්තේ කුමක්දැයි මැඩමොසෙල්ට තමාගේ දෑස විශ්වාස කරන්නට නොහැකි ය.

"ජැනට්.... කොහොමද ඒක සිද්ධ වුණේ."

එසේ ඇසූ මැඩමොසෙල් තමාගේ තීන්ත පෑන දෙස පුදුමයෙන් බැලුවා ය. එහි කිසිදු වෙනසක් නැත. එසේ නම් ජැනට්ගේ පොතෙහි දැවැන්ත තීන්ත පැල්ලමක් ඇති වූයේ කෙසේද?

"පොඩ්ඩක් ඉන්න මැඩමොසෙල්. මම ඔය තීන්ත පැල්ලම මකලා දාන්නම්."

එසේ කියූ ජැනට් තමාගේ අභ්‍යාස පොත ඉතා ම ප්‍රවේශමෙන් රැගෙන ගියා ය. මුළු පංතිය ම මේ සිදුවීම දෙස බලා සිටියේ පුදුමයෙනි. ඒ අතර ගැහැණු ළමුන් තමන්ගේ මුවගින් පිටාර ගලන්නට වෙර දරන සිනාව වළක්වා ගැනීම සඳහා බලවත් වෙහෙසක් ගත්හ.

තමන්ගේ ආසනයට ගිය ජැනට් පොතේ පිටුව යට තිබූ මැජික් කඩදාසිය හොරෙන් ම ඉවත් කළා ය. ඒ සමග ම මෙතෙක් වෙලාවක් පොතේ පිටුව පුරා තිබූ අපිරිසිදු තීන්ත පැල්ලම අතුරුදහන් වූයේ ය. එහෙත් ජැනට් තීන්ත පැල්ලම මකා දමන්නට දැඩි වෙහෙසක් දරන බව හැමෝටම පෙන්නුවා ය. ඒ අතර මැඩමොසෙල් තමාගේ පෑන දෙස තව තවත් විමසිලිමත් ව බලන්නට විය. එක් වර ම තමාගේ පෑනෙන් තීන්ත විශාල ප්‍රමාණයක් ගලා ආවේ කෙසේදැ යි ඇයට සිතාගත නොහැකි ය.

තීන්ත පැල්ලම මකා දැමීමෙන් පසු ව ජැනට් නැවත



වතාවක් තමාගේ පොත මැඩමොසෙල් වෙතට රැගෙන ගියා ය. මොන පුදුමයක් ද? පොතේ තීන්ත පැල්ලමක් තිබුණා දැ යි සොයා ගැනීමටවත් බැරි තරම් පිරිසිදු ය. ඒ දුටු සැනින් මැඩමොසෙල්ගේ පුදුමය තව තවත් අළුත් විය.

"කෝ තීන්ත පැල්ලම? ජැනට් ඔයාට මේ තරම් හොඳට තීන්ත පැල්ලම මකන්න කොහොමටවත් බෑ."

උතුරා යන පුදුමයෙන් යුතු ව මැඩමොසෙල් ජැනට්ගෙන් ඇසුවා ය.

"මම ළඟ තියෙන තීන්ත උරන කඩදාසි හරි ම හොඳයි. මැඩමොසෙල්. ඒ කඩදාසිවලින් තීන්ත උරා ගන්නේ මැජික් වගේ."

ජැනට් බයාදු හඬකින් යුතු ව කීවා ය.

"ආ..... ඇත්තමද? ඒක මැජික් එකක් වගේ තමයි. දැන් ඔයාගේ ප්‍රශ්න ටික හොඳට පෙනෙනවා. ඇත්තට ම ඔයාගේ පොතේ තීන්ත හැලුණ එක ගැන මම හරි ම කණගාටුවෙනුයි හිටියේ. ඉතින් ඔයාට ගොඩාක් ස්තුතියි."

ඩොරිස් සහ කැත්ලීන්ගේ මුවහින් හීන් හිනා පොදක් පිටතට පැන්නේ ඒ වෙලාවේදී ය. මැඩමොසෙල් ඔවුන් දෙස තියුණු බැල්මක් හෙළා කෝපයෙන් කෑ ගැසුවා ය.

"මෙතැන හිනා වෙන්න තරම් දෙයක් වෙලා නෑ. තේරුණාද ළමයි?"

එසේ වුව ද සැබැවින් ම සිනාසීමට තරම් දෙයක් සිදු වී තිබිණි. එවර ජැනට් 'මැජික් කොළය' ඩොරිස්ගේ මේසය මත එළි තිබිණ ඒ නිසා මේසය පුරා ම ද අපිරිසිදු තීන්ත

පැල්ලමක් පතිත වී තිබෙන ආකාරය දක ගත හැකි ය. පුදුමයට පත් වූ මැඩමොසෙල් ඩොරිස්ගේ මේසය දෙස එබී බැලුවා ය. පුදුමයකි. ඩොරිස්ගේ මේසය මත ද තීන්ත පැල්ලමක් පතිත ව තිබේ.

"අනේ මැඩමොසෙල්. බලන්නකෝ ඔයාගේ කබල් පෑන හින්දා සිද්ධ වුණ දේ. මගේ මේසේ උඩ අපායක් වගේ වෙලා."

ඩොරිස් නෝක්කාඩුවක ස්වරයෙන් කියද්දී මැඩමොසෙල්, පුදුමයෙන් මෙන් ම අපහසුවෙන් ද වටපිට බැලුවා ය. මේ සිදුවන්නේ කුමක් ද? අද්භූත තීන්ත පැල්ලමක් තමාට වද දෙන සැටි. මැඩමොසෙල් පරීක්ෂාකාරී ව තමාගේ ෆවුන්ටන් පෑන දෙස බලා සිටිද්දී ඩොරිස් නැවතත් බෙරිහන් දුන්නා ය.

"මැඩමොසෙල් ඔයාගේ පෑන. පැත්තකට දමන්නකෝ. මේ බලන්න බිම හැම තැන ම තීන්ත පැල්ලම්. මැඩමොසෙල් මම ජැනට්ගේ මැජික් තීන්ත උරන කඩදාසිය ඉල්ල ගන්නද? පංතිය සුද්ද කෙරුවේ නැතිනම් මිස් රොබට්ගෙන් බැනුම් අහන්න වෙයි."

"මට නම් මේක තේරුම් ගන්න බැ. මීට ඉස්සර කවදාවත් ම මගේ පෑනෙන් තීන්ත හැලිලා නැ."

ඩොරිස්ගේ මේසය මත ඇති තීන්ත පැල්ලම දෙස බලන ගමන් මැඩමොසෙල් බයාදු හඬින් කීවා ය. තමා දකින්නේ සිහිනයක් ද යන සැකය ඇගේ සිතේ තෙරපෙයි.

ඒ සමග ම පංතිය පුරා කිසියම් හිනා හඬක් මෝරා වැඩෙද්දී මැඩමොසෙල්ගේ ඉවසීමේ සීමා පවුරු බිඳී ගියේ ය.



"තීන්ත පැල්ලමක් දකපු ගමන් මොකක්ද ඔයාලට ඇති වුණ සන්තෝසේ. හැමෝ ම නිශ්ශබ්ද වෙන්න. නැතිනම් මම මුළු පංතිය ම එළියට දමනවා."

මැඩමොසෙල්ගේ නෝක්කාඩු නිසා ම පංතිය මොහොතකට නිහඬ විය. ඒ අතර හිනා හඬ පිටතට යා නොදී සිටින්න බොහෝ ගැහැණු ළමයි තමන්ගේ අත් ලේන්සු තදින් ම විකාගෙන සිටියහ. තමන් කළ විහිලුව සාර්ථක වීම නිසා ජැනට් අතිශයින් ම සතුටට පත් ව සිටියා ය. එමෙන් ම ඈ තවත් විහිලුවක් සඳහා ද සැලසුම් සකස් කරන්නට වූවා ය.

"මැඩමොසෙල්ගේ කන්නාඩි දමන පෙට්ටිය ඇතුළට කුරුමිණියෝ දෙතුන් දෙනෙක් දම්මොත් කොහොමද? මම ඊළඟට කරන්නේ ඒ වැඩේ."

තේ පානයෙන් පසු ව විවේක කාමරයට රොක් වූ ගැහැණු ළමුන් දෙස බලා ජැනට් සිනාසෙමින් ම එසේ කීවා ය. අරුම පුදුම තීන්ත පැල්ලම් මවන ජැනට්ගේ මැජික් කඩදාසිය ගැන ඇසූ දෙවැනි වාරයේ ළමෝ ද අතිශය සතුටට පත් ව සිටිති.

"ජැනට්...... ඒ වැඩේ අමාරු නැද්ද? ඔයා කොහොමද කුරුමිණියෝ අල්ලා ගන්නේ? ඊට පස්සේ උන් මැඩමොසෙල්ගේ කන්නාඩි පෙට්ටියට දමන්නේ කොහොමද?"

නීලා, ජැනට්ගෙන් පැනයක් ඇසුවා ය.

"කුරුමිණියෝ කොහොම හරි අල්ල ගන්න කියමුකෝ. ඔයා කොහොමද උන් කන්නාඩි පෙට්ටිය ඇතුළට දමන්නේ."

ඒ පැනය පැටගෙනි. එය ඇසූ ජැනට් සැහැල්ලුවෙන් සිනාසුණා ය.

"ඒක හරි ම ලේසි වැඩක්. මැඩමොසෙල්ට හැම වෙලාවෙ ම එයාගේ කණ්ණාඩි පෙට්ටිය අමතක වෙනවා. ඉතින් මැඩමොසෙල් අපේ පංතියේ ඒක අමතක කරලා යන මුල් ම වෙලාවෙදි මම ඒකට කුරුමිණියෙක් දමනවා. උන් දකපුව ම මැඩමොසෙල් ඔමාන කරම් බය වෙයි ද කියලා මට නම් හිතා ගන්නවත් බෑ."

ජැනට් බලාපොරොත්තු වූ දේ සිදුවීමට එතරම් දවසක් ගත වූයේ නැත. ඊළඟ දවසේ ම මැඩමොසෙල් තමාගේ කණ්ණාඩි පෙට්ටිය පළමු වසරේ පංති කාමරය තුළ අමතක කර දමා තිබිණි. ජැනට් අතිකුත් ගැහැණු ළමයින්ට ඉහිමැරුවා ය ඉන් පසු ව වහ වහා මේසය අසලට ගිය ජැනට් මැඩමොසෙල් ගේ කණ්ණාඩි පෙට්ටිය අතට ගෙන සාක්කුවට ඔබා ගත්තා ය. ගණිත පාඩම ඉගැන්වීම සඳහා මිස් රොබට් පැමිණීමට පෙර මේ සියල්ල ම කිරීමට හැකි වීම ජැනට්ගේ වාසනාව නොවේද?

පංතියට ඇතුල් වූ වහා ම මිස් රොබට් පාඩම ආරම්භ කළා ය. ඉන් පසු ව මිනිත්තු හතරක පමණ කාලයක් නිහඬ ව ම ගෙවී ගියේ ය. ඉක්මන් ගමනින් පැමිණි දෙවැනි වසරේ ගැහැණු ළමයෙක් පංතියට ඇතුළු වූයේ ඒ වෙලාවේදී ය.

"සමාවෙන්න මිස් රොබට්. ඔයාට කරදර කරන්න සිද්ධ වුණ එක ගැන මැඩමොසෙල් හරියට කණගාටු වුනා. එයාගේ කණ්ණාඩි දෙක බැරි වෙලා ගිහින්. ඒක පංතියේ තියෙනවද කියලා බලන්නයි මම ආවේ."



මිස් රොබට් වහා ම විශාල මේසය පුරා පරීක්ෂාකාරී ව බැලුවා ය. එහෙත් ඇයට කණ්ණාඩි පෙට්ටියක් දක ගත නොහැකි විය. මැඩමොසෙල්ගේ කන්නාඩි පෙට්ටිය ජැනට්ගේ සාක්කුවේ තිබෙන බව කවරෙකු නම් සැක කරයිද?

"කෝ...... ඒක නැහැනේ. කිසි ම සැකයක් නෑ මැඩමොසෙල්ගේ සාක්කුව හොඳට පරීක්ෂා කරල බැලුවොත් කණ්ණාඩිය ඒකේ තියෙන්න පුළුවන්."

මිස් රොබට් එසේ කියද්දී පංතිය පුරා සිහින් හඬක් නැගෙන්නට විය. මැඩමොසෙල්ගේ කණ්ණාඩි කොපුවට සිදු ව ඇති දේ ඔවුන් දන්නා නිසා ඒ සිනා හඬ තව තවත් මුවහත් වෙයි. ඒ අතර ජැනට් කිසිවක් නැසුණාක් මෙන් නිහඬ ව බලා සිටියා ය.

"ළමයි......... මොකද හිනා වෙන්නේ. ඔය විහිලුව මොකක්ද කියලා මට කරුණාකරලා කියනවද?"

මිස් රොබට් කියුවේ නොඉවසිල්ලෙනි. තමා උගන්වමින් සිටින විට සිනා හඬ නැගෙනවාට ඇ කොහෙත් ම කැමති නැත.

"ඇත්තට ම මැඩමොසෙල්ගේ කණ්ණාඩි කුට්ටම නැති වුණ එක ගැන ඔච්චර හිනා වෙන්න දෙයක් තියෙනවද?"

සිදු වූයේ කුමක් ද යි ළමෝ හොඳාකාරවම දනිති. ඔවුන් හිනා වෙන්නේ ඒ නිසා ය. මිස් රොබට් කෝපයෙන් මෙන් පංතිය දෙස බලා සිටිද්දී ඩොරිස් මුලින් ම කතා කළා ය.

"මිස් රොබට්, මැඩමොසෙල්ට හැම වෙලාවෙ ම කණ්ණාඩි දෙක අමතක වෙනවා. අපිට හිනා ගියේ ඒ නිසයි."

"කට වහගන්න..."

ඩොරිස් කියූ දේ ඇසූ සැනින් මිස් රොබට්ගේ කෝපය පුපුරා ගියේ ය.

"දැන් හැමෝ ම හතළිස් හත් වැනි පිටුව පෙරළ ගන්න. කැත්ලින්.... ඔයා තව දුරටත් වටපිට බැලුවොත් මම ඔයාව එළියට දානවා. තේරුණාද? අද උදේ ඉඳන් මොනවද ඔයාලට වෙලා තියෙන්නේ.?"

පංතිය නිහඬ කිරීම සඳහා මිස් රොබට්ගේ ඒ ගෝරනාඩුව හොඳට ම ප්‍රමාණවත් විය. ඉන් පසු ව කිසිවෙකුත් ජැනට්ගේ ඊළඟ විහිලුව ගැන වචනයක් හෝ කථා කළේ නැත. විවේක කාලය එළැඹි සැනින් ම පංතියේ හැම දෙනා ම ජැනට් වටා රොක් වූහ. මැඩමොසෙල්ගේ ඇස් කන්නාඩි කොපුව තුළට කුරුමිණියන් කිහිප දෙනෙකු දැමීමට ජැනට් සූදානම් ව සිටින්නී ය.



# මැඩමොසෙල්ට තවත් කම්පනයක්

විවේක කාලයේදී ගෙවත්තේ ඇවිද ගිහින් ජැනට්ට වැට අසලින් විවිධාකාර වර්ගවල කුරුමිණියන් සහ මකුළුවන් කිහිප දෙනෙකු අල්ලා ගැනීමට හැකි ව තිබිණි. ඉන් පසු ව ඇ එම සතුන් මැඩමොසෙල්ගේ කණ්ණාඩි කොපුව තුළට දමන්නට සූදානම් වූවා ය. පළමු සහ දෙවැනි වසරවල ගැහැණු ළමුන් ඇ වටා පොදි කමින් මේ අපූරු සිදුවීම දෙස බලා සිටිති. ඔවුන් වෙතින් නැගෙන සිනා හැම තැන ම විසිරෙයි.

"කුරුමිණියන්ට හුස්ම ගන්න පුළුවන් වෙයි නේද?"

ළමුන් අතර සිටි කැත්ලීන් බයාදු හඬින් ඇසුවා ය. ඇ සතුන්ට දක්වන්නේ දැඩි අනුකම්පාවකි. මකුළුවන්ට, කුරුමිණියන්ට හා කැරපොත්තන්ට පවා කැත්ලීන්ගේ ආදරය නො අඩු ව ම ලැබේ. ඒ නිසා ඇගේ සිතට ඇති වෙන්නේ දුකකි.

"ඇයි නැත්තේ? මේ කන්නාඩි කොපුව කුරුමිණියන්ට ලොකු කාමරයක් වගේ. ඒ නිසා උන්ට හුස්ම ගන්න කිසි ම අමාරුවක් වෙන එකක් නෑ. ඒක මට සහතිකයි."

ජැනට්, කැත්ලීන් සනසන්නට උත්සාහ කළා ය.



Scanned with CamScanner

"දැන් ඔයා මොකද මේ කන්නාඩි කොපුවට කරන්න හදන්නේ? ඔයා මේක ගිහින් මැඩමොසෙල්ගේ කාමරේ මේසේ උඩ තියනවද? එතකොට එයා හෙට උදේ කන්නාඩි කොපුව ඇරල බලල හොඳට ම බය වෙයි."

එසේ ඇසුවේ හිලරි ය.

"ඔයා නම් හරි ම මෝඩියක් හිලරි. එහෙම දෙයක් කෙරුව ම සිද්ධ වෙන්නේ මොකක්ද කියලා අපි කොහොමද බලා ගන්නේ.?"

"ජැනට්....... මට කියන්න තියෙන්නේ මෙච්චරයි. මේ වැඩෙන් පස්සේ මැඩමොසෙල්ට හොඳට ම කේන්ති යයි. අනුමානයක් නෑ එයා මිස් තියෝබෝල්ඩ්ටත් මේ ගැන කියයි. ඒ නිසා කරන දෙයක් ප්‍රවේශමෙන් හොඳද? වාරේ අන්තිම දවස්වල දඟ වැඩ කරල අහු වුණොත් නරක රිපෝට් එකක් ලැබෙයි."

ලුසීගේ කට හඬ අවවාදයක් මෙනි.

"මම ඒ ගැන හිතන්නේ නෑ. මැඩමොසෙල්ට තරහා යන එකට පාඩමක් උගන්වන්නයි මට ඕනෑ වෙලා තියෙන්නේ."

ලුසීගේ අවවාදය පැත්තකට විසි කර දමන ගමන් ජැනට්ගේ ආඩම්බර කට හඬ ඇසිණි.

මැඩමොසෙල්ගේ කණ්ණාඩි කොපුව තුළට දැමූ කුරුමිණියන් සහ මකුළුවන් පිරිස කිසිදු කලබලයක් නොකර නිහඬ ව සිටිති. එහෙත් කැත්ලීන් නම් බොහෝ කලබල වෙලා ය. ඈ වරින් වර කන්නාඩි කොපුව විවෘත කර කුරුමිණියන්ට සහ මකුළුවන්ට වාතාශ්‍රය ලබා දෙන්නට තරම් කාරුණික වූවා ය.



පසුදින උදෑසන ම සුපුරුදු ප්‍රංශ පාඩම ඉගැන්වීමට මැඩමොසෙල් පංතියට පැමිණීමට නියමිත ව තිබිණි. ඈ පංතියට පැමිණෙන්නට පෙර ජැනට් කණ්ණාඩි කොපුව මේසය මත තැබුවා ය. දැන් මුළු පංතිය ම දෙගිඩියාවෙන් සහ නොඉවසිලිමත් ලෙසින් බලා සිටියි. ඔවුන් සියලු දෙනාගේ ම බලාපොරොත්තුව මැඩමොසෙල්ගේ පැමිණීමයි.

මෙතෙක් වෙලාවක් පංතියට උගන්වමින් සිටි මිස් රොබට් නික්ම යාමත් සමඟ ම මැඩමොසෙල් පංතියට පැමිණියා ය. පෙර දින රාත්‍රියේදී ඈ නිදි වර්ජිත ව සිටින්නට ඇත. මැඩමොසෙල්ගේ මුහුණ විඩාබර ය. එමෙන් ම දෑස වටා කළු පැහැති රවුම් සෑදී තිබේ.

"ආයුබෝවන්......"

ළමයින්ට සුබ පතමින් පංතියට ඇතුළු වූ මැඩමොසෙල් මේසය වෙතට ගොස් අතෙහි වූ පොත් කිහිපය ඒ මත තැබුවා ය. ගැහැණු ළමයි ද මැඩමොසෙල්ට සුබ පතා අසුන් මත වාඩි වුණා. ඉන් පසු ව මැඩමොසෙල් කළු ලෑල්ල දෙසට හැරී ප්‍රශ්න කිහිපයක් සටහන් කළා ය.

තමාගේ කන්නාඩි කොපුව මේසය මත තිබෙන බව මැඩමොසෙල් දුටුවේ ඒ වෙලාවේදී ය. පුදුමයෙන් මෙන් ම සතුටින් ද ඇය එදෙසට හැරුණා ය.

"ආ...... මේ තියෙන්නේ මගේ කණ්ණාඩි දෙක. ඇත්තට ම මොන පුදුමයක් ද? ඊයේ කන්නාඩි දෙක හොයන්න මම කෙනෙක්ව එව්වා. ඒත් තිබුණේ නෑ. හැබැයි දැන් තියෙනවා."

දැන් ගැහැණු ළමුන් සියලු දෙනා ම බලා සිටින්නේ මැඩමොසෙල් කණ්ණාඩි කොපුව විවෘත කරන තෙක් ය.

තවත් මොහොතකින් සිදුවීමට යන අපූරු සිදුවීම දෙස හොඳින් බලන්නට දෝ ඔවුහු පාඩම ද අතපසු කොට කොකුන් මෙන් ගෙළ දිග්කොට බලා සිටිති.

මැඩමොසෙල් පුටුව මත වාඩි වූවා ය. එහෙත් ඇය එක් වර ම කන්නාඩි කොපුව විවෘත කළේ නැත. ඒ වෙනුවට ඇය පංතිය පුරා ම විමසිලිමත් බැල්මක් හෙලුවා ය.

"ළමයි..... මොකද වෙලා තියෙන්නේ? අද පාඩම දැන් ම පටන් ගන්න අදහසක් නැද්ද?"

මැඩමොසෙල්ගේ බෙරිහන් දීමෙන් සසල වූ ළමෝ වහ වහා තමන්ගේ පෑන් අතට ගත්හ. ඒ අතර මැඩමොසෙල් අතේ ඇති පැන්සලෙන් දත්වලට තට්ටු කරමින් කල්පනා කරන්නට වූවා ය. ඇය තවමත් කණ්ණාඩි කොපුව විවෘත නොකළේ ඇයි?

ආ..... දැන් නම් කණ්ණාඩි කොපුව විවෘත කිරීම සඳහා මැඩමොසෙල් සූදානම් වන්නී ය. හෙමි හෙමින් අත දිගු කොට කන්නාඩි කොපුව අතට ගත් මැඩමොසෙල් එය සීරුවට විවෘත කළා ය. ඒ සමග ම මෙතෙක් වේලා සිරගත ව සිටි කුරුමිණියන් සහ මකුළුවන් පිරිස ඉක්මන් ගමනින් පිටතට පැමිණියහ.

තමාගේ කණ්ණාඩි කොපුව තුළින් පිටතට පැමිණෙන සතුන් රංචුව දෙස මැඩමොසෙල් බලා සිටියේ පුදුමයෙනි. ඉක්මනින් ම අත් ලේන්සුව අතට ගෙන දෑස් පිස දමා ගත් ඇය නැවත වතාවක් කණ්ණාඩි කොපුව දෙස බැලුවා ය. තමාගේ දෑස අදහා ගත නොහැකි ය යි මැඩමොසෙල්ට සිතේ.



"මේක නම් වෙන්න බැරි දෙයක්...."

මැඩමොසෙල් තනි ව ම සිතන්නට වූවා ය.

"කුරුමිණියෝ රංචුවක් මෙසේ දිගේ දුවනවා වගේ මට යාන්තමට පෙනෙනවා. ඒ වගේ ම මගේ කණ්ණාඩි දෙකත් මෙසේ උඩ තියෙනවා කියලත් මට දැනෙනවා. ඇත්තට ම මේ කුරුමිණියෝ එළියට එන්නේ මගේ කණ්ණාඩි කොපුව ඇතුළේ ඉඳල ම ද කියලා මට හරියට ම පෙනෙන්නේ නැහැනේ."

ඒ අතර ගැහැණු ළමයි ඔවුන්ගේ මුවගින් වැහෙන සිනාව වළක්වා ගන්නට උත්සාහ කළහ. මැඩමොසෙල්ගේ මුහුණේ තිබෙන්නේ මොන තරම් විහිලු පෙනුමක්ද? සිදු වූ දේ විශ්වාස කළ නොහැකි බව පෙන්වන හැඟීමක් ඇගේ මුහුණෙහි තැවරී තිබේ.

මැඩමොසෙල් මේ සෑම කාරණාවක් ගැන ම නිහඬව කල්පනා කරන්නට උත්සාහ කළා ය. මෙවැනි සිදුවීම්වලට ඈ කැමැති නැත. එහෙත් දැන් ඇගේ කණ්ණාඩි කොපුව දිගේ කුරුමිණියන් එහාට මෙහාට ඇවිදිති. එය සිදු විය නොහැකි දෙයකි. කුරුමිණියන් ඇස් කණ්ණාඩි කොපු තුළ ජීවත් වන සත්ව විශේෂයක් නොවේ. එසේ නම් මෙවැනි දෙයක් සිදු වන්නේ කෙසේද? මැඩමොසෙල් නැවත වතාවක් දෑස පිසදමා ගත්තා ය. මේ සිදුවීම් අතරේදී පළමු වසරේ ගැහැණු ළමයින් තමන්ගේ පොත් අතරින් දෑස් මුදවාගෙන මැඩමොසෙල් දෙස විපරම් කරන්නට වූහ.

"මැඩමොසෙල් මොකක්ද වෙලා තියෙන්නේ?" පංතියේ අතිකුත් ළමයින් දෙස හොරැහින් බලන ගමන් ඩොරිස් බයාදු හඬකින් ඇසුවා ය.

"ආ......... ඩොරිස්......... ජැනට් ටිකකට මෙහාට එන්නකෝ..... ඇත්තට ම මගේ මේසේ උඩ තියෙන්නේ මොකක්ද?"

මැඩමොසෙල් කැළඹිලි සහගත හඬකින් කීවා ය. මේ වන විට කණ්ණාඩි කොපුවෙන් පිටතට පැමිණි කැරපොත්තන්, කුරුමිණියන් සහ මකුළුවන් මැඩමොසෙල්ගේ මේසය වටා ගමන් කරන්නට පටන්ගෙන තිබේ.

ජැනට් සහ ඩොරිස් දෙදෙනා ම එක් වර ම හිස ඔසවා බැලුවෝ ය. මැඩමොසෙල් දිහා කැළඹිලි සහිත ව බලා සිටි ජැනට් කථා කරන්නට පටන් ගත්තේ සැහෙන වෙලාවකට පසුවයි.

"මැඩමොසෙල්........ ඔයාගේ කණ්ණාඩි දෙක මේසේ උඩ තියෙනවා. ඒ දෙක දමා ගත්ත ම ඔයාට හොඳට පෙනෙයි."

"මගේ කණ්ණාඩි දෙක මෙතැන නෑ. ඒ වුණාට මෙතැන කුරුමිණියෝ ඉන්නවා කියලා ඔයාලට පේන්නේ නැද්ද ළමයිනේ?"

මැඩමොසෙල් කැළඹිලි සහගත හඬකින් ඇසුවා ය.

"මොන කුරුමිණියොද?"

ඩොරිස් එසේ අසද්දී පංතිය පුරා පැතිර තිබූ සිනා හඬ නැවත අළුත් විය. මේ වෙනස ගැන මැඩමොසෙල්ට එතරම් විශේෂත්වයක් නැතුවා මෙනි.

"ආ..... මට නම් මොකක්දෝ දෙයක් සිද්ධ වෙනවා වගෙයි."

මැඩමොසෙල් උගුර යටින් කථා කරන්නී ය.



"පහුගිය සති කිහිපයේ ම මට සිද්ධ වුණේ හිතා ගන්න බැරි තරම් පුදුම දේවල්. මට ගොඩාක් තරහ ගියා. දැන් මගේ ඇස් දෙකත් හරියට පේන්නේ නෑ වගේ. මගේ මේසේ උඩ කුරුමිණියෝ ඇවිදිනවා වගේ පෙනෙනවා."

එසේ කියූ මැඩමොසෙල් පංති කාමරයෙන් පිටතට ගියා ය. මුළු පංතිය ම ඈ දෙස බලා සිටියේ පුදුමයෙනි. ජැනට් ගේ විහිළුව සාර්ථක වූයේ නැත. ඒ වෙනුවට මැඩමොසෙල් සිදු වූ හැම දෙයක් ගැන ම ඉතා බැරෑරුම් ව කල්පනා කරන්නට පටන්ගෙන තිබේ. ගැහැණු ළමුන් සියලු දෙනා ම පුදුමයෙන් මෙන් එකිනෙකා දෙස බලා සිටිද්දී ජැනට් මකුළුවන් සහ කුරුමිණියන් සියල්ල ම එකතු කොට ජනේලයෙන් පිටතට විසි කර දැමුවා ය.

"ජැනට්...... මම නම් මේ වැඩේට එච්චර කැමති නෑ."

තවත් ටික වෙලාවකට පසු ව ලූසීගේ පැහැදිලි කට හඬ පංතිය පුරා පැතිර ගියේ ය.

"අපි මැඩමොසෙල්ට ඇත්තට ම කරදරයක් කෙරුවා. එයාගේ වයසත් එක්ක අපි කරපු විහිළුව සැර වැඩියි කියලා හිතෙනවා. ඇත්තට ම අපි මේ වැඩේ දැන් ම ම නතර කෙරුවොත් හොඳයි."

පංතියේ සියලු දෙනා ම ලූසීගේ අදහසට එකඟ වූහ. කිසි ම කෙනෙක් සිනා වුණේ නෑ. ජැනට්ගේ හිතටත් දුකක් දැනුණා. ඉන් පසු ව පංතියේ ළමුන් සියලු දෙනා ම පොත්, පෑන් අතට ගෙන නිහඬ ව ම තම තමන්ගේ වැඩ කටයුතුවල නිරත වන්නට පටන් ගත්හ.

විනාඩි දහයක පමණ වේලාවක් ගෙවී ගියේ ය. මිස්

තියෝබෝල්ඩ් කාටත් හොරා පංතියට පැමිණියා ය. විදුහල්පතිනියගේ පැමිණීමෙන් කලබල වූ ගැහැණු ළමයි තමන්ගේ අසුන්වලින් නැගිට ගත්හ. ළමුන් නිහඬ ව අධ්‍යාපන කටයුතුවල නිරත වෙන ආකාරය දුටු විදුහල්පතිනියගේ මුහුණට සිනාවක් නැග ආවේ ය.

"ළමයි......"

ටික වෙලාවකට පසු ව විදුහල්පතිනියගේ පහත්, ප්‍රියමනාප, කට හඬ නැගී ආවේ ය.

"මැඩමොසෙල්ට ටිකක් සනීප නැති වෙලා කියලා කණගාටුවෙන් වුණත් කියන්න වෙලා තියෙනවා. අපි දැන් එයාව ඩොක්ටර් කෙනෙක් ළඟට එක්ක යනවා. ඒ නිසා ඔයාලා කලබල කරන්නේ නැති ව පංතියේ වැඩ කරගෙන යන්න. හොඳද?"

එසේ කියූ විදුහල්පතිනිය පංතියෙන් පිට ව ගියා ය. ළමෝ නිහඬ ව ම තම තමන්ගේ අාසනවල වාඩි වූහ. දැන් ඔවුන්ගේ සිත්වලට වෙන කවරදාකවත් නොදැනෙන අන්දමේ වේදනාවක් දැනේ. ජැනට්ගේ මුහුණ රතු පැහැයට හැරී ඇත. මැඩමොසෙල්ගේ හිතේ ඇති කලබලකාරී ගතිය ජැනට්ට රහසක් නොවේ. ඒ නිසා ඇයට විහිළු කිරීම පිළිබඳ ව ජැනට් ගේ සිතේ තිබෙන්නේ දරාගත නොහැකි වේදනාවකි. මැඩමොසෙල් අසනීප වූයේ තමා කළ විහිළුව නිසාද යි ජැනට් ගේ හිතට දෙගිඩියාවක් දැනේ.

එදින උදය පුරා ම පළමු වාරයේ ළමුන් සියලු දෙනාගේ ම හිත්වල තිබුණේ වේදනා හරිත සිතුවිලි ය. මිස් රොබට් පංතියට ඉගැන්වීමට පැමිණිය ද ඔවුන්ගේ සිත් වෙලා ගත්



වේදනාව පහ ව ගිය බවක් පෙනෙන්නට නොතිබිණි.

එදින උදෑසන පංති හමාර වීමෙන් පසු ව ළමුන් සියලු දෙනා ම විවේක කාමරයට ගොනු වූහ. ඉන් පසු ව කොරතෝංචියක් නොමැති ව ඇසෙන කථාබහෙන් මුළු විවේක කාමරය ම ගිගුම් දෙන්නට විය.

"ඔයා දන්නවද මැඩමොසෙල්ට සනීප නැති වෙලා?" මැඩමොසෙල්ට සනීප නැති වුණේ ඇයි? කවුද එයාට විහිළු කෙරුවේ? දෙයියනේ මාර්ගරි ඔයාද?" ඇත්තට මොකද වුණේ? මැඩමොසෙල්ට සිහි නැති වුණා ද එහෙම නැතිනම් මොනවද සිද්ධ වුණේ?"

එහෙත් කිසිවෙකුත් මේ ගැන ජැනට්ගෙන් අසන්නට උත්සාහ කළේ නැත. ජැනට් මේ සිදුවීම ගැන දැඩි ලෙස දුක් වෙන බව ද ඔවුන්ට රහසක් නොවේ. ජැනට් කළ විහිලුවෙන් මැඩමොසෙල්ගේ ඇස් රතු වූ බව ළමුන්ට රහසක් නොවේ. ඔවුන් සියලු දෙනාට ම අවශ්‍ය ව තිබෙන්නේ සිදු වූ වරද නිවැරදි කර ගැනීමයි.

මේ වන විට මැඩමොසෙල් ඇඳක් මත වැතිර සිටියා ය. තමාගේ ඇස් පෙනීම ඉතා ම දුර්වල තත්වයට පත් ව ඇතැයි සිතන නිසාදෝ ඇගේ හැසිරීම ඉතා ම කණගාටුදායක ය. තමා බැලීම සඳහා පැමිණි මේට්‍රන්වරියට ද මැඩමොසෙල්, කුරුමිණියන් පිළිබඳ කථා පුවත පවසා තිබිණි. මේ සිදුවීම නැවතත් සිදු වේයැ යි බයක් ද අසරණ මැඩමොසෙල්ගේ සිතේ තිබෙන බව මේට්‍රන්ට වැටහෙයි.

එදින සවස තේ පානයෙන් පසු ව ජැනට්, මේට්‍රන්වරිය හමුවීම සඳහා ගියා ය. මැඩමොසෙල්ගේ අසනීපය කෙබඳුද යි

දැනගැනීම ජැනට්ගේ අරමුණ විය. මේට්‍රන්වරිය ජැනට්ට මෙසේ කීවා ය.

"ගොඩාක් මහන්සියයි නිදි මැර්මයි හින්දා මැඩමොසෙල් මේ විදිහට අසනීප වෙලා තියෙන්නේ. පහුගිය නත්තල් නිවාඩු කාලෙදි මැඩමොසෙල්ගේ නංගි අසනීප වුණාලු. එයා බලාගන්න ගිහිං තියෙන්නෙත් මැඩමොසෙල්මයි. ඉතින් එයාට නිදාගන්නවත් වෙලාවක් තිබිලා නෑ. පහුගිය දවස්වල මැඩමොසෙල්ට ගොඩාක් තරහ ගියා කියලා මම දන්නවා. ඒකට ඉතින් අපට සමාව දෙන්න කාරණාවක් දැන් තියෙනවා."

"මේට්‍රන්........ කණ්ණාඩි කොප්පුව ගැන මොනව හරි දෙයක් මැඩමොසෙල් ඔයාට කිව්වද?"

ජැනට් ඇසුවේ බයාදු හඬකිනි. එය ඇසූ මේට්‍රන්වරිය ජැනට් දෙස පුදුමයෙන් බැලුවා ය.

"මැඩමොසෙල්ගේ කණ්ණාඩි කොප්පුව ගැන ඔයා මොනවද දන්නේ? ඒකත් මැඩමොසෙල්ගේ අසනීපයට සම්බන්ධ දෙයක්ද? කණ්ණාඩි කොප්පුව ඇතුළෙන් කුරුමිණියන් එනව වගේ පෙනෙනව කියල මැඩමොසෙල් මට කිව්වා. ඒ නිසා මැඩමොසෙල් නිදාගන්න බයයි. නිදාගත්ත ම මකුළුවෝ, කැරපොත්තෝ, කුරුමිණියෝ එයාව වට කර ගන්න හැටි හීනෙන් පෙනෙනවලු. ඇත්තට ම මේ දේවල් හින්දා මැඩමොසෙල් ඉන්නේ හරි ම කලකිරීමෙන්."

මේට්‍රන්වරියගෙන් අසා දැනගත් තොරතුරු රැගෙන ජැනට් හති හතික පිට ව ගියා ය. මේ වාරය පුරා මැඩමොසෙල්ට වැඩිපුර තරහ යෑමට හේතුවක් තිබේ. අසනීප වූ තම සොයුරියට දිවා රෑ සාත්තු කර තිබෙන්නේ මැඩමොසෙල් ය. නිවාඩු



දවස්වල පවා ඇය ඉතා ම මහන්සි වන්නට ඇත. මදක් තරහා ගිය ද මැඩමොසෙල් යනු මොන තරම් කරුණාවන්ත හදවතක් ඇති කෙනෙක්ද? ජැනට් දිගින් දිගට ම කල්පනා කරන්නට වූවා ය.

"මැඩමොසෙල්ට විහිළු කරපු එක ගැන මට හරි ම කනගාටුයි."

ජැනට්, පැට්ට කීවේ කණගාටුවෙන්.

"මැඩමොසෙල්ගේ කාමරේට ගිහිං සිද්ධ වුණ හැම දේම කිව්වොත් එයාගේ හිතේ තියෙන බය නැති වෙයි. මොනව වුණත් මේ ගැන මිස් රොබට්ටවත්, මිස් තියෝබෝල්ඩ්ටවත් කියන්න නම් මට බෑ."

"ඒක හොඳ අදහස. ඔයා ගිහිං මැඩමොසෙල්ට ඇත්ත ම කියන්න. මමයි, ඉසබෙලුයි මල් පොකුරු දෙකක් දෙන්නම්. ඒවත් අරන් යන්න. හොඳද ජැනට්.?"

පැට්, ජැනට්ගේ අතකින් අල්ලා ගන්නා ගමන් කීවා ය.

මැඩමොසෙල්ට මල් පොකුරු රැගෙන යාම සඳහා පංතියේ හැම ළමයා ම මුදල් දුන්හ. ඊළඟ දවසේ එනම්, සෙනසුරාදා නගරයට ගිය ළමෝ ඩැෆඩිල්, නාසිසි ඇනිමෝනිස්, සහ ප්‍රිම්රෝස් මල් පොකුරු රාශියක් ම මිළදී ගත්හ. තමන් අතින් මැඩමොසෙල්ට සිදු වූ වැරැද්දට වන්දි ගෙවීම සඳහා මල් පොකුරක් හෝ යැවිය යුතු යැයි ඔවුන් සිතන්නට ඇත.

මල් පොකුරු තොගයක් ම අතින් ගෙන පැමිණෙන ළමුන් පිරිස දුටු මිස් රොබට්ගේ දෑස් පුදුමයෙන් මහත් වූයේ ය.

"මොකද මේ? මල් ප්‍රදර්ශනයක්වත් ද?"

"මේ මල් පොකුරු ඔක්කොම මැඩමොසෙල්ට."

හිලරි කීවා ය. මිස් රොබට්ගේ හිතට ඇති වූයේ පුදුමයකි. පසුගිය වාරය පුරා ම මැඩමොසෙල්ගේ අකාරුණික මානසික තත්ත්වය නිසා පංතියේ ගැහැණු ළමයින් අපහසුතාවයට පත් වූ බව මිස් රොබට් හට රහසක් නොවේ. එවැනි තත්ත්වයන් යටතේ වුව ද මැඩමොසෙල්ට මල් පොකුරු රැගෙන පැමිණීම ඇත්තට ම පුදුම හිතෙන දෙයක් නොවේ ද?

"පළමු වාරයේ ඉන්නේ ගොඩක් කාරුණික හිත් තියෙන ළමයි."

එසේ සිතූ මිස් රොබට් ඉන් පසු ව ගැහැණු ළමයින්ට මෙසේ කීවා ය.

"ඔයාලා හරි ම හොඳ ළමයි. මේ මල් පොකුරු දැක්ක ම මැඩමොසෙල් ගොඩාක් සන්තෝස වෙයි. ඒ වුනාට මැඩමොසෙල් ඉන්නේ හරි ම අපහසුවෙන් නිසා ඔයාලට එයාව හම්බ වෙන්න විදිහක් නෑ. කොහොම වුණත් ඔය මල් පොකුරු ටික මේට්‍රන්ට දෙන්නකෝ. එයා මැඩමොසෙල්ට ගිහින් දෙයි."

එහෙත් ජැනට්ගේ සැලසුම එය නොවේ. කෙසේ හෝ කාමරයට ගොස් මැඩමොසෙල් හමු වී ඇත්ත තත්වය පැවසීමට ඇ අදිටන් කොට තිබිණි.



# පාසල් වාරයේ අවසන් සතිය

එදින සවස තේ පානයෙන් පසු ව පැට් සහ ඉසබෙල්, මේට්‍රන්වරිය පිළිබඳ ව විමසිලිමත් දැසින් යුතු ව බලා සිටියහ. මේට්‍රන්වරියට හොරා මැඩමොසෙල් හමුවීමට යාමට ජැනට් හට අවස්ථාවක් ලබා දීම ඔවුන් දෙදෙනාගේ අරමුණයි. ජැනට් තමාගේ මල් පොකුර මේට්‍රන්වරියට නුදුන්නා ය. මැඩමොසෙල් හමුවීමට ගොස් ඇත්ත ප්‍රකාශ කොට මල් පොකුර ඇය අතට දිය යුතු යැයි ජැනට් තීරණය කොට තිබිණි.

අසරණ ජැනට්ගේ මුහුණ සුදුමැලි ය. මැඩමොසෙල් අසනීප වූයේ තමා නිසා ය යන සිතිවිල්ල ඇගේ සිතෙහි තෙරපෙයි. ඒ නිසා මැඩමොසෙල් හමුවීමට යාමේ කිසියම් දෙගිඩියාවක් ද ඇගේ සිතේ නැත්තේ නොවේ. එසේ වුව ද මැඩමොසෙල් හමුවීමට ගොස් සිදු වූ දේ පැවසිය යුතු ය.

හිස් තේ බන්දේසියකුත් අතින් ගත් මේට්‍රන්වරිය, මැඩමොසෙල්ගේ කාමරයෙන් පිටතට එන ආකාරය පැට් හා ඉසබෙල් දුටහ. ඔවුන් දෙදෙනා වහ වහා දුවගෙන ගොස් මේට්‍රන්වරිය කථාවට අල්ලා ගත්හ.

"මේට්‍රන්...... කරුණාකරල කියන්න. අපි තුවා පි[illegible]

කරන්නද?"

"ඔයාලා මොනවද කරන්න හදන්නේ? කමක් නෑ. තනියම ඇවිල්ලා ඒ දේ කරන්න. මට අද එච්චර තිවාඩුවක් නෑ."

තේ බන්දේසිය ද රැගෙන ඉවත යන ගමන් මේට්‍රන්වරිය කීවා ය.

ඒ සමඟ ම පසුපස හැරී බැලූ පැට් ජැනට්ට කිසිවක් ඉඟි කළා ය. තවත් විනාඩි කිහිපයකට මේට්‍රන්වරිය ආපසු නො එන බව ඒ ඉඟියයි. මේට්‍රන්වරිය කථාවට අල්ලා ගත් තිවුන් සොයුරියෝ ජැනට් හට, මැඩමොසෙල්ගේ කාමරයට ඇතුළු වීම සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා දී තිබිණි.

ලද අවසරයෙන් ප්‍රයෝජන ගත් ජැනට් වහ වහා මැඩමොසෙල්ගේ කාමරය අසලට ගොස් දොරට තට්ටු-කළා ය.

"එන්න...."

මැඩමොසෙල්ගේ කට හඬත් සමඟ ම ජැනට් කාමරයට ඇතුළු වූවා ය. මැඩමොසෙල් ඇඳ මත වැතිර කාමරයේ සිවිලිම දෙස බලා හිඳියි. ඇගේ පෙනුම දුක්බර ය. අහම්බෙන් මෙන් තමාගේ ඇස් පෙනීම දුර්වල බව දැනගත් නිසාදෝ මැඩමොසෙල්ගේ හිතට මහා වේදනාවක් දැනෙයි. කැරපොත්තන්, කුරුමිණියන් සිවිලිම පුරා ගමන් කරන්නාක මෙන් මැඩමොසෙල්ට පෙනේ. පව්...... තිදි මැරීමත්, අධික මහන්සියත් නිසා මේ දේවල් සිදු වූ බව ඇයට තේරුම් ගත නොහැකි ව තිබේ.

ජැනට් කාමරයට ඇතුළු වෙද්දී මැඩමොසෙල් පුදුමයෙන් යුතු ව බැලුවා ය. අද දින කිසි ම අමුත්තෙකුට පැමිණීමට



අවසර නැති බව මේට්‍රන්වරිය කීවා මතක ය. එසේ නම් ජැනට් කාමරයට ඇතුළු වූයේ කෙසේද?

"මැඩමොසෙල් දැන් ඔයාට සනීපද? මම ඔයාව බලන්නයි ආවේ. ඇත්තට ම මට කියන්න වැදගත් කාරණාවකුත් තියෙනවා."

ජැනට්, මැඩමොසෙල්ගේ ඇඳ අසලට යන ගමන් කීවා ය.

"ඔයාව දකින්න ලැබුණ එක ගැන මටත් හරි ම සතුටුයි ජැනට්. ඉතින් මොකක්ද ඔයාට කියන්න තියෙන වැදගත් දේ?"

මැඩමොසෙල් කරුණාභරිත හඬකින් කීවා ය.

"මැඩමොසෙල්..... අනේ මැඩමොසෙල් මේ දේ කොහොම කියන්නද කියලා මට හිතා ගන්න බෑ."

ජැනට්ගේ කට හඬ ගොත ගැසේ.

"මේ කතාව ඇහුව ම ඔයාට ගොඩාක් තරහ යයි. මාව විශ්වාස කරන්න. සිද්ධ වුණ දේ ගැන මට සමාවෙන්න. ඔයාට සනීප නැහැ කියලා නොදනයි අපි මේ හැම දෙයක් ම කෙරුවේ. අනේ අපිට සමාවෙන්න මැඩමොසෙල්."

"දරුවෝ...... ඔයා මොකක්ද මේ කියන්න හදන්නේ? ඔයා කරපු ඔච්චර ම නරක දේ මොකක්ද?"

මැඩමොසෙල්ගේ කට හඬ පුරා තිබෙන්නේ කිසියම් විශ්මයකි.

"මැඩමොසෙල්. අපි.... අ..... නෑ...... මම තමයි ඔයාගේ

කණ්ණාඩි කොපුව ඇතුළට කුරුමිණියෝ දැම්මේ. ඒ විතරක් නෙවෙයි මගේ පොත ඇතුළට මැජික් තීන්ත කඩදාසියක් දමලා ඔයාට පෙන්නුවෙත් මමමයි."

ජැනට්ගේ කට හඬ අඳෝනාවක් මෙනි. මැඩමොසෙල් ජැනට් දෙස පුදුමයෙන් බලා සිටියා ය. ඇයට ජැනට් කියූ දේ විශ්වාස නැතුවාක් මෙනි.

"ඒ කියන්නේ...... මගේ කණ්ණාඩි කොපුවේ හිටියේ ඇත්ත ම ඇත්ත සත්තු ද?"

මැඩමොසෙල් කථා කළේ සෑහෙන වෙලාවකට පසුවයි.

"ඔව්..... මැඩමොසෙල්. උන් ඇත්ත ම ඇත්ත සත්තු තමයි. පහළ ගෙවත්තෙන් තමයි මං උන්ව අල්ල ගත්තේ. ඒ සත්තු දැකපු ගමන් ඔයා හිතුවේ ඇස්වල දෝෂයක් කියලා. ඇත්තට ම දැන් ඔයා ගොඩාක් අසනීප වෙලා."

ජැනට්ගේ කට හඬ සමාව අයදින්නාක් මෙනි. ඒ අතර මැඩමොසෙල් නිහඬ ව ම ඇඳ මත වැතිර සිටියා ය. දැන් ඇගේ දෑස මෙන් ම මනැසෙහි ද කිසි ම වරදක් නොමැත. තමා දුටු කුරුමිණියන් සිතේ ඇති වූ මායාවක් නොවේ. උන් ඇත්ත ම ඇත්ත සතුන් ය. එය ජැනට්ගේ විහිළුවකි. තමා කළ වැරැද්ද පිළිගෙන ඒ බව පැවසීම ජැනට්ගේ හොඳ ගතිගුණයක් නොවේද?

එසේ සිතූ මැඩමොසෙල් ජැනට් හට කථා කරන්නට ආපසු හැරුණා ය. එහෙත් ජැනට් එතැන සිටියේ නැත. තවත් ටික වෙලාවකට පසු ව ජැනට් කාමරයට ඇතුළු වූයේ මල් පොකුරු රැසක් දෝත පුරවා ගෙනයි. මේ අපූරු දසුන දුටු මැඩමොසෙල්ගේ මුහුණ ද මල් යායක් මෙන් සිනාවෙන් ඔපවත්



වූයේ ය.

"මැඩමොසෙල්. පළමු වාරයේ ළමයි හැම දෙනා ම ඔයාට මල් පොකුරු එව්වා. ඔයා අසනීප වුණ එක ගැන අපිට දුකයි. අනේ අපිට සමාව දෙනවා නේද? අපි කරපු හැම දේකින් ම ඔයාගේ හිත රිදුණා. අපිට සමාවෙන්න."

"මෙහාට එන්න ජැනට්..."

එසේ කියූ මැඩමොසෙල් තමාගේ විශාල පුරත ජැනට් දෙසට දිගු කළා ය. ජැනට් ඒ විශාල දෑත තුරයේ අල්ලා ගත්තා ය.

"මේ වාරයේදී මම ගොඩක් කලබල කෙනෙක් වුණා. අර ඔසුලිවාන් සහෝදරියෝ කියනවා වගේ මම කලබල මැඩමොසෙල්. ඇත්ත..... එක එක හේතු නිසා මම හරියට කලබල වුණා."

"ඇත්ත මැඩමොසෙල්. ඔයා ගොඩක් වෙලාවට අපිත් එක්ක කේන්ති ගත්තා. හැබැයි අපි ඒ ගැන දුක් වෙන්නේ නෑ. අපි දැන් ඇත්ත මොකද්ද කියලා දන්නවා."

ජැනට් අවංක හඬකින් එසේ කියද්දී මැඩමොසෙල්ගේ මුහුණේ විශාල හිනාවක් මතු ව ආවේ ය.

"ආ.... ඉංග්‍රීසි කෙල්ලෝ මොන තරම් කරුණාවන්ත ද කියලා මට තේරෙන්නේ දැනුයි."

"ඉතින් ඔයාගේ යාලුවෝ මම හැම දෙනා ම ආදරෙන් මතක් කෙරුවා කියලා කියන්න. අනික ඒ අය එවපු මල් පොකුරු වලටත් ස්තුති කළා කියන්න. මම ඔයාලා එක්ක කිසි ම තරහක් නෑ. සිද්ධ වුණ හැම දෙයක් ම අමතක

කරමුකෝ... නපුරු කෙල්ල.... ඔයා මේ හැම දෙයක් ම මට කියපු එක ඇත්තට ම කොච්චර හොඳ දෙයක් ද?"

මැඩමොසෙල් සතුටු හඬකින් එසේ කියද්දී ජැනට් ඈ දෙස බලා සිටියේ පුදුමයෙනි. ජැනට්ගේ විශාල කළු දෙනෙත තුළ තිබෙන විශ්මය වියැකී ගොස් සිනාවක් මතු වෙන්නට පටන් ගත්තේ ය. මෙය මොන තරම් පුදුම සිදුවීමක් ද?

"ඔයා මගේ කණ්ණාඩි කොප්පුව ඇතුළට කුරුමිණියෝ දැම්මා. උත් ඇත්ත ම එවුන් කියලා මම නිකමටවත් හිතුවේ නෑ. අනික මැජික් තීත්ත පැල්ලම. ඔයා නම් හරි ම අපූරු කෙල්ලෙක් ජැනට්. ඇත්තට ම මට හයියෙන් හිනා වෙන්න හිතෙනවා."

ඒ සමග ම මැඩමොසෙල් මහා හඬින් සිනා සෙන්නට වූවා ය. කාමරයේ දොර අසලින් ගමන් කරමින් සිටි මේට්‍රන්වරිය ඒ සිනා හඬ ඇසුවේ දරාගත නොහැකි පුදුමයෙනි. තවත් මිනිත්තුවක් පමණ දොර අසල බලා සිටි මේට්‍රන්වරිය එක් වර ම කාමරයට ඇතුළු වූවා ය. පුදුමයකි. මල් පොකුරු වලින් වැසුණු කාමරය තුළ මැඩමොසෙල් මහා හඬින් සිනාසෙමින් සිටියි. ඈ අසල ජැනට් ද සිටින්නී ය.

"ජැනට්...... ඔයා මොනවද මෙතැන කරන්නේ? නරක කෙල්ල. මම ඔයාට මේක ඇතුළට එන්න අවසර දුන්නේ නෑ..... කරුණාකරලා දැන් ම ම එළියට යන්න."

ජැනට් දුටු මේට්‍රන්වරිය කෝපයෙන් බෙරිහන් දුන්නා ය. ඇයට පිළිතුරු දුන්නේ මැඩමොසෙල් ය.

"නෑ...... මේට්‍රන් ජැනට් එළියට යන්න ඕනෑ නෑ. මේ මල් පොකුරු ටික පෝච්චිවලට දමන්න. එයා මෙතැන



හිටපුවාවේ. ඇත්තට ම ජැනට් මට සුභ ආරංචියක් අරගෙන ආවා. ඒක අහපු ගමන් මට ගොඩක් සනීපයි වගේ...... මම හයියෙන් හිනා වුණේ ඒ නිසයි."

සැබැවින් ම මේ වන විට මැඩමොසෙල්ගේ අසනීපය බොහෝ දුරට සනීප වූ බවක් පෙනෙන්නට තිබිණි. මේට්‍රන් වරියට ද ඒ වෙනස පැහැදිලි ව ම දැකගත හැකි ය. ඒ නිසා ම ඈ ජැනට්ට කාමරය තුළ සිටින්නට අවසර දුන්නා ය. ජැනට් මල් පොකුරු සියල්ල ම පිළිවෙලකට සකස් කරන ආකාරය දෙස මැඩමොසෙල් ආශාවෙන් බලා සිටියා ය.

"ෂා..... මොන තරම් ලස්සන මල් පොකුරු ටිකක්ද? මේට්‍රන් ඔයා දැක්කද? ගොඩාක් තරහ යන, කිසි ම සහයෝගයක් නැති, නරක ම නරක මැඩමොසෙල්ට මේ කෙල්ලෝ එවපු මල්වල ලස්සන ඔයා දැක්කද?"

"ඔව් මම දැක්කා.... හ්ම්...... ජැනට් ඔයා දැන් ම ම යන්න. ආයේමත් මගේ අවසරය නැති ව මෙහාට ආවොත් මම ඔයාට දඬුවම් කරනවා."

මේට්‍රන්වරිය නැවතත් ගෝරනාඩු කරද්දී ජැනට් බියෙන් මෙන් මැඩමොසෙල්ගේ කාමරයෙන් එළියට පැන්නා ය. ඈ කෙළින් ම ගියේ විවේක කාමරය වෙතටයි. සිදු වූ දේ දැන ගැනීම සඳහා යෙහෙළියෝ නොඉවසිලිමත් ව බලා සිටිති. ජැනට් ගේ විහිලුව ගැන ඇසූ මැඩමොසෙල් හයියෙන් සිනාසුණු ආකාරය ගැන ඇසූ ගැහැණු ළමෝ ද හයියෙන් සිනා සුණහ.

"මේ වාරේ අන්තිම සතිය ගොඩක් හොඳට ගෙව්ලා යයි කියලා මට හිතෙනවා."

පසුගිය සතිය පුරා ම මැඩමොසෙල්ගේ අකාරුණික

මුඛයෙන් සිත රිදවා ගත් ඩොරිස් සතුටින් කීවා ය.

"මේ වාරේ අන්තිම දවස් ටිකේ අපිට උගන්වන්න එන්න පුළුවන් වුණොත් මැඩමොසෙල් ගොඩාක් හොඳ වෙයි කියලා මට හිතෙනවා. එතකොට එයා අපේ හරි ම හොඳ ප්‍රංශ ගුරුතුමී කියලා කියන්න පුළුවන්."

"මේ වාරේ ගොඩක් ඉක්මනට ගෙවිලා යනවා. පාස්කු නිවාඩුවට තියෙන්නේ තව කොච්චර ටික කාලයක්ද? හැබැයි ගිය වාරෙට වඩා ගොඩක් අපූරු දේවල් මේ වාරෙදි සිද්ධ වුණා."

පැට් එසේ කියද්දී ඉසබෙලුත් කථාවට එකතු වූවා ය.

"ඔව් ගොඩක් දේවල් සිද්ධ වුණා. ගිය වාරේ අපිට ගින්නක් තිබුණෙත් නෑ. ඒ ගින්න නිසා වීරවරියක් බිහිවුණෙත් නැහැනේ."

මාර්ගරි එතැනට පැමිනුණේ ඒ වෙලාවේදී ය. ඈ දැන් කිහිලි කරු ආධාරයෙන් ඉතා ම හොඳට ඇවිදියි. ඇගේ කැඩුණු කකුළ ද බොහෝ දුරට සුව වෙලා ය. ලූසි ඇගේ සෙවණැල්ල මෙනි.

"ඔයාලා වීරවරිය කියලා කියනකොට මාර්ගරීගේ මුහුණ රතු වෙනවා."

ලූසී සිනාවෙමින් කීවා ය.

"පැට් ඔයා දන්නවද? නිවාඩු කාලේ සතියක් අපේ ගෙදර නතර වෙන්න මාර්ගරි අපේ ගෙදර එනවා. අපි ගොඩාක් දුප්පත් හින්දා දැන් සේවිකාවෝ කවුරුවත් නෑ. මාර්ගරි පුළුවන් විදිහට අපිට උදව් වෙන්න කැමතියි. ශිෂ්‍යත්ව විභාගෙට සූදානම්



වෙන හින්දා මේ දවස්වල මම ගොඩක් මහන්සි වෙනවා. ඒ වුණාට මාර්ගරිත් එක්ක විනෝදෙන් ඉන්නත් මම කොහොම හරි වෙලාව හොයා ගන්නවා."

"මේ නිවාඩුවට තාත්තත් එක්ක ඇවිදින්න යන්නත් මම හිතාගෙන ඉන්නවා. පැට්, ඉසබෙල් නිවාඩු කාලේ ඔයාලා මොනවද කරන්නේ.?"

මාර්ගරි සතුටින් ඇසුවා ය.

පාසල් නිවාඩු කාලය දැන් හැම දෙනාගේ ම මුවහ රැව් දෙන මාතෘකාවක් බවට පත් ව තිබිණි. ළඟ ළඟ ම එන පාස්කු නිවාඩු කාලය ගත කිරීම සඳහා සැම දෙනාම විවිධාකාර සැලසුම් සකස් කරති. සමහරු සාප්පු සවාරියේ ගොස් අළුත් ඇඳුම් පැළඳුම් මිලදී ගැනීමට සූදානම් වෙති. ඇලිසන් ඒ අතරිනුත් ප්‍රමුඛ ය.

"වැදගැම්මකට නැති පුංචි කෙල්ල." ඇලිසන්ගේ අලංකාර කෙස් කළඹ පිරිමදින ගමන් පැට් කීවා ය.

"නිවාඩු දවස් කිහිපයක් අපිත් එක්ක ගත කරන්න එන්න ඇලිසන්. එතකොට ඔයාගේ අළුත් විසිතුරු ආම්පන්න ටිකත් අපිට පෙන්වන්න අරගෙන එන්න පුළුවන්."

"ඒක හොඳ අදහස. හැබැයි අමතක කරන්න එපා. මම දැන් ඉස්සර හිටපු ඇලිසන් නෙවෙයි. ඊට වඩා ගොඩක් දියුණු වුණ ඇලිසන් හොඳද?"

ඇලිසන් කීවේ සිනාසෙමිනි. ඇත්තෙන් ම ශාන්ත ක්ලෙයාර් බාලිකා පාසලේ ඈ ගත කළ ටික කාලයේ දී පවා ඇලිසන් වෙතින් ඉතා විශාල පරිවර්තනයක් සිදු ව තිබේ. දැන් ඈය මුලින් සිටි ඇලිසන් නොවේ.

පාසල් වාරයේ අවසන් සතිය එළඹෙත් ම මුළු පාසල පුරා ම අමුතු ම ප්‍රීතියක් පැතිරෙමින් තිබුණා. දැන් මැඩමොසෙල්ගේ අසනීප තත්වයත් ගොඩාක් හොඳ අතට හැරිලා. ළමයින් නිතර නිතර මැඩමොසෙල්ගේ කාමරයට ගොස් ඈ සමඟ පුංචි පුංචි ක්‍රීඩාවල යෙදීමටත් අමතක කළේ නැත. ඉක්මනින් කෝප වෙන මැඩමොසෙල් දැන් ගොඩක් දුරට වෙනස් වෙලා. ඊළඟ වාරයේදී ගැහැණු ළමුන් සමඟ ගොඩක් සමීප ව කටයුතු කරන්නේ කොහොමද කියන කාරණාව ගැන මැඩමොසෙල් දැන් ඉඳන් ම සැලසුම් සකස් කරනවා.

දැන් ලූසිගේ දවස් ඉතා ම කාර්ය බහුලයි. ඊළඟ වාරයේදී පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගය සඳහා ඇය ඉතා ම මහන්සියෙන් පාඩම් කරනවා. ඒ අතර ම සුභ ආරංචියක් ලූසිට ලැබී තිබුනා. එයාගේ තාත්තා ගොඩාක් හොඳට ඒ වගේම සතුටු දායක විදිහට තමන්ගේ කටයුතු කරගන්න පුරුදු වෙනවා කියන එක තමයි ඒ සතුටුදායක ආරංචිය. නිවාඩු කාලයේදී කළ යුතු දේ ගැන මිස් තියෝබෝල්ඩ්ගෙන් විශේෂ සැලැස්මකුත් ලූසිට ලැබී තිබුණා. මේ හේතු නිසා ම ලූසිගේ දවස් හැම එකක් ම ගෙවිලා ගියේ හරි ම සතුටින්. එයාගේ සතුටු සිනා හඬ පාසල පුරා ම විසිරුණා.

මේ අතර නිවුන් සොයුරියන්ගේ හිත්වලට දැනුණ සතුට නිමක් නැති තරම්. මේ වාරේ පුරා ම සිදු වුණ දේවල් මොන තරම් අපූරුද? විෂයයන් පහකින් ම පළමුවැනියෝ වෙන්නට පැට්ටයි, ඉසබෙල්ටයි හැකි වුණා. අමතර ඉගැනීම් ගොඩාක් තිබුණ නිසා ලූසි මෙවර පංති විභාගයට පෙනී සිටියේ නැ. යම් හෙයකින් ඇය විභාගයට ඉදිරිපත් වුණා නම් ගණිතය ඇතුළු හැම විෂයකින් ම පළමුවැනියා වෙන්නට ලූසිට කිසි ම අපහසුවක් නැත. ඩොරීස් සහ ඇලිසන් ගොඩක් විෂයයන්



වලින් අඩු ලකුණු ලබා ගත්හ. එසේ වුවත් ඔවුන් වෙතින් ද කිසියම් ප්‍රගතියක් දක ගැනීමට හැකි වීම මොන තරම් සතුටක් ද?

"කවුරු හරි කෙනෙක් පංතියේ අන්තිමයෝ වෙන්නත් එපාය. හැම දේකින් ම ටිකක් පස්සට වෙන එක ඇත්තට ම හොඳයි කියලා වෙලාවකට අපිට හිතෙනවා."

ලැජ්ජාවෙන් රතු කරගත් මුහුණින් යුතු ව ඇලිසන් සහ ඩොරීස් එසේ කියූහ.

"ඒ ඔයාලට හිතෙන හැටි. අදක්ෂ ළමයි ගැන කවුරුවත් සැලකිලිමත් වෙන්නේ නැ. හැබැයි ටිකක් උනන්දුවෙන් ඉගෙන ගත්තොත් ඔයාලා ගැන අපිට ආඩම්බරයෙන් හිනාවෙන්න පුළුවන්. තේරුණාද මෝඩ කෙල්ලනේ.?"

පැට්ගේ කට හඬ අමනාපයෙන් පිරී තිබෙන්නාක් මෙනි. විශේෂයෙන් ම ඇලිසන් ඉගෙනීමට දුර්වල වීම පැට් හට ඉවසුම් නොදෙන්නකි.

වාරයේ අවසන් දිනය පැමිණියේ ය. ඇඳුම් පැළඳුම් ඇහිරීම හා එකිනෙකාට සුබ පැතුම් හුවමාරු කර ගැනීම මොන තරම් අපූරුද? මැඩමොසෙල් ද සම්පූර්ණයෙන් ම සනීප වී ළමුන් අතරට පැමිණ සිටියා ය. ඈ ගැහැණු ළමයින්ට විහිළු කරමින් ද ඔවුන්ගේ ලිපින ලියා ගනිමින් ද පාසල පුරා ම ගියා ය. සිනා හඬින් මුළු පාසල ම ගිගුම් දෙද්දී වරින් වර මිස් රොබට්ගේ කට හඬ පැමිණ ඒ සිනා හඬ මකා දැම්මේ ය.

"කැත්ලීන්...... මොකද ඔච්චර හයියෙන් හිනා වෙන්නේ? ශීලා.... ඇඳුම් බෑග් එක ලෑස්ති කරන අතර බිම පෙරළෙන එක නම් එච්චර හොඳ වැඩක් නෙවෙයි. පැට්..... පැට්..... ජැනට් ට තට්ටු කරන එක නතර කරන්න. මොකක්..... බියර්

ගාඩින් එකක්? ළමයි දඟ කරන්න එපා. ඔයාලා මම කියන දේ ඇහුවේ නැත්නම් කෝච්චියේ යන ගමන් ජේළි සීයක රචනාවක් ලියන්න දෙනවා තේරුණාද?"

මිස් රොබට් කොච්චර කිව්වත් ගැහැණු ළමුන්ගේ සිනා හඬ සහ කිචි බිචිය අඩු වුණේ නෑ. මාස ගණනාවකට පසු ව නැවතත් නිවෙස් වලට යන්නට ලැබීමේ ප්‍රීතිය ඔවුන්ගේ සිත්වලින් පිටාර ගලනවා. පාස්කු නිවාඩුවට කරන්නට මොන තරම් දේවල් තිබෙනවාද? පාස්කු බිත්තර පාට කිරීමට, ප්‍රිම්රෝස් මල් පිපුණු කැලෑ අතරින් ඇවිද යාමට, ගෙදර ඉන්න බල්ලන්, පූසන් හා අශ්වයින් සමඟ සතුටු වීමට අම්මලා, තාත්තලා සහ පුංචි සහෝදර සහෝදරියන් සමඟ දවස් ගත කිරීමට ලැබෙන නිවාඩුව මොන තරම් වටිනා දෙයක් ද?

"එහෙනම් අපි ඊළඟ වාරෙදි හමුවෙමු. ජැනට් අමතක නොකර ලියුමක් එවන්න හොඳද? ඩොරිස් නිවාඩු කාලේ හොඳට ගත කරන්න. අනේ ඉසබෙල්, ඔය විදිහට මාව අදින්න එපා. මමත් එනවා. ඉක්මන් කළොත් ඉස්සර වෙලා ම යන බස් එකෙන් ම අපට යන්න පුළුවන්. එහෙනම් හැමෝටම ආයුබෝවන්, ගුඩ්බායි. අපි ඊළඟ වාරේ හමුවෙමු."

පැට් ප්‍රීතියෙන් කියමින් ම තමන්ගේ නිවුන් සොයුරියත් ඇදගෙන බස් රථය දිහාවට දුවන්න පටන් ගත්තා.

එසේ නම් අපිත් අලුත් සොයුරියන් සමඟ අලුත් ඉස්කෝලේ පටන් ගන්න ඊළඟ වාරයේදි හමුවෙමු.

– නිමි. –



# අපූරු සොයුරියන්ගේ අපූරු රහස්

## සුදත් රොහාන්

එක් දවසක් මිස් රොබට් පළමු වාරයේ ළමුන් ක්ෂේත්‍ර චාරිකාවකට එක්ක ගියා. ගස් වැල් අතරින් ඇවිද යමින් විල්, පොකුණුවල සිරි නරඹමින් යන ඒ ගමන මොන තරම් ලස්සන ද? ටිකක් වෙලා යනකොට ළමුන් හරි ම ලස්සන විලක් ළඟට ඇවිදගෙන ආවා. මොන පුදුමයක් ද? මෙන්න ඒ විලේ පුංචි ගෙඹි පැටව් පිහිනනවා. පැටි දෙපාරක් හිතුවේ නෑ. එයා විලට බැහැලා ගෙඹි පැටියෙක් අල්ලා ගන්න ලෑස්ති වෙනවත් සමඟ ම මිස් රොබට් හයියෙන් කෑ ගැහුවා. තවත් දවසක පාසලේ හදිසි ගින්නක් ඇති වුණා. [illegible] ගින්න බුර බුරා නැගෙන බව මුලින් ම දැක්කේ මාර්ගරි. වැඩි වෙලාවක් යන්න ඉස්සර වෙලා මුළු ඉස්කෝලෙ ම කඩි ගුලක් වගේ කැලඹිලා වුණා.

140/-

තරංගා ප්‍රකාශන
52/3, [illegible]

Scanned with CamScanner